# 2026.06.09 දින පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ පවත්වන ලද මහා සභාරැස්වීමේ රැස්වීම් වාර්තාව

## රැස්වීම සඳහා සහභාගිවූ ගරු මන්ත්‍රීවරුන්

1. ගරු ප්‍රාදේශීය සභා සභාපති යහලවෙල ගෙදර සංජීව කරුණාසාගර මහතා
2. ගරු ප්‍රාදේශීය සභා උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මැණිකාමාර දූරයලාගේ මනෝ කුමාර එදිරිසිංහ මහතා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අලහකෝන් පතිරන්නැලාගේ තරංග වම්පික අලහකෝන් මහතා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි දෙලංකාගේ නිමාලි දිල්හානි මෙනෙවිය
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කඩුකාර මුදියන්සේලාගේ නන්දසිරි මහතා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දසනායක ගුණරත්න බස්නායක මුදියන්සේලාගේ චාමින්ද දසනායක මහතා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහමායාගොඩගේ විරාජ් මලින්ද ඩයස් මහතා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හේරත් මුදියන්සේලාගේ ප්‍රදීප් සුජීව හේරත් මහතා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඉදිරිප්පුලිගේ සඳුනා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි මුතුගල නිශාන්ති ගුණතිලක මහත්මිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පනම්බර මුදියන්සේලාගේ කුමාරසේන ජයලත් මහතා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අගාරේ ගෙදර දූරයාලගේ රංජිත් ප්‍රේමලාල් මහතා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි නිමල්කා කොටඹගේ මහත්මිය
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හේරත් මුදියන්සේලාගේ නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්පටිදේවගේ ලාලිත ඉඳුනිල් මහතා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කුරුප්පු මුදියන්සේලාගේ අජිත් තිලකසිරි මහතා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හේරත් මුදියන්සේලාගේ සමරසිංහ කීර්ති බංඩාර හේරත් මහතා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජේන්ද්‍ර ගල්අද්දලාගේ අජිත් ලක්ෂ්මන් මහතා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අකුරන් ජේඩි දූරයලාගේ ඉෂාන් මධුශංක පීරිස් මහතා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසේ හේවගේ මාලක අරුණ කුමාර මහතා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එදිරිසිංහ ආරච්චිලාගේ ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රහ්මචාරිගේ සුදත් උදය කුමාර මහතා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි සේනානායක මුදියන්සේලාගේ සජිනා සුරංගි මහත්මිය
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයසිංහ මුදියන්සේලාගේ දිලිප් ජයසිංහ මහතා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රත්නායක මුදියන්සේලාගේ උපුල් නිශාන්ත මහතා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විස්කම් නන්දන වඩු ආචාරිගේ රංජිත් නවරත්න මහතා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මාපා අශෝක හේරත් මහතා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රාධිපතියලාගේ රංජිත් අබේපාල මහතා
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්හොටි හලුවන්නැහැලාගේ රංජිත් උපාලි මහතා
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහම්මදු තාහීර් මොහමඩ් තස්ලිම් මහතා
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රාජගුරු දිසානායක මුදියන්සේලාගේ ජයන්ත දිසානායක මහතා
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බන්නැහැක මුදියන්සේලාගේ ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි වීරරත්න තෙන්නකෝන් මුදියන්සේලාගේ චාන්දනී දීපිකා රත්නායක මහත්මිය
35. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි රාජකරුණානායක මුදියන්සේලාගේ නිලන්ති විජේසිංහ මහත්මිය
36. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහමඩ් කබීර් රිෆාක් හුසේයින් මහතා
37. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දොලවත්තගේ දොන් සිරන්ත පද්මලාල් මහතා
38. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මල්ලව ආරච්චිලාගේ මංජුල ප්‍රසන්න මල්ලව ආරච්චි මහතා

## ආගම සිහි කිරීම.

ප්‍රථමයෙන් ජාතික ගීය වාදනය කිරීමෙන් , ආගම සිහිකිරීමෙන් අනතුරුව මිය ගිය රණවිරුවන් සිහිකර ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 10.00 ට පමණ ගරු සභාවේ කටයුතු න්‍යාය පත්‍රානුකූල ආරම්භ කරන ලදී. 2026 ජුනි මස මහා සභා රැස්වීමට සහභාගි වන ගරු උප සභාපති තුමා , ප්‍රාදේශීය සභා මන්ත්‍රී මණ්ඩලය ,ලේකම්තුමිය ඇතුළු කාර්යමණ්ඩල නිලධාරීන් , මාධ්‍යවේදීන් ඇතුළු සහභාගි වී සිටින සියළුදෙනාට ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරන ලද අතර සියළුදෙනාම ගෞරවයෙන් පිළිගන්නා ලදී.

## 06 (අ). 1.පසුගිය මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම .

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

2026.05.12 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව සම්මත කරගන්නා ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**

සියළු දෙනාටම සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරනවා. අවසරයි ගරු සභාපතිතුමා ගරු මන්ත්‍රි තුමන්ලා තුමියන්ලා ගෙන් වගේම ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ සියළු දෙනාගෙන් අවසරයි.පසුගිය සභා වාර්තාව සංශෝධන සහිතව ඇත්නම් ඒවාද ඇතුලත්ව සම්මත කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ඒ.රංජිත් නවරත්න මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි. ගරු මන්ත්‍රී ඉෂාන් මධුශංක පීරිස් මහතා විසින් සිදු කරනු ලැබූ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රිනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - ( ස.ජ.බ)**

මූලාසනය හොබවන ගරු සභාපතිතුමනි.උප සභාපතිතුමා ප්‍රමුඛ ගරු මන්ත්‍රී මණ්ඩලයෙන්ද, ලේකම්තුමිය ප්‍රමුඛ කාර්ය මන්ඩලයෙන් අවසරයි. ගරු සභාපතිතුමා මං මේ වාර්තාව කියෙව්වා.මේක මේ මුද්‍රණ දෝෂයක් වෙන්න ඕන.මන්ත්‍රිවරුන්ගේ පැමිණිම එදා දවසෙ පැමිණි මන්ත්‍රිවරු 29, නොපැමිනි මන්ත්‍රිවරු 7යි දෙගොල්ලම 36යි.එදා දවසේ චාමින්ද මන්ත්‍රිතුමාටයි, තස්ලිම් මන්ත්‍රිතුමාටයි මොකද දන්නෙ නැ වුනේ මේක අඩුපාඩුවක්.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

මුද්‍රණ දෝෂයක් තියෙන්නෙ. ඒක සංශෝධණය වෙනවා මන්ත්‍රීතුමිය

**ඒ අනුව පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

## (ආ).සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

අපි මන්ත්‍රිතුමන්ලාට,තුමියන්ලාට දැනුම් දුන්නා වත්කම් බැරකම් ප්‍රකාශ ජූනි මාසෙ 30 වෙනිදට පෙර පුරවන්න ඕනි.ඒ ගූගල් ෆෝම් එකක් තියෙන්නෙ.හැම අවුරුද්දෙම පුරවන්න ඕනි.ඒ ගූගල් ෆෝම් එක ගෲප් එකටත් දාලා තියනවා.මේක මේ පුද්ගලික කාරණාවක්.පුද්ගලිකව තමන් කරන්න ඕන එකක්.සභාවෙන් කරන්න ඕන එකක් නෙමේ.ඒ නිසා දාලා තියනවා ගෲප් එකට පුරවන්න.අපි අර උදව්වක් විදිහට සභාවෙන් මේක කරන්න හැදුවා.ඊට පස්සෙ මේක රාජකාරියක් විදිහට පත්වෙලා දෝෂාරෝපණයක් ඇවිල්ලා තිබුනා.ඒ වැඩේ කරන්න ගත්තට පස්සෙ උදව්වක් තමයි කරන්න හැදුවෙ.ඒ නිසා ලින්ක් එක දාලා තියනවා.ගෲප් එකට.මන්ත්‍රිවරුන් විසින් තමන්ගෙ වත්කම් බැරකම් ප්‍රකාශය පුරවලා යවන්න ඕන.ඒක කරන්න.ඔබතුමාලගෙ පුද්ගලික වත්කම් බැරකම් ප්‍රකාශ ඔන් ලයින් තියෙන්නෙ.ලින්ක් එක ඔන්ලයින් දාලා තියනවා.

මීළඟට පෙරහැර සඳහා විශේෂයෙන්ම ඒ අඹගහවැව තරුණ සමිතිය ඒ වගේම ඒ අවට ජනතාව සහ දේශපාලන අධිකාරිය, හැම දේශපාලන පක්ෂයකම සහභාගීත්වය සිද්ධ වුනා. පෙරහැර සාර්ථකවත් පවත්වාගෙන යාමට හැකියාව ලැබුනා.ඒ නිසා පඩුවස්නුවර නිමිති පෙරහැර සාර්ථක කරගන්න උදව් කරපු මහන්සි වෙච්ච අඹගහවැව තරුණ කැළට ඒ වගේම පඩුවස්නුවර රජමහා විහාරයේ ස්වාමින් වහන්සේ ඇතුළු ස්වාමින් වහන්සේලාට.සහ උදව් උපකාර කළ සියළුදෙනාම ගෞරවයෙන් සිහිපත් කරනවා.

ඊළඟට සහා ගර්හයේ පිටු පස්සෙ වීදුරුව බිදිලා තියනවා.ඉංජිනේරුවරුන්ට දැනුම් දුන්නා.ඒක පිපිරිලා තිබුනා.ඒ නිසා ඒක ඉවත් කරලා තියනවා ඒ සම්බන්ධයෙන් අපි ඉංජිනේරුවරුන්ගෙන් තොරතුරු බලලා මොකක්ද සිද්ධ වුනේ කියලා බලනවා.අපි තීන්දුවක් ගත්තා සහා කාර්යාලයේ හැම තැනම සීසීටීවී කැමරා සවි කරන්න.එතකොට අපිට පුළුවන් මොකද වෙන්නෙ කියලා බලන්න.

ඊළඟ කාරනාව තමයි මේ අපි ප්‍රාදේශීය සභාවට අයත් ජංගම වෙළදකුටි පෙර පරිදි සභාපතිවරුන්ගේ හිතුමනාපෙට තම තමන්ගෙ අයට බෙදුවා වගේ බෙදන්නෙ නෑ.කමිටුවකට දාලා තමයි කමිටුවෙන් තීරණය කරන්නෙ කාටද දෙන්නෙ කියලා.එහෙම තියෙද්දි හම්මාලියෙ තියෙන වෙළඳ කුටිය ඉවත් කරගෙන ගිහින් වෙනත් කෙනෙකුට දීලා තියෙනවා බාහිර පාර්ශ්වයක් විසින්.ඒකට අපේ නිශාන්ති මන්ත්‍රීතුමිය ඍජුව සම්බන්ධ වෙලා තියනවා.අපි ඒකට විරුද්ධව දැන් රාජ්‍ය දේපලක් සභාවේ දේපලක් අහිමි කිරීම වෙනුවෙන් හා ඒ සඳහා අවභාවිතා කිරීම වෙනුවෙන් එතුමියට විරුද්ධව නීතිමය කටයුතු කරන්න අවශ්‍ය කටයුතු කරලා තියනවා.එනිසා දැනුම් දීම් යටතේ සභාවේ කිසිදු දේපලක් සභාපතිවරයා විදිහට මමවත් මන්ත්‍රීවරයා විදිහට කිසිම කෙනෙකුටවත් නිලධාරියකුටවත් තීරණයකින් පිට කටයුතු කරන්න බෑ.ඒක අපේ හිටපු සභාපතිතුමාත් දන්නවා. එනිසා වෙනදා සභාපතිවරු එහෙම කරන්න ඇති.නමුත් දැන් අපි කමිටුවලට දාලා තමයි. කමිටුවල බහුතරයේ යෝජනාව මත තමා කාටද දෙන්නෙ කියලා තීරණය කරන්නෙ.විශේෂයෙන් එතනදි තීන්දු කරේ දැනටත් යම් ව්‍යාපාරයක යෙදිලා ඉන්න එහෙත් යම් වෙළඳ කුටියක් නැති අය හොයලා බලලා දෙමු කියලා.ඒකත් නිලධාරීන්ට භාරදීලා තියෙන්නෙ.හොයලා බලන්න මේ ගොල්ලො වෙළදාම් කටයුත්තක යෙදෙනවද මේ ගොල්ලන්ට වෙළඳ කුටි නැද්ද කියලා.ඒ වෙළඳ කුටිය අදාල වෙන සභා බල ප්‍රදේශයේ හැර තම තමන්ගෙ කොට්ඨාශවලට නෙමේ.ඒ නිසා තියන ප්‍රමාණෙ බෙදා හදාගන්න වෙන්නෙ.ඒ නිසා මේක දැනුම් දීමක් විදිහට කරනවා.

<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>

ගරු සභාපතිතුමා දැනුම් දීම් යටතේ දැනුම් දීමක් කරන්න කියලා ඉල්ලීමක් කරනවා.මං හිතනවා ඔබතුමා දැනුවත් වෙලා ඇති ටැකෑව මලගනේ මාර්ගය.ඒ මාර්ගය ඍජු වියදමකින් කරා නම් ලක්ෂ ගානක් වැයවෙනවා. හැබැයි ඒක හදන්න විජේසිංහ ආයතනයේ ටැකෑව දේවාලේ ගාව කම්හලට යන මාර්ගය ඒකට ඒබීසී දැම්මා.දැන් තලලා අවසානයි.සභාවෙන් ඉල්ලීමක් කරලා තියනවා වැඩ අධිකාරිගෙන් කරුණාකරලා අපට ජලය දෙන්න කියලා.බොක්කු දෙකක් ඉල්ලුවා දුන්නෙ නෑ.ඒ නිසා මං ඔබතුමාගෙන් දැන ගන්න කැමතියි.මේ වගේ පරිත්‍යාග කරන වැඩ.ඒක වියදම් කෙරුවා නම් ලක්ෂ 60 ක් විතර යනවා.කිසිම සහයෝගයක් දුන්නෙ නෑ කියලා එතුමා හැම තැනම ප්‍රකාශ කරනවා.

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

මේ සම්බන්ධයෙන් මං සභාවට ඉදිරිපත් කරන්නම්.ටැකෑවෙ ඔය පාර ලංකාශාන්ත මහත්තයා කතා කරා.එතුමාගේ ආයතනයේ විශාල ටැංකි යන්න තියන ආයතනයක්.එනිසා පාර හදලා දෙන්න කියලා.හැබැයි අර සභා මාර්ගයක ඔබතුමත් දන්නවා යන්න පුළුවන් බර ප්‍රමාණයක් තියනවා. ඒ බර ප්‍රමාණයට අනුව අපි ඒ පාර හදනවනම් අපි ඇස්තමේන්තුවකුත් සැකසුවා.වියදම යනවා අපි එතුමට කිව්වා ඔබතුමා 60% ක් දාන්න අපි 40% ක් දාන්නම් බලමු ඒ මට්ටමට ඒක හදන්න කියලා.එතුමගෙ වාහන යන බර ප්‍රමාණෙට නෙමේ ප්‍රාදේශීය සභාවේ බර ප්‍රමාණෙ වාහන යන්න ඇස්තමේන්තු කලාට පස්සෙ කෝටි 3 කට ආසන්න ඇස්තමේන්තුවක් අපි 40% දැම්මොත් එතෙන්ටම රුපියල් කෝටියකට වැඩියෙ යනවා මුදල්.ඊට පස්සෙ එතුමට පැහැදිලි කරාට පස්සෙ එතුමා පිලිගත්තා සභාවෙ අරමුදල් එක පාරකට මෙහෙම දැම්මොත් එහෙම අනිත් පාරවල් වලට ප්‍රශ්නයක් එනවා.ඒ නිසා ඒබීසී දාලා මං මේ පාර හදාගන්නම් මට කානු කැට ටික පුළුවන්නම් දෙන්න කියලා.අපි පහුගිය දවස්වල කානු කැට බෙදලා බෙදලා දැන් අවසන් වෙලා .මේ දවස්වල කාණු කැට ඉල්ලලා තියෙන්නෙ.නමුත් ඕඩර් කරාට පස්සෙ තමයි ඒවා හදන්න පටන්ගන්නෙ. දැන් ඒවා හදමින් තියෙන්නෙ. අපි කානු කැට ලැබුනම ඒ පාරට කානු කැට ටික දෙනවා සහ පලාත් නිශ්චිත ප්‍රතිපාදන යටතේ ම මුදල් දාන්නම් කිව්වා එතුමට මේක හදන්න.ඒ වෙලාවෙත් එතුමා මට කිව්වා අපරාදෙ දාන්න එපා.මම මේක හදනවා කියලා. මම දන්නෙ නෑ තැන් තැන් වල මොනවද කියන්නෙ කියලා මට කියපු එක මං කියන්නෙ.ලංකා සාන්ත මහත්තයා කිව්වා ඔන්න ඔය කාරනාව.

## (ඇ).ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සන්නිවේදන.

## I. 2026.04.27 වන දින ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

2026.04.27 වන දින පැවති ප්‍රසම්පාන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රී ජේ.එම්.දිලිප් ජයසිංහ මහතා, ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා , ගරු මන්ත්‍රී ඩී.ඩී.එස් පද්මලාල් දොලවත්ත මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ

මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රී එම්.ටී.එම්. තස්ලිම් මහතා, ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා, වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු මන්ත්‍රීනී ඊ.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය - (ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමනි, 2026.04.27 දින පැවති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රීවරුන් හට නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා

<u>ගරු මන්ත්‍රීනී අයි.සඳ්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)</u>

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. මං ඒ යෝජනාව ස්ථිර කරනවා.ඒ අතර මං පොඩි අදහසක් ඉදිරිපත් කරනවා. මේ කමිටු පවත්වා ගැනීම ඉන්න ගණ පූර්ණය බලපුවාම 4.27 කමිටුවෙ පැමිනිලා තියෙන්නෙ 7 යි. නොපැමිණිලා තියෙන්නෙ 10 යි. හැම කමිටු රැස්වීමකටම පැමිනිලා තියෙන්නෙ සීමිත පිරිසක්. මං හිතන්නෙ පක්ෂෙ සාමාජිකයොවත් ඒ සඳහා සහබාගි වෙලා නෑ.ඒක ඒක්කො යම් කිසි අප්‍රසාදයක්.

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

නෑ මන්ත්‍රීතුමිය සණ පූර්ණය ඕකෙ තියනවා.

<u>ගරු මන්ත්‍රීනී අයි.සඳ්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)</u>

සණ පූර්ණය තියනවා මං කියන්නෙ ඉලක්කමක් විදිහට ගත්තහම සහභාගි නොවී තියන පිරිස වැඩියි.

**ඒ අනුව 2026.04.27 වන දින පැවති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රී ජේ.එම්.දිලිප් ජයසිංහ මහතා, ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා_, ගරු මන්ත්‍රී ඩී.ඩී.එස් පද්මලාල් දොලවත්ත මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රී එම්.ටී.එම්. තස්ලිම් මහතා, ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා, වෙත නිවාඩු අනුමත කරන ලෙසට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**II.2026.05.08 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

2026.05.08 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රී ආර්.එම්.උපුල් නිශාන්ත මහතා . ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා, ගරු මන්ත්‍රීනී බී.එම් ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය,ගරු මන්ත්‍රීනී ඩී.නිමාලි දිල්හානි මෙනවිය, ගරු මන්ත්‍රීනී ආර්.එම්.නිලන්ති විජේසිංහ මහත්මිය, ගරු මන්ත්‍රී ඩී.ඩී.එස් පද්මලාල් මහතා, ගරු මන්ත්‍රී සී.පී.රංජිත් අබේපාල මහතා, ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ඒ.රංජිත් නවරත්න මහතා - (ජා.ජ.බ)</u>

2026.05.08 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් හට නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා

<u>ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)</u>

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව 2026.05.08 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රී ආර්.එම්.උපුල් නිශාන්ත මහතා . ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා, ගරු මන්ත්‍රීනී බී.එම් ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය,ගරු මන්ත්‍රීනී ඩී.නිමාලි දිල්හානි මෙනවිය, ගරු මන්ත්‍රීනී ආර්.එම්.නිලන්ති විජේසිංහ මහත්මිය, ගරු මන්ත්‍රී ඩී.ඩී.එස් පද්මලාල් මහතා, ගරු මන්ත්‍රී සී.පී.රංජිත් අබේපාල මහතා, ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා වෙත නිවාඩු අනුමත කරන ලෙසට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

## (ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා විසින් සභාගත කරන වාචික ප්‍රශ්න**

**ප්‍රශ්නය**

1.ආදාහනාගාරයේ මෘතදේහයන් දහනය කිරීමට වර්තමානයේ අයකරන ගාස්තුව කොපමණද?

**පිලිතුර**

ආදාහන කටයුතු සඳහා අය කරන ගාස්තු - ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල - රු.13,000.00

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත - රු.14,000.00

**ප්‍රශ්නය**

2.දැනට බර්නර් දෙකම ක්‍රියාත්මකද?

**පිලිතුර**

ඔව්

**ප්‍රශ්නය**

3.දල වශයෙන් මසකට මෘතදේහයන් කීයක් ආදාහනය කරන්නේද?

**පිලිතුර**

ඉල්ලීම් සිදු කරන පරිදි ආදාහන කටයුතු සිදු කරන අතර,නිශ්චිත වශයෙන් ප්‍රමාණයක් කීමට හැකියාවක් නොමැති නමුත්, දළ වශයෙන් මසකට ආදාහනයන් 20 ට වැඩි ප්‍රමාණයක් සිදු කිරීම සඳහා ඉල්ලීම් ලැබෙන බවට පහත 2026 ජනවාරි සිට මැයි දක්වා ආදාහනය කල මෘත දේහ ප්‍රමාණය හා වැය වූ ගෑස් ප්‍රමාණය සඳහන් වගුව අනුව උපකල්පනය කල හැක.මෙය නිශ්චිත අගයක් නොවේ.

| මාසය | ආදාහනය කල මෘත දේහ සංඛ්‍යාව | වැය වූ ගෑස් ප්‍රමාණය |
|---|---|---|
| ජනවාරි | 26 | 503.65 |
| පෙබරවාරි | 24 | 515.9 |
| මාර්තු | 34 | 624.85 |
| අප්‍රේල් | 22 | 444.3 |
| මැයි | 35 | 628.25 |

**ප්‍රශ්නය**

4.භාවිතයට ගන්නා ගෑස් සිලින්ඩරයක ගෑස් කිලෝ කීයක් අඩංගුද?

**පිලිතුර**

කි.ග්‍රෑ.37.5

**ප්‍රශ්නය**

5.එක මෘතදේහයක් දහනය කිරීමට වැයවන ගෑස් ප්‍රමාණය දළ වශයෙන් කොපමණ වේද?

**පිලිතුර**

දළ වශයෙන් ප්‍රමාණයක් කිව නොහැකි අතර,එක් පුද්ගලයාගෙන් පුද්ගලයාට දේහය දහනය වීමට වැය වන ගෑස් ප්‍රමාණය වෙනස් වේ.සාමාන්‍ය වශයෙන් නීරෝගී දේහයක් දහනය වීමට ගෑස් කි.ග්‍රෑ.18 – 20 ත් අතර ප්‍රමාණයක් වැය වේ.ඇතැම් විට ගෑස් කි.ග්‍රෑ.14 ක් වැනි ප්‍රමාණයකින් දහනය වන මෘත දේහයන්ද තිබේ.

උදා :- නීරෝගී පුද්ගලයෙක් සඳහා අඩු ගෑස් ප්‍රමාණයක් වැය වන අතර,සීනි,කොලෙස්ට්‍රෝල් ඇති රෝගී පුද්ගලයින් සඳහා වැඩි ගෑස් ප්‍රමාණයක් වැය වේ.

**ප්‍රශ්නය**

6.වැයවන ගෑස් ප්‍රමාණය පිලිබඳ ආදාහනාගාරයේ භාරකරු දැනුවත්ද?

**පිලිතුර**

ඔව්

**ප්‍රශ්නය**

7.ගෑස්තුලනය කිරීම පිලිබඳ විෂය නිලධාරිතුමාවත් ඒ පිලිබඳව අවබෝධයක් නොමැති බව 2026 අභ්‍යන්තර විගණන වාර්තාවෙන් පැහැදිලි කර ඇති බව පිළිගන්නේද? ඒ සඳහා ගන්නා පියවර?

**පිලිතුර**

නැත.විෂය නිලධාරිනිය හට ගෑස් තුලනය විධිමත් පරිදි සිදු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම අවම බැවින් තාක්ෂණික නිලධාරියෙකු ලවා එය සිදු කිරීම සුදුසු බවට සිදු කල ඉල්ලීමට අනුව මේවන විට අදාල රාජකාරිය තාක්ෂණික නිලධාරියෙකු වෙත ලිඛිතව පවරා ඇත

ඊළඟට කියන්න ඕන මේ අභ්‍යන්තර විගණනය කියන්නේ ආයතනය ඇතුළෙ විගණන කටයුතු සඳහා පහසුව සඳහා අඩුපාඩු නොවෙන්න අපේ කාර්යාල කටයුතු සඳහා පහසුව සඳහා අඩුපාඩු නොවෙන්න ඒ අඩුපාඩු සම්බන්ධයෙන් කථා කරන්න හදාගත්ත තැන.ඒ අඩුපාඩු කතා කරලා තමයි මෙන්න මේ අඩුපාඩු හදාගන්න ඕන.විගණන කමිටුවට පත්කරලා ඉන්නෙ අපිට ඉන්න සංවර්ධන නිලධාරී කීප දෙනෙක්.ඒ සංවර්ධන නිලධාරීන්ට පූර්ණ අවබෝධයක් නෑ සමහර කාරණා සම්බන්ධයෙන්.අන්න එතනදි ඒකත් සාකච්ඡා කරලා එතනදි හදා ගන්නවා.අභ්‍යන්තර විගණන ඒකකය කියන්නෙ දඩුවම් දෙන්න හදපු ආයතනයක්වත් වැරදි හොයන්න හදපු ආයතනයක්වත්නෙමේ.අභ්‍යන්තර විගණන ඒකකය හදාගෙන තියෙන්නෙ අපේ ආයතනයේ අඩුපාඩුවෙන එක වලක්වා ගැනිම සඳහා

**ප්‍රශ්නය**

8.2026 අභ්‍යයන්තර විගණන වාර්තාව අනුව එක් දේහයක් ආදාහනය කිරීමට වැයවන ගෑස් ප්‍රමාණය කි.ග්‍රෑම් 20.72 බව ප්‍රකාශකර ඇත.එය නිවැරදිද?

එක් මෘත දේහයක් දහනය කිරීම සඳහා කි.ග්‍රෑ.20.72 වැය වන බව නිශ්චිතව ප්‍රකාශ කල නොහැක.මොකද ඒක දේහයෙන් දේහයට වෙනස් වෙනවා.මේ මාසෙ මිනී 32 ක් ආදාහනය කරලා තියනවා වැයවූ ගෑස් ප්‍රමාණය 32 න් බෙදපුවාම මධ්‍ය අගය එනවා.මධ්‍ය අගයෙන් ඒක තීරණය කරන්න බෑ.එක්කෙනාගෙන් එක්කෙනාට වෙනස් වෙනවා.ඒ සඳහා ක්‍රමවේදයක් නැතිව තිබිලා ක්‍රමවේදයක් අපි සකස් කරා.ඒ සකස් කරපු ක්‍රමවේදතමයි.අභ්‍යන්තර විගණන වාර්තාව ඇතුලෙ තියෙන්නෙ.

**ප්‍රශ්නය**

9.එය නිවැරදිද නම්, 2025 වර්ෂය සඳහා ගෑස් සිලින්ඩර 210 භාවිතයට ගෙන ඇත.ඒකක ප්‍රමාණය කි. කි.ග්‍රෑම් 37.5 ලෙස සඳහන් වේ.මුළු ගෑස් කි.ග්‍රෑම් ප්‍රමාණය (37.5*210) 7875. ලෙස පිලිගන්නේද?

**පිලිතුර**

නැත .2025 වර්ෂය තුල අප විසින් 37.5 ගෑස් සිලින්ඩර් 210 ක් මිළ දී ගෙන ඇත.එහි අඩංගු මුළු ගෑස් ප්‍රමාණය කි.ග්‍රෑ.7875 ක් වන නමුත් 2024 .12.31 දින වන විට ඉතිරි වී තිබූ ගෑස් කි.ග්‍රෑ.164 ත් සමඟ 8039 ක් වේ.2025.12.31 වන විට එම ගෑස් කි.ග්‍රෑ.8039 න් කි.ග්‍රෑ.487 ක් ඉතිරිව තිබූ බැවින් 2025 වර්ෂයේ ආදාහන කටයුතු සඳහා වැය වූ මුළු ගෑස් ප්‍රමාණය කි.ග්‍රෑ.7552 කි.

**ප්‍රශ්නය**

10. එක් මෘතදේහයන් ආදාහනය කිරීමට වැයවෙන්නේ කි.ග්‍රෑම් 20.72 නම් (වාර්තාවට අනුව) මෘතදේහයන් 380, 2025 වර්ෂයේ භාවිතා කර ඇත. එවිට මුළු ගෑස් කි.ග්‍රෑම් ප්‍රමාණය = 380*20.72 = කි.ග්‍රෑම් 7627 කි.මිලටගත් සිලිංඩර් 210 ප්‍රමාණයේ කි.ග්‍රෑම් 7875.මෙම සංඛ්‍යාව නිවැරදි නම් ඉතිරි වූ ගෑස් ප්‍රමාණය පිළිබඳව සභාවට පැහැදිලි කිරීමට නිධාරීන්ට උපදෙස් දිය හැකිද?

37.5*210 =7875

20.72*380=7627

වෙනස කි.ග්‍රෑම් 148

**පිලිතුර**

ඉහත 05 හි පිළිතුර අනුව මෘත දේහයන් සඳහා වැය වන ගෑස් ප්‍රමාණයන් වෙනස් වන බැවින් 2025 වර්ෂයේ ආදාහන 380 ආදාහනය කිරීමට වැය වූ මුළු ගෑස් ප්‍රමාණය කි.ග්‍රෑ.7552 කි.

**<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>**

ගරු සභාපතිතුමා දුන්නු පිලිතුර පිලිබඳ සෑහීමකට පත් වුවත් අභ්‍යන්තර විගණනය කියන්නේ ඔබතුමා කිව්වා වගේ පොලීසිය නෙමේ.හැබැයි සභාව ඇතුලෙ අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක වෙනවා.මේ අභ්‍යන්තර විගණනයේදී පැහැදිලිව කියනවා. ආදාහනාගාර විෂය නිලධාරියාට ආදාහනාගාරයේ ගෑස් තුලනය කිරීම පිලිබඳ විෂය නිලධාරියාට දැනුමක් නැති බව පැහැදිලියි. එබැවින් දැනුමක් ඇති කෙනෙකුගෙන් ඒ පිලිබද ගෑස් පිලිබඳ දැනුමක් ඇති කෙනෙකුගේ තුලනය සිදු කර ගැනීම සිදු කළයුතු බව යෝජනා කරනවා.එසේ නම් මේ අභ්‍යන්තර විගණය පිලිබඳ දක්වා ඇති තොරතුරු පිලිබඳ නිවැරදිතාවයක් නෑ.හේතුව ඔබතුමාගේ පැහැදිලි කිරීමත් එක්ක.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

ඒකට පිලිතුරු මම දුන්නා.අදාල විෂය නිලදාරියාට ඒ පිලිබඳ දැනුමක් නැති නිසා තාක්ෂණ නිලධාරිකෙනෙකු ලවා අපි ඒ කටයුත්ත කරවනවා.

**<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>**

දැන් ඔබතුමාගෙ ප්‍රශ්නෙට පිලිතුරු දෙනවා මෘත දේහ ආදාහනය කරන ගෑස් ප්‍රමාණය දළ වශයෙන් වෙනස් වෙන්න පුළුවන් කියලා.මෘත දේහයක් දහනය කරන්න 18-20 අතර යන්නෙ කියලා. හැබැයි අභ්‍යන්තර විගණනයේ කියනවා මෘත දේහයක් දහනය කරන්න 20.72 ක් වැය වෙනවා කියලා.

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

මන්ත්‍රීතුමා ඒ කියන්නේ මධ්‍ය අගය

<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>

ඊළගට ඔබතුමා 6 වෙනි ප්‍රශ්නෙදි උත්තර දෙනවා වැයවන ගෑස් ප්‍රමාණය පිලිබඳ ආදාහනාගාරයේ භාරකරු දැනුවත් නැත කියලා. ඊළගට ඔබතුමා 7 වෙනි ප්‍රශ්නෙදි උත්තර දෙනවා ගෑස්තුලනය කිරීම පිලිබඳ විෂය නිලධාරිතුමාවත් ඒ පිලිබඳව අවබෝධයක් ඇති බව. හැබැයි අභ්‍යන්තර විගණනයේදී කියනවා දැනුවත් නැ කියලා.

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

ඔබතුමාට මම අභ්‍යන්තර විගණනය සම්බන්ධව තමයි දැනුවත් කලේ.අභ්‍යන්තර විගණන නිලධාරීන් අපි පත් කලාට පස්සෙ එයාලටත් මේක සම්බන්ධයෙන් සම්පූර්ණ දැනුමක් නෑ.එයාගෙ අඩුපාඩුත් අර නිලධාරියාගේ අඩුපාඩුත් සාකච්ඡා කරලා හදාගන්න එක තමයි මේකෙ සිද්ධ කරන්නෙ.එතකොට අරයා කිව්වා කියලා අර නිලධාරියාට මේ පිලිබඳ දැනුමක් නෑ කියලා ඒක හරි වෙන්නෙත් නෑ.ඒ නිසා අභ්‍යන්තර විගණන කමිටුවට සහභාගිවෙන නිලධාරියාට ඒ පිලිබද දැනුමක් නෑ.ඒ නිසා එයාට කියන්නත් බෑ.ඒක වැරදියි කියලා. ඒ නිසා අභ්‍යන්තර විගණනයේදී සිද්ධ වෙන්නෙ අඩුපාඩුකම් නිවැරදි කරගන්න එක.මන්ත්‍රීතුමා අපි එතනින් පස්සෙ ඒ නිලධාරීන්ට දැනුවත් කරනවා ඒ නිලධාරින්ටඒ ෆයිල් වල තියන අඩුපාඩුකම් හදාගන්න කියලා.

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

මේ අභ්‍යන්තර විගණන වාර්තාව වැරදියි. අපි මේ වාර්තාව සම්මත කරා කියලා පිලිගත්තා කියන එක වැරදියි.

## (ඉ) යථා පරිදි කල්දී ඇති යෝජනා

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

මීළඟට විශේෂ යෝජනා කිහිපයක් තියෙනවා.න්‍යාය පත්‍රයට ඇතුළත් කරගන්න.ප්‍රියංගා සඳමාලි ධර්මදාස මහත්මිය විසින් 2025 දෙසැම්බර් 31 දින විගණන වාර්තාව සභාවට ඉදිරිපත් කරනවා.තත්වාගණනය පිලිබඳ වාර්තාව එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරදෙන්න.

<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>

එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට මා විසින් ස්ථිර කරනවා.

**<u>ඒ අනුව</u> ගරු සභාපති වයි. ජී. සංජීව කරුණාසාගර මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති 2025 දෙසැම්බර් 31 දින විගණන වාර්තාව සභාවට ඉදිරිපත් කරඇති.තත්වාගණනය පිලිබඳ වාර්තාව පිලිබද යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

මීළඟට .දොලවත්ත මන්ත්‍රීතුමා මුස්ලිම් ප්‍රජාවට අයත් කොටොම්පිටිය සුසාන භූමිය පිලිබඳ යෝජනාවක් ඉදිරිපත් කරනවා. එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරදෙන්න.

<u>ගරු මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා - (සර්ව ජන බලය)</u>

ගරු සභාපතිතුමනි, ඒ වගේම ගෞරවනීය මන්ත්‍රීතුමනි,තුමියනි ලේකම්තුමිය කාර්ය මණ්ඩලය සියළු දෙනාගෙන් අවසරයි. කොටඹපිටිය මුස්ලිම් සුසාන භූමිය සංවර්ධනය කිරීමේ යෝජනාව න්‍යාය පත්‍රයට ගන්න යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රී එම්. කේ.ආර්. හුසේයින් මහතා - ( ස.ජ.බ)</u>

එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති කොටඹපිටිය මුස්ලිම් සුසාන භූමිය සංවර්ධනය කිරීමේ යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

මීළගට .මා විසින් ඉදිරිපත් කරනවා. පඩුවස්නුවර ප්‍රාදේශිය සතු ගැසට් නොවූ මාර්ග (ඉතිරි මාර්ග) ගැසට් කිරීම සඳහා අපි ගිය සභාවකදී ඉදිරිපත් කරා.ගැසට් වෙලා තිබුනා.මේ 30 වනිදා දක්වා අපිට තියන මාර්ග එවන්න කියලා පලාත් පාලන දෙපාර්තාමේන්තුවෙන් දැනුවත් කරලා තියනවා.ඒ අනුව නව මාර්ග කීපයක යෝජනා ඉල්ලලා තියනවා.. එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරදෙන්න.

<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමා, ඇතුළු වගේම ගෞරවනීය මන්ත්‍රීතුමනි,තුමියනි ලේකම්තුමිය කාර්ය මණ්ඩලය සියළු දෙනාගෙන් අවසරයි.ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල තියෙන ප්‍රාදේශීය සභාවට පවරා නොගත් මාර්ග පවරා ගැනීම සඳහා කරන යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු සභාපති වයි. ජී. සංජීව කරුණාසාගර මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති පඩුවස්නුවර ප්‍රාදේශිය සතු ගැසට් නොවූ මාර්ග (ඉතිරි මාර්ග) ගැසට් කිරීම සඳහා යෝජනාව සම්බන්ධ යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතාමෙ</u>

මීළගට. මා විසින් ඉදිරිපත් කරන යෝජනාව .අපිට අර දියීවා තත්වය යටතේ පඩුවස්නුවර සභාවට පලාත් නිශ්චිත මගින් පාරවල් 23 ක් දැනට අනුමත වෙලා තියනවා.ඇස්තමේන්තු සකස් කරලා තියනවා.ඇස්තමේන්තු අනුමත කිරීම සඳහා එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරදෙන්න.

<u>ගරු මන්ත්‍රී ආර්.එම්. උපුල් නිශාන්ත මහතා- (ජා.ජ.බ)</u>

සභාපතිතුමා විසින ගෙන ආ ඒ යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු සභාපති වයි. ජී. සංජීව කරුණාසාගර මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති දියීවා සුළි කුණාටුවෙන් හානියට පත් පලාත් පාලන මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම- 2026 පළමු අදියර යටතේ ඇමුනුමෙහි සඳහන් පලාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අනුමත වී ඇති මාර්ග 23 ටෙන්ඩර් අනුමත සමිති මගින් ගිවිසුම්ගතව සිදු කිරීම සුදුසු බවට ගෙන එන යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

මීළහට අපේ 5.27 පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙ තීරණයක් ගත්තා.අපිට ආවා පලාත් පාලන දෙපාර්තමේන්තුවෙන් දැන් ඉන්ධන මිල වැඩිවීම නිසා ඊට සාපේක්ෂව අපේ යන්ත්‍රෝපකරණවල කුලී ගාස්තු වැඩි කරන්න කියලා.ඉතින් අපි තීරණයක් ගත්තා අවට සභාත් විමසලා මේ වාහනවලට යන වියදම අයින් කරලා සභාවට ලැබෙන ලාභයෙන් 1% ක් එකතු කරලා නව මිල ඉදිරිපත් කරන්න.පොඩි පොඩි ගණන් වැඩිවෙනවා.ඉන්ධන මිල වෙනස්වෙනතෙක්.මේ යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරදෙන්න

<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>

එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු සභාපති වයි. ජී. සංජීව කරුණාසාගර මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති ඉන්ධන මිල වැඩිවීම නිසා ඊට සාපේක්ෂව යන්ත්‍රෝපකරණවල කුලී ගාස්තු වැඩි කිරීම සුදුසු බවට ගෙන එන යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

නන්දසිරි මන්ත්‍රීතුමා හදිසි යෝජනාවක් ඉදිරිපත් කරලා තියනවා.නිකපිටිය මාර්ගය සම්බන්ධයෙන්.එතුමාගෙ හදිසි යෝජනාවක් විදිහට ගිය මාසේ මහ සබාවේ කතා කරා.නැවත වතාවක් ඉදිරිපත් කරනවනම් මාස 6 කින් පස්සෙ තමයි සභාවට ඉදිරිපත් කරන්න ඕන.අනිත් එක ගිය සභාවාරයේදී මේ සම්බන්ධව අපි සාකච්ඡා කරා.

**<u>ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)</u>**

සභාපතිතුමා මේ යෝජනාවේ සංශෝධනයක් තියනවා.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

මේ වෙනුවෙන් දැනට ලක්ෂ 90 ක් මුදල් වෙන් කරලා තියනවා.ඔය පැති බැම්මට ලක්ෂ 20 යි වෙන් කරලා තියෙන්නෙ.පැති බැම්මට කෝටි 5 ක් 6 ක් වෙන් කරලා සම්පූර්ණ පැති බැම්ම ගහන්න ඕන.නැත්තම් ඒ පාර හදලා වැඩක් නෑ මන්ත්‍රීතුමා.දැනට ඒ ලක්ෂ 20 ට අමතරව දැනට ලක්ෂ 70 ක් වෙන් කරලා තියනවා.අපි පළාත් පාලනආයතනයෙන් ආපු තාක්ෂණ නිලධාරීයා විශේෂයෙන් කිව්වා මුළු පාර මේ ලක්ෂ 70 න් ප්‍රතිසංස්කරණය කරන්න.ප්‍රමාණවත් කියලා.ඒ හින්දා මේකට වෙන මුදල් වෙන් කරන්න අවශ්‍ය නෑ.වෙනවනම් මේ මුදල් කප්පදු කරන්න ඕන නෑ මන්ත්‍රීතුමා අපිට පලාත් නිශ්චිත ලෙස මුදල් ලැබෙනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)</u>**

මට මෙතන දැනගන්න ඕන. නිකපිටිය මදුල්ල මාර්ගයේ වෙල අසල රුදවුම් බැම්ම කොහෙද තියෙන්නෙ. අපි දන්නෙ නෑ ඔබතුමා දන්නවද

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

මම දන්නවා.මන්ත්‍රීතුමා මේ මාර්ගයේ වෙල දෙපස කුඹුරු යායෙ දෙපැත්තටම පැති බැම්මක් ඕන.හරිනම් මේ මුළු පැති බැම්මම ගහලා තමයි.මේ මාර්ගය හදන්න ඕන.මේ මාර්ගය කොච්චර හැදුවත් වැඩක් නෑ.කුඹුරුයාය පැත්තට මේ පාර ඇදෙනවා. පාර කැඩෙනවා.ඔබතුමාලා හැදුවානෙ.තැලවිලි හැදුවා.ඒ නිසා මේ පාර මුළු දිගටම පැති බැම්ම ඕන වෙල දෙපස.ඒ වෙල්යායෙ පැති බැම්ම අවශ්‍ය තැනට තමයි පැති බැම්ම දාලා.තියෙන්නෙ.අනිත්තැන් වලටත් අවශ්‍යයයි.පැති බැම්මක් නැතිව කුඹුරු යායෙ පාරත් හදලා වැඩක් නෑ.

**<u>ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)</u>**

ඒ පැති බැම්ම දාන්නෙ කොතෙන්ටද කියන එක දාන්න එපායැ.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

ඒක තියනවා ඇස්තමේන්තුවෙ. ඔබතුමා බලන්න.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

තේ පානය සඳහා සභාව අඩාලව කල් තියන්න යෝජනා සම්මත කරගන්න.

**<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)</u>**

තේ පානය සඳහා විනාඩි 20 කට අඩාලව කල් තැබීම සුදුසුයි කියා මම යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී ආර්.එම්. උපුල් නිශාන්ත මහතා- (ජා.ජ.බ)</u>**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව පෙ.ව 10.50 ටතේ පානය සඳහා විනාඩි 20 ක් සඳහා සභාව කල් තබන ලදි.**

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

අඩාලව කල් තැබූ සභාව නැවත ආරම්භ කිරීම සඳහා යෝජනා සම්මත කරන්න.

**<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)</u>**

තේ පානය සඳහා අඩාලව කල් තැබූ සභාව නැවත පවත්වා ගෙන යාම සුදුසුයි කියා මම යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා - ( ස.ජ.බ)</u>**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

මීළඟට න්‍යාය පත්‍රයට ගන්න නැවත හදිසි යෝජනාවක් තියනවා.රංජිත් ප්‍රේමලාල් මන්ත්‍රීතුමා යෝජනා කරන.

**<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමනි, ඒ වගේම ගෞරවනීය මන්ත්‍රීතුමනි,තුමියනි ලේකම්තුමිය කාර්ය මණ්ඩලය සියළු දෙනාගෙන් අවසරයි.පඩුවස්නුවර පූජාභූමි රථගාල විසින් ඉල්ලීමක් කරලා තියනවා තොරණක් සහ රථගාලක් ඉදි කිරීමට.එය සභාවට ආදායමක් ලැබෙන දෙයක් නිසා මං යෝජනා කරනවා න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසුයි කියලා

**<u>ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන ජයලත් මහතා - ( ස.ජ.බ)</u>**

එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට මා විසින් ස්ථිර කරනවා.

**_ඒ අනුව ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා විසින් ගෙන ආ පඩුවස්නුවර පූජාභූමි රථගාල විසින් කරලා තොරණක් සහ රථගාලක් ඉදි කිරීම සුදුසු බවට ගෙන එන යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**(ඉ) I. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ඒ.රංජිත් නවරත්න මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). I දරණ යෝජනාව**

කඩහැර මංසන්ධියේ සිට වැලිවැහැර ගම්මානයට පිවිසෙන මාර්ගය පැළැස්තර දමා පිළිසකර කිරීමේ යෝජනාව.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ඒ.රංජිත් නවරත්න මහතා**

ගරු සභාපතිතුමනි, ඒ වගේම ගෞරවනීය මන්ත්‍රිතුමනි,තුමියනි ලේකම්තුමිය කාර්ය මණ්ඩලය සියළු දෙනාගෙන් අවසරයි.කඩහැර මන්සන්ධියේ සිට වැලිවැහැර ගම දක්වා දිවෙන මාර්ගය පිළිසකර කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී එම්. අශෝක හේරත් මහතා- (ජා.ජ.බ)**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ඒ.රංජිත් නවරත්න මහතා**

ගරු සභාපතිතුමනි කිරිමැටියාව කොට්ඨාශයේ වැලිවැහැර වසමේ කඩහැර මංසන්ධියේ සිට වැලිවැහැර ගම දක්වා දිවෙන මාර්ගය ඉතාම අබලන් තත්වයට පත්වෙලා තියෙන්නෙ. මං හිතන්නෙ කඩිනමින් මේ මාර්ගය පිළිසකර කරන්නත් අඩු මුදලකින් මේ මාර්ගය සංවර්ධනය කර ගත හැකිය.මේ මාර්ගය මං හිතන්නෙ වැලිවැහැර වසමේ අය විතරක් නෙමේ.ගල්දුනුපිටිය, මොහොත්තවගොඩ ගම්මානයයෙ අය පවා මේ මාර්ගයෙන් කටුපොතට යන්නෙ.ගලගෙදරට ගිහින් කටුපොතට යන්නෙ වැලිවැහැර වසමේ ජීවත්වන අය පමණක් නෙමේ. බොහෝ දෙනෙක් පාවිච්චි කරන මාර්ගයක්.ඒ නිසා මේක දැන් අබලන් වෙලා තියෙන්නෙ.බුලත් ව්‍යාපාරය කරන කීප දෙනෙක්ම ඉන්නවා.බුලත් ව්‍යාපාරයට බුලත් අරන් එන්නෙ යතුරු පැදි වලින්.මං යෝජනා කරනවා. කඩහැර මන්සන්ධියේ සිට වැලිවැහැර ගම දක්වා දිවෙන මාර්ගය පිළිසකර කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.එනිසා සභාවට මං මේ යෝජනාව ගේනවා.ඔබතුමාගේ බලාපොරොත්තු වෙනවා හැකි ඉක්මනින් මේ මාර්ගය පිළිසකර කර දෙන ලෙසට.

**ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන ජයලත් මහතා - ( ස.ජ.බ)**

රංජිත් මන්ත්‍රිතුමා කතා කරපු කාරණාව ගැන කතා කරද්දි මම දැක්කා ගරු සභාපතිතුමනි පඩුවස්නුවර පෙරහැර මුල්කරගෙන පාර හැදුවා.මේ යෝජනාවෙත් තියෙන්නෙ පැලැස්තර කථාවක් පැලැස්තර දමා පිළිසකර කිරීම යෝජනා කරමි කියලා. පඩුවස්නුවර ගම මැද මාර්ගය වාහනයක පැච් එකක් දාද්දිත් ටියුබ් කැල්ලක් දාලා අලවලා සොලිසන් දාලා අලවලා තමා පැච් එකක් දාන්නෙ.නිකම් ගල් හලාගෙන ගිහින් තියෙන්නෙ.දැන් ගිහින් බලන්නකො ගල් ගැලවිලා ගිහිල්ලා කරනවනම් සභාවේ නම කැත නොවෙන්නෙ මේ දේවල් කරන්න අර මන්ත්‍රිතුමාගේ ඉල්ලීමක් මේ විදිහට කරමු.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

ප්‍රිමික්ස් කරා නෙමේ.ඔබතුමාගේ අදහස හරි. මොකද ඔය වගේ එන්නත් ඕන. මේ සභාව සතු අපේ රංජිත් උපාලි සභාපතිතුමා ඉන්න කාලෙත් තියෙන්න ඇති.නඩත්තු ඒකකයක් ප්‍රිමික්ස් කරන වැඩ සටහනක්.මේ වැඩසටහන අකුලලා තියෙන්නෙ.මේ වැඩ සටහන මේ සභාවෙ තිබුනෙ නෑ.ඉතින් වැඩේ කරපු අය පස්සෙ කොන්ත්‍රාත්වලට මාරු වෙලා තිබුනෙ.ඒ නිසා මේක ඉන්නෙ පලපුරුදු සේවකයො නෙමේ.අපි පිටින් කෙනෙක් ගෙන්නලා පුහුනුව දීලා වැඩේ පටන් ගත්තා.එනිසා දැන් අපේ පාරවල් දෙකක්දැන් කරලා තියනවා.අඹගහවැවපාර හදිස්සියට කරේ.ඔය පෙරහැර නිසා පෙරහැරට අවශ්‍ය කියපු නිසා.පටන්ගත්තෙ හොද අරමුණකින්.හැබැයි කරලා තියන විදිහ අපි බලමු.මොකද අපි කැමති නෑ.කුණු ගාගන්න.ප්‍රිමික්ස් කරන වැඩේ ආරම්භ කරා.ඒ නිසා ඉස්සරහට ඇත්තටම මාර්ග නඩත්තු කිරීම සිද්ධ වුනේ නැත්තම් ඒවා විනාශ වෙලා අලුතින් හදන්න වෙන තත්වයට පත් වෙනවා.ඒ නිසා අපි මීට පස්සෙ මං කලිනුත් ප්‍රකාශ කලා මාර්ග වල සමහර ඒවා තාර ගැලවිලා.සෙකන්ඩ් කෝඩ් එක ගහලා ඒක බේරන්න පුළුවන්.එතකොට යන්නෙ තාර ටිකක් විතරයි.සෙකන්ඩ් කෝඩ් එක ගහන එක ආයෙකාලෙකට කැඩෙන්නෙ නෑ.ඊළඟට සමහර පාරවල් තියනවා පතාර වලවල් හැරිලා තියනවා.කිසිම නඩත්තුවක් වෙලා නෑ.ඒවට ඔය ප්‍රිමික්ස් දාලා හරියන්නේ නෑ. ඒබීසී දාලා තලලා හොඳට හදන්න ඕන.සමහර පාරවල් තියෙන්නෙ.ප්‍රිමික්ස් කරන වැඩේ. වෙනම යනවා.ඒබීසී දාලා තලලා නැවත කරන්න ඕන.ඒවා වෙනම යනවා ඒ සම්බන්ධයෙන් ඔබතුමාලා හොදටම බලන්න ඕන.ඒකෙ දෙගිඩියාවක් නෑ.

**ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)**

ගරු සභාපතිතුමනි, ඒ වගේම ගෞරවනීය මන්ත්‍රිතුමනි,තුමියනි ලේකම්තුමිය කාර්ය මණ්ඩලය සියළු දෙනාගෙන් අවසරයි.මේ ප්‍රදේශීය සභා පාරක් නොවුනත් මූණමල්දෙණිය සිට කටුපොත දක්වා මාර්ගය මං ඉල්ලීමක් කරනවා

අපේ කනෝගම ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙනකම් අපේ සීමාවට අහුවෙන්න.පළාත් සභා බල ප්‍රදේශයේ කඩතොළු ප්‍රමාණය වැඩිවෙමින් පවතිනවා ඒ ප්‍රදේශයේ.

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

ඔව් මන්ත්‍රීතුමිය ඒ සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කමිටුවෙ පඩුවස්නුවර නැගෙනහිර කතා කරා. ඔය සම්බන්ධව ගිය අවුරුද්දේ ප්‍රතිසංස්කරණ කටයුත්තක් පටන්ගත්තා.ඒකටත් අපි ලොකු සතුටක් පැහැදීමක් නෑ.ඒ සම්බන්ධව පහුගිය සම්බන්ධීකරණ කමිටුව දෝෂාරෝපණයට ලක් කරා. ඒනිසා සමහර තැන් තියනවා. වෙනස් කරමින් ඉන්නෙ.කොහොමටත් තාක්ෂණ නිලධාරියාගේ පැත්තෙන් තියෙන්නෙ මේ නඩත්තු කරනවට වඩා මේ සම්පූර්ණ පාර හදන්න ඕන. කියන එක

<u>ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා - ( ස.ජ.බ)</u>

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය,ලේකම්තුමිය ප්‍රධාන කාර්යමණ්ඩලයෙන් අවසරයි.අපේ නවරත්න මන්ත්‍රීතුමාගේ යෝජනාව යටතේම මමත් පුංචි ඉල්ලීමක් කරනවා. ගිය මාසෙ ලිපියකුත් භාර දුන්නා.යාය මංසන්ධියේ ඉහල ගොමුගොමුව ගම මැද්දෙන් එන මාර්ගය මේ වෙද්දි තාර කැඩිලා එක පැත්තකින් අසිරුතත්වයකට පත්වෙලා තියනවා.ඒ පාර එහාපැත්තෙ කොන්ක්‍රිට් අතුරපු පාරක් තිබ්බා එකම පැත්තෙ ඒකෙන් ලොකු වලවල් හැරිලා තියනවා.ඔබතුමාට ලිඛිතව අද වෙද්දි මාසයක් දැනුම් දුන්නා.කාර්මික නිලධාරියෙත් යවලා හරි ඒ පාර නිරීක්ෂණය කරලා කරුණාකරලා සුදුසු විදිහට හදලා දෙන්න කියන ඉල්ලීම කරනවා.මම අද අවස්ථාවක් කර ගන්නවා මේ යෝජනාව ඉදිරිපත් කරන්න.

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව සතු කිලෝමීටර් 1500 කට අධික ප්‍රමාණයක් තියනවා.නමුත් අවුරුදු හතලිස් ගානටම කිලෝමීටර් දෙසීයට අඩු ප්‍රමාණයක් තමයි ප්‍රතිසංස්කරණය කරලා තියෙන්නෙ බොරළුවලට පස්සෙවිශාල ප්‍රමාණයක් හදන්න තියනවා වගේම හදපු ඒවා ප්‍රතිසංස්කරණය කරන්න තියනවා.විශේෂයෙන්ම පළාත් නිශ්චිත මුදල් මිලියන 300ක් මේ පාර 300ට වඩා තව එකසිය ගානක් ඉල්ලලා තියනවා. මිලියන 300 ක් 400ක් විතර සල්ලි එනවා.බොහෝ දුරට මේ පාරවල් විශාල ප්‍රමාණයක් අපිට හදන්න පුළුවන් වෙයි කියලා විශ්වාස කරනවා.

<u>ගරු මන්ත්‍රී ජී.පී. තරංග චම්පික අලහකෝන් මහතා - (ශ්‍රී.ල.පො.පෙ)</u>

සභාපතිතුමනි අවසරයි.ඇත්තටම මේ පාර ගැන කතාකරද්දි වුව්වටක් කතා කරන්න දෙන්න.මාර්ග සංවර්ධනයේදී පොඩි දෙයක් තියනවා.ඒක ලේසි ක්‍රමයක්.කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේදී මාර්ගයක් සංවර්ධනය කරගන්න අවශ්‍ය නම් ඒ මාර්ගය භාවිතා කරන අය ජීබීසී රිළහට අවශ්‍ය අමුද්‍රව්‍ය සිට ගෙනත් දෙනවා. ඊට පස්සෙ එයාලා ශ්‍රමයත් ලබා දෙනවා.සභාවෙන් තියෙන්නෙ යන්ත්‍රෝපකරණ, කම්කරුවො ටික දාලා ඒ වැඩේ කරලා දෙන්න.කුලියාපිටිය ප්‍රදේශීය සභාව තුල පාරවල් සියල්ල හැදුනෙ ඒ ක්‍රමය මත තමයි. ඇපලදෙනියෙ ප්‍රදේශයේ මම ඒ පැත්තෙ හිටියෙ. මගෙනුත් ඇහුවා මේ පාර හදලා දෙන්නද කියලා. කුලියාපිටිය ප්‍රාදේශීය සභාවෙන්.මං කිව්වා අනේ ලොකු දෙයක් කියලා.ගමේ කට්ටිය ජීබීසී දාලා දුන්නා.ඊට පස්සෙ ගමේ අයගෙ දායකත්වය හින්දා ඒ පාර කැඩෙන්න දෙන්නෙත් නෑ.ඒ නිසා ඒ ක්‍රමය මම යෝජනා කරනවා.ඒ වගේම ගනීෂා එකයි සාලින්ද ඩොක්ට ඉන්න මාර්ගය ඒ කට්ටිය මුදල් දාලා දෙන්නම් පුළුවන් විදිහට උදව් කරන්න කියන ඉල්ලීමත් කලා.

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

අපි ඒ යෝජනාව සැලකිල්ලට ගමු.දැන් ඔය සමහර කර්මාන්ත තියන තැන් තියනවනෙ විශේෂයෙන් ඒ කර්මාන්ත තියන අයගෙ උදව්වත් අරගෙන විශේෂයෙන්ම කළුගල් ව්‍යාපාරය තියන අයගෙ පාරවල් කැඩෙනවා වැඩී.ඒ නිසා ඒ අයගෙ උදව් අරගෙන ඔබතුමා කියන සමහර පාරවල් පුළුවන් වෙයි. හැබැයි සමහර පාරවල් බැරිවෙයි. මොකද ඊට පස්සෙ ප්‍රශ්න කරනවනෙ සභාවකුත් තියෙද්දි පාරවලුත් හදන්න ඕනද වගේ.ඒ වගේ තැනකට යන්න ඕන නැනෙ.එනිසා අපි එහෙම උදව් ගන්න පූළුවන් තැන් වලින් උදව් ගමු.බැරි තැන්වල සභා අරමුදලෙන් හදමු. කොහොමත් අපේ මේ අවුරුද්දෙ මිලියන 400 ක විතර මාර්ග ප්‍රතිසංස්කරන සැලසුමක් තියනවා.

<u>ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා - (ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය,ලේකම්තුමිය ප්‍රධාන කාර්යමණ්ඩලයෙන් අවසරයි.මේ තරංග මන්ත්‍රීතුමා මගෙ කොට්ඨාශෙ ගැන පොඩි මතක් කිරීමක් කළා.ඊට පස්සෙ තමා මට කතා කරන්න හිතුනෙ ඒ ගැන.ඒ පාරේ කීප දෙනෙක් ඒ කතාව කිව්වා මුදල් දෙන්නම් කියලා කිව්වා.ඒක වත්තකට යන පාරක්.සභාවට සමහරවිට පවරගෙන ඇති. මොකද වීදි රේඛා එහෙම හදලා තිබ්බා.නමුත් ඒ ගොල්ලො ඒ කතාව කිව්වා.ඊට පස්සෙ කිව්වා ඔබතුමාට ලියුමක් දෙන්න කියලා.ඒ වගේම සභාපතිතුමනි පොලිසිය ගාව තියන පාර මතක් කරන්නෙ ඒක පටු මාර්ගයක් ඒ

නිසා ඒක හැමදාම වියදම් කරනවා කැඩෙනවා. බොහෝ දුරට පාර අබලන් වෙනවා. ඒ හින්දා අපි යෝජනාවක් දා ගමු පොලිසිය ගාවින් පොල ඉස්සරහ පාර පොලිසියෙ වතුරත් කෙලින්ම එන්නෙ එතෙන්ට ඒකෙ කානුවක් නෑ.ඉතින් ඒ පාර උස්සන්න ඕන.නැත්තම් පොඩි හරි අඩියක හරි කානු දෙකක් දැම්මොත් වතුර පාර බැහැලා ගිහිල්ලා හදන මහජන මුදල ආරක්ෂා කරගන්න පුළුවන්. නැත්තම් අපේ කාලෙදිම ආයෙ ඡන්දෙ ඉල්ලන්න යද්දි හරි ඒකට මැසිවිල්ලක් සභාවට මිනිස්සු නගනවා.ඒ හින්දා ඒක මතක් කරේ.කරුණාකරලා අර එච්එන්බී එක ගාව ඉඳන් ස්ටෑන්ඩ් එක ගාව පාර පොලිසිය ඉස්සරහ පාර ඒකටත් පල්ලිය පැත්තෙන් කානුවක් දාන්න වෙනවා. නැත්තම් ඒ පාරෙන් වැඩක් නෑ. මොකද මහාමාර්ගය උසයි.මෙතන පාතයි. එච්එන්බී එක පැත්ත උසයි.එතන වල වගේ.හැදුවට වැඩක් නෑ.ඒ පාර නිතරම කැඩෙනවා. මාස 6 ක් වත් තියෙන්නෙ නෑ. අර වලවල් පොගලනෙ තියෙන්නෙ.ඒ වගේම මං තව තාක්ෂණික කාරණයක් මතක් කරන්න කැමතියි.ග්‍රාමීය මාර්ග හදද්දි අපි දැකලා තියනවා දැනට අවුරුදු 20 කට විතර හදපු පාරවල් වල අර ලොකු කළුගල් දාලා තමයි ඒකෙ යට බේස් එක හදලා කියෙන්නෙ. අපේ ග්‍රාමීය මාර්ග හැම එකක්ම අලුත් මාර්ග.ඒ වගේ යට තද වෙලා නෑ. වැහි වතුරවගේ උල්පත් මාර්ග තියනවා. එනිසා මං යෝජනා කරනවා.ඒබීසී දාලා හදන මාර්ග වල ඒබීසී අඟලක් තුන් කාලක් දාලා හදන මාර්ගවල පාර වුට්ටක් කැඩුන ගමන් වලක් හැදෙනවා.ඊට පස්සෙ මාසයක් යද්දි අර වල පතහක් බවට පත්වෙනවා.කරුණාකරලා ඉල්ලීමක් කරනවා අපි පරණ ක්‍රමේට යමු. ග්‍රාමීය අතුරු මාර්ග හදද්දි අනිවාර්යයෙන්ම අපිට වියදමක් යනවා. ඒක සත්‍යයක්.නමුත් අපිට කළුගල් දාලා අතුරලා ඊට උඩින් ඒබීසී එන්නෙ මැත ඉඳලා. ඒබීසී හොඳයි කැඩිච්ච පාරවල්වලට. තාක්ෂණ නිලධාරීන් ලවා ඒ පරණ මාර්ග ක්‍රමේට යමු.නැත්තම් අපේ ධූර කාලය අවසන් වෙන්න කලින් කැඩිලා ආයෙත් මැසිවිලි නගිනවා.ඒ නිසා පරණ තාක්ෂණේට යමු. ඒ තාක්ෂණික නිලධාරීන් ඒවා හදද්දි ගමේ ඉන්න පරණ අයගෙන් තොරතුරු ගන්න ඕන.වතුර කොහොමද බහින්නෙ.වතුර කොහොමද උඩින් දාන්නෙ කියන එක.අපි දන්නෙ නැතිව එහෙම හදපුවාම හදලා යනවා. මාසෙන් දෙකෙන් අර මහජන දේපල ආයෙ බොරුවට වතුරට යනවා.ඒ නිසා හදන දේ හරියට හදමු කියන එක තමයි මම යෝජනා කරන්නෙ. පරණ ක්‍රමේට යමු. පරණ තාක්ෂණය භාවිතා කරමු කියලා හොඳ දෙයක් කරමු කියන එක තමයි මං යෝජනා කරන්නේ.

**<u>ගරු මන්ත්‍රීනී ඩබ්.ටී.එම්. චාන්දනී දීපිකා රත්නායක මහත්මිය - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය,ලේකම්තුමිය ප්‍රධාන කාර්යමණ්ඩලයෙන් අවසරයි .මං මේ සභාවට යෝජනාවක් වශයෙන් ගෙනාවා දෝතැල්ල කොට්ඨාශෙ අකුරණ ග්‍රාම සේවා වසමේ වැලිපිටිය පාර මීටර 500 ක වගේ පොඩි ප්‍රමාණයක් තියෙන්නෙ.ඒ පාරෙ අතුරලා තිබ්බ කුට්ටිගල් ගලවලා තවත් තැනක පරිස්සමට තියලා තියනවා.ඒවා යොදාගෙන මේ පොඩි ප්‍රමාණය මඩ වගුරු සහිත පාරක් පාසල් සිසු දරුවන්ට යන්න අපහසුයි.බයිසිකලයක්වත් යන්න බෑ.මගේ කොට්ඨාශෙ අකුරණ එතකොට මං මේ යෝජනාව මීට කලින් සභාවට ගෙනාවා සභාපතිතුමා.මට නමුත් තාම නියම පිලිතුරක් ලැබුනෙ නෑ.ඒ යෝජනාව සම්බන්ධයෙන්.මං කරුණාවෙන් ඉල්ලා සිටිනවා මේ ජනතාවගෙන් පුදුම කරදරයක් තියෙන්නෙ මන්ත්‍රීතුමිය මේ පාර හදලා දෙන්න කියලා.

**ඒ අනුව අනුව ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ඒ.රංජිත් නවරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද කඩහැර මංසන්ධියේ සිට වැලිවැහැර ගම්මානයට පිවිසෙන මාර්ගය පැළැස්තර දමා පිළිසකර කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**(ඉ) II. <u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). II දරණ යෝජනාව</u>**

ම විසින් යෝජනා කරන 6.(ඉ). II දරණ යෝජනාව_පඩුවස්නුවර අඹගහවැව යහමග තරුණ බෞද්ධ සංගමය විසින් සංවිධානය කරනු ලබන පෙරහැර සඳහා 607-01-viii වැය ශීර්ෂය යටතේ රු.350,000.00 ක ප්‍රතිපාදන වලින් රු.50,000.00ක් එම පෙරහැර වැඩසටහන වෙනුවෙන් වැය දැරීමට 1987 ප්‍රාදේශිය සභා පනතේ 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රදේශිය සභා අරමුදලින් වැය දැරීම සුදුසු බව යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී එම්.ඒ.මංජුල ප්‍රසන්න මංජුල මල්ලව ආරච්චි මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය,ලේකම්තුමිය ප්‍රධාන කාර්යමණ්ඩලයෙන් අවසරයි. සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා</u>**

බොහොම අනර්ඝ පෙරහැරක්.මං හිතන්නෙ අලි ඇත්තු විශාල ප්‍රමාණයක් සහිතව අඹගහවැව තරුණ කැල සංවිධානය කරලා තිබුනා. බොහොම උත්සවශ්‍රීයෙන් ඒ පෙරහැර පැවැත්වුවා.ඒ සඳහා ගරු කෘෂි සම්පත් නියෝජ්‍ය ඇමති නාමල් කරුණාරත්න මැතිතුමා ඒ වගේම පාර්ලිමේන්තු මන්ත්‍රී දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඇතුළු දේශපාලන නායකයන් හා අපේ සභාවේ මන්ත්‍රීවරු කීප දෙනෙක්ම ඒකට සම්බන්ධ වෙලා හිටියා. ඉතින් හොඳ නිමිති පෙරහැරක්

පැවැත්වුවා.ලබන අවුරුද්දෙදිත් මේ පෙරහැර ලස්සනට පවත්වන්න අපේ මන්ත්‍රීතුමාලා කාටත් ආරාධනා කරනවා ඒකට සම්බන්ධ වෙන්න කියලා. අපේ රංජි මන්ත්‍රීතුමා,කුමාරසේන මන්ත්‍රීතුමා, අපේ මංජුල මන්ත්‍රීතුමා මැදිහත් වෙලා තිබුනා ඒකට.බොහෙමෙ ස්තුතිවන්ත වෙනවා.

**ගරු මන්ත්‍රීනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)**

ගරු සභාපතිතුමනි ඇත්තටම අපේ ප්‍රධාන උත්සවය සාර්ථකව නිම කිරීම සතුටක්.පොඩි අඩුපාඩුවකුත් ආරංචි වුනා.රහුමානියා හොටෙල් එක ඉස්සරහා බොක්කු කැටයක් නැතිව දෙතුන් දෙනෙක් වැටිලත් තිබුනා.ඉතින් මං කියන්නෙ ලබන පෙරහැරට පෙරවත් මේ බෝක්කු කැටය දාලා අළුත්වැඩියා කරන්න.ඒ වගේම තමයි ප්‍රධාන උත්සව තියෙද්දි ප්‍රධාන විහාරස්ථානවල පමනක්ම නෙමේ. මම ඔබතුමාට දෙතුන් සැරයක්ම මතක්කරා යායෙගෙදර විහාරස්ථානයේ වෙසක් එක දවසෙත් බල්බ් දෙකම පිච්චිලා තිබුනෙ.වෙසක් ඒක දවසෙත් අපේ හාමුදුරුවො හරි කණගාටුවෙන් කතා කරා

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා**

ඒක දැම්මනෙ මන්ත්‍රීතුමිය.මං තුන් වතාවක් දැනුම් දුන්නා. අනිත් එක තමයි රහුමානියා හෝටලේ ගාව බොක්කු කැටේ නෙමේ.කානුවෙ උඩ කැටේ තිබිලා නැත්තෙ .

**ගරු මන්ත්‍රී එච්.එම්. නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා - (ශ්‍රී.ල.පො.පෙ)**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය,ලේකම්තුමිය ප්‍රධාන කාර්යමණ්ඩලයෙන් අවසරයි. ගරු සභාපතිතුමා විශේෂයෙන්ම මම යෝජනා කරනවා ඔබතුමාලගෙ ආණ්ඩුවක් විදිහට මේ පෙරහැර පවත්වන්න සහය දීම පිලිබඳ ස්තුති වන්ත වෙනවා.මේ පෙරහැරට ලබා දෙන මුදල් පෙරහැරට කලින් දුන්නනම් මීට වඩා ප්‍රයෝජනවත වෙයි. අපි ලබන අවුරුද්දෙදිවත් පෙරහැරට කලින් මේ මුදල් ලබා දෙමු.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා**

ඔබතුමාගෙ යෝජනාව හොදයි. නමුත් ක්‍රියාවලියක් තියනවනෙ.ඒ ක්‍රියාවලියට අනුව ඉල්ලීම කරලා තියෙන්නෙ පහුගිය සභාවට පස්සෙ. අපිත් කැමතියි කලින් දීගන්න.ලබන පාර අපි කලින් ඉල්ලන්න කියමු නේද.

**ඒ අනුව පඩුවස්නුවර අඹගහවැව යහමග තරුණ බෞද්ධ සංගමය විසින් සංවිධානය කරනු ලබන පෙරහැර සඳහා 607-01-viii වැය ශීර්ෂය යටතේ රු.350,000.00 ක ප්‍රතිපාදන වලින් රු.50,000.00ක් එම පෙරහැර වැඩසටහන වෙනුවෙන් වැය දැරිමට 1987 ප්‍රාදේශිය සභා පනතේ 132 (ඔ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රදේශිය සභා අරමුදලින් වැය දැරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**ඉ) III.<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). III</u> <u>දරණ යෝජනාව</u>**

ම විසින් යෝජනා කරන 6.(ඉ). III දරණ යෝජනාව_2026 වර්ෂය සඳහා සාමාන්‍ය පෙල විභාගයට පෙනී සිටින බල ප්‍රදේශයේ දරුවන් වෙනුවෙන් සිංහල ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි, සහ ඉතිහාසය යන විෂයන් වලට සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීම සඳහා 607-01-xiii වැය ශීර්ෂය යටතේ රු.100,000.00 ක ප්‍රතිපාදන මත 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත වැය දැරීම සුදුසු බව යෝජනා කරමි.

**ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)**

ස්ථිර කරන ගමන් මං මතක් කරනවා නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවෙ අංක 03 යෝජනාව යටතේ සම්මත වෙලා තියනවා.ඒ යෝජනාවෙත් රුපියල් ලක්ෂයයි. මේ යෝජනාවෙත් රුපියල් ලක්ෂයයි. දෙකම එකක්ද

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා**

දෙකම එක යෝජනාව.අර යෝජනාවමයි මේ.සාමාන්‍යයෙන් සභාපතිතුමාට ලක්ෂ 2 ක් දක්වා බලය තියනවා අනුමත කරන්න.මුදල් කමිටුවට තියනවා ලක්ෂ 20 දක්වා අනුමත කිරීමේ බලය තියනවා.මන්ත්‍රීතුමා හැබැයි එහෙම තියෙද්දිත් අපි මේ පලාත් පාලන දෙපාර්තමේන්තුවත් එක්ක මේක සාකච්ඡා කරන්න ලෑස්ති වෙලා ඉන්නෙ.පලාත් පාලන දෙපාර්තමේන්තුවෙන් දැනුම් දිලා තියනවා ආණ්ඩුකාරතුමා අනුමැතිය දෙන ඒවා මහ සභාවට දාන්න ඕන කියලා. අපි අහන්න ඕන සභාපතිතුමාට පැවරිලා තියෙන ලක්ෂ දෙකේ බලය,මුදල් කමිටුවට තියෙන ලක්ෂ 20 බලයත් එතකොට මොකද වෙන්නෙ කියලා.පලාත් පාලන දෙපාර්තමේන්තුවෙන් කියනවනම් ආණ්ඩුකාරඅනුමැතියට දාන්න කියලා අපිට ඒක දාන්න වෙනවා.

**ඒ අනුව 2026 වර්ෂය සඳහා සාමාන්‍ය පෙල විභාගයට පෙනී සිටින බල ප්‍රදේශයේ දරුවන් වෙනුවෙන් සිංහල ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි, සහ ඉතිහාසය යන විෂයන් වලට සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීම සඳහා 607-01-xiii වැය ශීර්ෂය යටතේ රු.100,000.00 ක ප්‍රතිපාදන මත 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත වැය දැරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී.**

**(ඉ) IV. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). IV දරණ යෝජනාව**

ඊළඟට මා විසින් යෝජනා කරන 6.(ඉ). IV දරණ යෝජනාව_තක්ෂිලා පෙර පාසල සඳහා ගිවිසුම් මත පෙර පාසල් සහායිකාවන් බඳවා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

**ගරු මන්ත්‍රිනී ඊ.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රිනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)**

අවම සුදුසුකම් මොනවද

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා**

වයඹ පළාත් සභාව මඟින් සකුරා පෙර පාසල මඟින් ඩිප්ලෝමාවක් ප්‍රධානය කරනවා.ඒ සුදුසුකම් සියල්ල සපිරූ අයට තමයි මේක ලබා දෙන්නෙ.අපි පහුගිය බඳවා ගැනීම් කලෙත් ඇත්තටම ඉන්ටවිව් කරලා සුදුසුකම් තියන අය.

**ඒ අනුව තක්ෂිලා පෙර පාසල සඳහා ගිවිසුම් මත පෙර පාසල් සහායිකාවන් බඳවා ගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී.**

**(ඉ) V. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). V දරණ යෝජනාව**

ඊළඟට මා විසින් යෝජනා කරන 6.(ඉ). V දරණ යෝජනාව_607-03-i වැය ශීර්ෂය යටතේ රු.500,000.00 ක මුදලක් වෛද්‍යආධාර සඳහා වෙන් කර ඇති බැවින් පහත නම් සඳහන් අය සඳහා ආධාර ලබා දීමට 1987 ප්‍රාදේශීය සභා පනතේ අංක 132 (ඔ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශීය සභා අරමුදලින් වැය දැරීමට යෝජනා කරමි.

1. දොරටියාගෙදර, මඟුලාගම පදිංචි එස්.රේනුකා දමයන්ති මහත්මිය - පිළිකා රෝගය රු.10,000.00
2. ඉහල ගොමුගොමුව, ඉහල ගොමුගොමුව පදිංචි වයි.එම්.ජොසපින් නෝනා මහත්මිය - හෘද රෝගය රු.10,000.00
3. මඩඉන, කුරටිහේන පදිංචි එස්.ඒ.බන්දු සේන මහතා - හෘද රෝගය රු.10,000.00
4. දොළහමුන 02 හෙට්ටිපොල පදිංචි ඊ.එම්.සුජීවා රත්නමාලි මහත්මිය - පිළිකා රෝගය රු.10,000.00

**ගරු මන්ත්‍රී එම්. අශෝක හේරත් මහතා- (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**ඒ අනුව පහල දොරටියාගෙදර, මඟුලාගම පදිංචි එස්.රේනුකා දමයන්ති මහත්මියගේ පිළිකා රෝගය වෙනුවෙන් රු.10,000.00 ක මුදලක් ඉහල ගොමුගොමුව, ඉහල ගොමුගොමුව පදිංචි වයි.එම්.ජොසපින් නෝනා මහත්මියගේ හෘද රෝගය වෙනුවෙන්රු.10,000.00 ක මුදලක් ද, මඩඉන, කුරටිහේන පදිංචි එස්.ඒ.බන්දු සේන මහතා ගේ හෘද රෝගය වෙනුවෙන්රු.10,000.00 ක මුදලක්ද , දොළහමුන 02 හෙට්ටිපොල පදිංචි ඊ.එම්.සුජීවා රත්නමාලි මහත්මියගේ පිළිකා රෝගය වෙනුවෙන් රු.10,000.00ක මුදලක් ද, 1987 ප්‍රාදේශීය සභා පනතේ අංක 132 (ඔ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශීය සභා අරමුදලින් වැය දැරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**(ඉ) VI. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).VIදරණ යෝජනාව**

මීළඟට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).VIදරණ යෝජනාව

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා (ස.ජ.බ.)**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය,ලේකම්තුමිය ප්‍රධාන කාර්යමණ්ඩලයෙන් අවසරයි. ගරු සභාපතිතුමා නුගවැල හන්දිය උප නගරය හා අසල ඇති වැව මුල් කරගනිමින් සභාවට වැඩදායි හා ප්‍රදේශයට අලංකාරය ගෙනෙන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සුදුසු බව යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා (ස.ජ.බ.)**

ගරු සභාපතිතුමා.මං මේ යෝජනාව දාන්න ප්‍රධාන කරුණක් තියනවා.සභාපතිතුමාත් මෙතන සංචාරක කර්මාන්තෙ ගැන පහුගිය මාසය පුරාම කතා කරා.ඉතින් එනිසා තමයි මං මේ යෝජනාව දාන්න හේතු වුනේ ආන්ඩුවෙත් මට තොරතුරු ලැබුනා 20,25 ක් විතර අයින් වෙනවා කියලා .එතකොට අපේ සභාපතිවරයට සංවිධායකවරයා හැටියටවත් මෙහෙ සංචාරක ඇමති දූරයක්වත් හම්බ වුනොත් මේ යෝජනාව දාලා තිබ්බොත් මේකත් ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒ හින්දයි විශේෂයෙන්ම මං මේ යෝජනාව ගේන්නේ.හෙට්ටිපොල අපේ සියඹලාගස්වැටිය වැව වගේම නුගවැල හන්දියත් මං හිතන්නෙ කුරුණෑගල වාරියපොල පහු කරගෙන එනකොට පුංචි නගරයක් වුනත් ඉතා අලංකාර පරිසරයක තමයි පිහිටලා තියෙන්නෙ.මේකත් ඇත්තටම සභාපතිතුමනි වැව වටේ මාර්ගය, මහා මාර්ගය අවට ලොකු භූමි ප්‍රදේශයක් ඉතුරුවෙලා තියනවා.දැනට මං හිතන්නෙ සභාවෙන් අවසර අරගෙන හරි ආර්ඩී එකෙන් අවසර අරගෙන හරි වෙළඳකුටි කීපයක් මේකෙ ඉදිකරලා තියෙනවා.කැළෑ වැහිලා තියනවා. මාළු ලැලි දාලා තියනවා.පිලිවෙලක් නෑ.අපි අපේ සභාව ඒ පිලිවෙල මං හිතන්නෙ අපේ සභාව මැදිහත් වෙලා පිලිවෙල හදා ගත යුතුයි ඇත්තටම සංචාරක කර්මාන්තය හරහා තමයි අපේ සභාවෙන් මේ වැඩ සටහන කරන්න බැරිවෙයි මං හිතන්නෙ.ඔබතුමා ඉදිරිපත් කරන වැඩ සටහනකදි තමයි මේක කරන්න වෙන්නෙ උප නගරයක් මුල් කරගෙන .අපේ ගාමන්ට් ෆැක්ටරිය, යොවුන් සේනාංකය දැන් දැන් මෙහෙ බොහොම ජනාකිර්ණ ප්‍රදේශයක්.සංචාරක කර්මාන්තය ගැන කතා කරපුවාම ඒකට ඔබතුමා වැඩි අවධානයක් යොමු කරන නිසා අපේ පඬුවස්නුවරට ගත්තහමපඬුවස්නුවර මුල් කරගෙන තමයි අපේ සංචාරක පුරවරේ තියෙන්නෙ.ඉතින් අපිට දැකලා බලලා සතුටු වෙන්න පුළුවන් පුරවරයක් තමයි.ඒ වගේම සමස්ථ ආසනේ පුරාම මේ වගේ වැඩසටහනක් ක්‍රියාත්මක වෙනවනම් තමයි හොද. ඇත්තටම පඬුවස්නුවර කියපුවාම රජවරු හිටියෙ පඩුවස්දෙව් රජ්ජුරුවො විතරයි.ඔබතුමාටවත් මං හිතන්නෙ හැකියාව ලැබුනොත් පඬුවස්නුවර පුරවරයට අපි ප්‍රාර්ථනා කරනවා ඔය 15,20 අයින් වෙද්දි සංචාරක කර්මාන්තෙ අඩුම තරමින් නියෝජ්‍ය ඇමතිකමක්වත් හම්බවෙලා පඬුවස්නුවර සංවර්ධනය කරන්න වාසනාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.ඉතින් මේ වගේ යෝජනාවක් දියුනු වෙන නගරයක් හැටියට සංවර්ධනය කළ යුතු නගරයක් කියන එකයි මගෙ යෝජනාව.

**ගරු මන්ත්‍රී එම්.ඒ.මංජුල ප්‍රසන්න මංජුල මල්ලව ආරච්චි මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය,ලේකම්තුමිය ප්‍රධාන කාර්යමණ්ඩලයෙන් අවසරයි පී ඒම්. කුමාරසේන ජයලත් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව අපි මීට කලින් ඉදිරිපත් කරලා තියනවා.ඇත්තටම ගත්තොත් අපේ පස් අවුරුදු සැලැස්මට මේ වැව පුවක්පිටිගම වැව කියන එක සංචාරක පුරවරයක් අපේ පඬුවස්නුවර සංචාරක කර්මාන්තයක් බවට පත්වෙන විදිහට හදලා තියනවා. ඒකෙ පඬුවස්නුවර කොට්ටාශෙ මූලිකයි.එතකොට පඬුවස්නුවර කොට්ඨාශෙ මූලික වෙද්දි අවට ප්‍රදේශ සියල්ල මේ සංචාරක පුරවරයට පාදක වෙනවා.අන්න ඒකත් එක්ක කඩවලගෙදර වසමේ මේ නුගවෙල හන්දියෙ පුවක්පිටිගම වැව කියන ප්‍රදේශය දේශීය සංචාරක, විදේශීය සංචාරකයන් පාදක කරගෙන අපි පස් අවුරුදු සැලැස්මෙත් සංචාරක කියන ක්ෂේත්‍රයටත් මං හිතන විදිහට 2029 අවුරුද්ද වෙනකොට මේ සියල්ල සම්පූර්ණ වෙනවා.ඒ වගේම නුගවෙල හන්දියෙ ලොකු පොකුණක් ඉදිකරලා ඒකට ලයිට් ටිකක්දාලාඒ වගේම තව ඉදිකිරීම් සකස් කරමින් ඉන්නවා පසු අවුරුදු සැලැස්මට මෙ යෝජනාව ඉදිරිපත්කරලා තියනවා.ඔබතුමාගේ යෝජනාව හොදයි.ඔබතුමත් දන්නවා ඇති මේ යෝජනාව පස් අවුරුදු සැලැස්මෙත් තියනවා සංචාරක කර්මාන්තය තුල.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය පෙ.ව.11.39 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

**ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)**

කුමාර මන්ත්‍රීතුමා පුවක්පිටිගම ඒ වැව ආශ්‍රිතව සංචාරක ව්‍යාපාරය ඒ වැඩ පිලිවෙල හදනවාවගේම පඬුවස්නුවර කේන්ද්‍රකරගනිමින් සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කරන වැඩ පිලිවෙලක් බවට පත් කරනවා. ඒක යථාර්ථයක් බවට පත්වුනොත් ඉතාමත් සංතෝෂ වෙනවා.අපි ඒකට සුභ පතනවා වගේම ගරු සභාපතිතුමනි ඉඩම් කැබලි කරද්දි යම් කොටසක් සභාවට වෙන් කරනවා.ඒ වෙන්කරපු ඒවා ඒ කාලේ කවුරු කළාද කොහෙමෙ කළාද කියලා දන්නෙ නෑ.දැන් විලගෙදර වත්තෙත් තියනවා කැලි දෙකක් සභාවට වෙන්කරලා ප්‍රයෝජනයට ගන්නට බැරි .හැබැයි ඒකෙ වගකීම තියෙන්නෙ දේශපාලන අධිකාරියට නෙමේ අපේ සභාවේ නිලධාරීන්ට සභාවට වෙන්කරගන්නකොට වැඩකට නැති කොටසක් නෙමේ අපිට සුදුසු කොටසක් සභාවට ආදායමක් ගන්න පුළුවන් සුදුසු කොටසක් වෙන් කරන්න ඕන.ඒ වුනාට දැන් අපිට ලැබිලා තියෙන්නෙ.ලැබිච්ච දෙයින් අපි මොකක් හරි ප්‍රයෝජනයක් ගන්න එපායැ. ඒ හින්දා සභාපතිතමාට යෝජනා කරනවා විලගෙදර වත්තෙ වැව් කොටුවක් වගේ තියනවා.ඊට මෙහා පැත්තෙ නෙළුම් පොකුණට මෙහා පැත්තෙ තව පොඩි කොටසක් තියනවා.ඒක සංවර්ධනය කරලා කෘෂි කර්ම අමාත්‍යංශයේ එක්ක හෙල බොජුන් හලක් වගේ යම් වැඩ පිලිවෙලක් ගත්තනම් නැත්තම් සභාපතිතුමා ඒතුමා කිව්වා වගේ මාළු කඩත් තියනවා, අවසර අරන් දාපුවද දන්නෙත් නෑ.බක්කි කඩ තියෙනවා. කැලෑ වැහිලා කියෙනවා.ඒ හරිය දියුනු වේගන යනවා. ඒ වගේම සභාපතිතුමා පඬුවස්නුවර රාජධානිය අසල වැව එතන එවකට සංවර්ධනය කරද්දි වැවේ තිබුන පස් යොදලා සකස් කරලා තියෙනවා.ඒ පඬුවස්නුවරට හැරෙන තැන අපිට යම් ආදායමක් ලැබෙන වෙළඳ සැල් දෙකක් තුනක් තියනවා.අපි සභාවට ආදායමක් හොයන්න ඕන.සියලු දෙනා එකතු වෙලා පක්ෂ විපක්ෂ අපි එකතු වෙලා මේ ආදායමක් ලැබෙන විදිහට වැඩ පිලිවෙලක් හදමු කියලා මම සභාවට යෝජනා කරනවා.ඇත්තටම මේ

ගැන අපි කතා කරලා තියනවා.සංචාරක කර්මාන්තෙ ගැන ඔබතුමත් කතා කරනවා.ඒ දේවල් හැදෙනවනම් හොදයි කියලා මං සභාපතිතුමාට යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය පෙ.ව.11.45 ට පමණ ගරුසභාවට පැමිණියා

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය,ලේකම්තුමිය ප්‍රධාන කාර්යමණ්ඩලයෙන් අවසරයි..මගේ ස්තුතිය පළමුවෙන්ම පුද කරනවා කුමාරසේන ජයලත් මන්ත්‍රිතුමාට මේ යෝජනාව සබාවට දැම්මට ඒ වගේම අපේ මංජුල මන්ත්‍රිතුමා පැහැදිලි කිරීමක් කරා මාත් එක්ක යථාර්ථයක් බවට පත්වෙන්න කියලා ඉල්ලීමක් කරනවා. ඒ වගේම ප්‍රාර්ථනා කරනවා.2029 වෙනකම් ජීවත්වෙන්න හැකියාව ලැබෙන්න කියලා මේක දකින්න.කළුබංඩා මන්ත්‍රිතුමා තමයි සංචාරක ලැයිස්තුවට මේ පඩුවස්නුවර දැම්මෙ.හැබැයි මේ ඉතිහාසෙ මට අවුරුදු 69 යි. අවුරුදු 17 කොල්ලෙක් හැටියට ගියපු පඩුවස්නුවර දකින්න ගිය මම අද දකින්නෙත් පඩුවස්නුවර ඒ විදිහටමයි.කිසි දෙයක් සිද්ධ වෙලා නෑ.මේ අවුරුදු හතලිස් ගානට.ඒවට කවුද වගකියන්න ඕන කියන එක අදාල නෑ.ඒ වගේම කුමාරසේන මන්ත්‍රිතුමා උපනගරයක් හැටියට නුගවැල මංසන්ධිය හදන්න කියලා යෝජනා කරනවා.හෙට්ටිපොල නගරය කියන්නෙ රජයේ ගොඩනැගිලි වලින් පිරිච්ච නගරයක්.ඊළඟට හෙට්ටිපොල ඉදලා කොටොම්පිටියට යනකොට ඒ නගරය විශාල වෙලා යනවා.ඇගලුම් කම්හලත් තියන ක්‍රීඩා පිටියක් තියන දැනට ඉදිකිරීම් විශාල වහයෙන් සිදු කෙරෙමින් පවතින නගරයක් තමයි නුගවැල හන්දිය.ක්‍රීඩා පිටිය ගැන මතවාදයක් ඇති වුනා.හැබැයි ආණ්ඩුව ඔබතුමාගෙ පලාත් සභාවෙ ආණ්ඩුකාරයා ඔබතුමාගෙ. සම්බන්ධීකරණ කමිටුවෙ එක පැයකින් නිදහස් කරන්න පුළුවන් කිසිදු ප්‍රශ්නයක් නෑ.ඒකෙ යෝජනාව ප්‍රාදේශිය සභාවේ ඒකමතිකව සම්මත වෙනවනම් දිස්ත්‍රික් සම්බන්ධිකරන කමිටුව හරහා යෝජනාව සම්මත කරගන්න කිසිදු ප්‍රශ්නයක් නෑ.මොකද දෙවනි ක්‍රීඩා පිටියක් විදිහට හෙට්ටිපොල නගරයේ පිට්ටනිය යොදාගන්න පුළුවන්.ඒ නිසා ක්‍රීඩා පිටිය පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව යටතේ ක්‍රීඩා පිටියක් විදිහට ආරක්ෂිත බැම්මක් හදලා ඒ පිට්ටනිය ගන්නවා. ඊළඟට නුගවැල හන්දියෙ තියනවා වැවක් .මේකෙ ෆුට් පාත් එකක් හදන්න ගිහින් හැදුනෙ නෑ.තනි කෙලින් තියන ඒ රක්ෂිතය තුල කඩ කාමර 20 ක් විතර හදන්න පුළුවන්.ඊළඟට නුගවැල තිබුන ඓතිහාසික ස්ථානාය් වටරවුම හදන්න කියලා මං සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.ක්‍රීඩා පිටිය හදනවා.ඉස්සරහ තියන උයන තුල උද්‍යානයක් වගේ හදලා කෑම ටිකක් කන්න වාඩි වෙලා ඉන්න පොඩියට හදන්න.පොකුණ ලස්සනට හදලා කොන්ක්‍රීට් බංකු හදලා එතන පුළුවන් අලංකාර ස්ථානයක් විදිහට සකස් කරන්න.මේ විදිහට අලංකාරවත් කාර්ය භාරයක් කරන වගකීම ප්‍රාදේශීය සභාව සතුයි.අර යෝජනාවට ඌණ පූර්ණයක් විදිහට මේ කරුණු ඇතුලත් කරන්නෙ.2027 අවුරුද්දෙ අයවැය තුල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා මේ කාරනා ඉෂ්ට සිද්ධ කරන්න කියලා මං ඉල්ලීමක් කරනවා.ඒ නිසා මං විශ්වාස කරනවා අලුත් ආදායම් මාර්ග 2026 වර්ෂයේ නිර්මාණය වෙලා නෑ. ඒ නිසා 2027 වත් ඔබතුමාලගෙ පස් අවුරුදු සැලැස්මේ හීනෙ වගේ මේ හීනෙත් ක්‍රියාත්මක කරන්න කියලා මං ඉල්ලිමක් කරනවා.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා</u>**

ඔබතුමාට වැරදි තොරතුරක් ඇවිල්ලා තියනවා. ඒක නිවැරදි කරන්න ඕන.සම්බන්ධීකරණ කමිටුවෙදි ඔය නුගවැල ඉඩම ප්‍රාදේශීය ලේකම්තුමත් ක්‍රීඩාංගනයකට ගමු කියලා තමයි කතා කලේ.ඊළඟට සංචාරක කර්මාන්තය ගැන කතා කරද්දි 2025 අයවැයේ ජනාධිපතිතුමා මිලියන 500 ක් පඩුවස්නුවර, යාපහුව, දඹදෙණිය, කුරුණෑගල රාජධානිවලට වෙන් කරලා දෙන්න පටන් අරන් තියෙන්නෙ.අර වැඩසටහන් මෙතන මොනවාහරි නම් කරාට සුද්දො එන්නෙ නැනෙ. යටිතල පහසුකම් ඕන ඒ ගොල්ලන්ට. ඇවිල්ලා සනිපාරක්ෂක කටයුතු තියෙන්න ඕන. ඇවිල්ලා නතරවෙන්න නවාතැන් පලවල් තියෙන්න ඕන.එනිසා දැන් මේ සුදානම් වෙන්න යන්නෙ ඒ ටික හදන ගමන් අපේ රජයේ වැඩ පිලිවෙලක් තියනවා. මේ කියන ස්ථාන 4 මූලික කරගෙන පඩුවස්නුවර, යාපහුව, දඹදෙණිය, කුරුණෑගල රාජධානිය සංචාරක පුරවරයක් බවට පත් කිරීමේ මුල ඉදලා වැඩසටහන පටන් අරන් තියනවා. ඒ සඳහා සංචාරක කර්මාන්තයේ යෙදෙන ආයතන තියනවා.විශේෂයෙන්ම සංචාරක අමාත්‍යාංශයත්, වයඹ සංවර්ධන අධිකාරියත් මේ වැඩසටහනට මූලිකව මැදිහත් වෙලා තියනවා.වයඹ ආණ්ඩුකාරතුමාගේ නායකත්වය යටතේ ඒ අනුව මේ අවුරුද්දෙ අපිට සනීපාරක්ෂක පහසුකම් සඳහා අපේ සියඹලාගස්වැටිය වැව ළඟට මිලියන100යි ඊළඟට පඩුවස්නුවර පූජා නගරේ පංසලේ වැසිකිලි පද්ධතියට මිලියන 5 ක්, පූජා නගරය ඇතුලෙ සනීපාරක්ෂක කටයුත් සඳහා ලක්ෂ 100 ඔක්කොම ලක්ෂ 250 ක අරමුදලක් මේ අවුරුද්දෙ ඒ සඳහා වෙන් කරලා තියනවා.දැන් පටන් ගන්න ආරම්භ කරලා තියෙන්නෙ.ඒ වගේම තමයි නුගවැල හන්දියෙ ඔය කියපු වැඩේ.ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ ශුද්ධ පවිත්‍ර කරලා දැන් ආරම්භ කරලා තියනවා.කණගාටුවට කරුණ ශුද්ධ පවිත්‍ර කරාට පස්සෙ කට්ටිය ගෙනල්ලා පරණ තාලෙ කඩ ටිකක් ගහගෙන තියනවා.ඒ ගොල්ලන්ටත් අපි ලස්සන කඩ ටිකක් දෙන්න ඕන.ඒකටත් අපේ පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව පළවෙනි ශ්‍රේණියේ ප්‍රාදේශීය සභාවක් බවට පත් වීම නිසා අපිට තෑග්ගක් ලැබිලා තියනවා මිලියන 15ක ජංගම වෙළදකුටි අලුත් තාලෙට ඉදි කරන්න අපිට මුදල් වෙන් වෙලා තියනවා. ඒ සඳහා කටයුතු සිද්ධ වෙමින් යනවා.පලාත් පාලන අමාත්‍යාංශය හරහා.

**අනුව ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා විසින් ඉදිරිපත් කරන ලද නුගවැල හන්දිය උප නගරය හා අසල ඇති වැව මුල් කරගනිමින් සභාවට වැඩදායි හා ප්‍රදේශයට අලංකාරය ගෙනෙන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක**

**කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**(ඉ) <u>VII. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).VIIදරණ යෝජනාව</u>**

මීළඟට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).VI1දරණ යෝජනාව

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා (ස.ජ.බ.)</u>**

සභාපතිතුමාගෙන් අවසරයි.විපක්ෂ මන්ත්‍රිවරුන්ට, මන්ත්‍රීවරියන්ට පෞද්ගලික කාරනාවකදී හෝ පොදු කාරනාවකදී ඒකරාශී වීමට හෝ සාකච්ඡා පැවැත්වීමට හෝ සුදුසු ස්ථානයක් සභා ගොඩනැගිල්ල තුල නොමැති බැවින් එයට ස්ථානයක් සකස් කර දීම සුදුසු බව යෝජනා කරනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.එම් උපුල් නිශාන්ත මහතා පෙ.ව.11.54ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

**<u>ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා - ( ස.ජ.බ)</u>**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා (ස.ජ.බ.)</u>**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.එම් උපුල් නිශාන්ත මහතා පෙ.ව.11.55ට පමණ ගරු සභාවට පැමිනියා.

අවසරයි සියළුදෙනාගෙන්.මම මීට ඉස්සරලා ගෙනාපු යෝජනාව සභාවට ගෙනාපු වෙලාවෙ මම සභාවේ යෝජනාවක් ඉදිරිපත් කරන්න මේකට ලිපිගොනුවක් පිරවිය යුතුයිනෙ.ඒ අවස්ථාවේ ඒ කාර්ය භාරය කරන අපේ නිලධාරිනිය ළඟට ගියාම එතුමියත් රාජකාරි කටයුත්තක තමයි හිටියෙ.ඒ අවට බැලුවා.මට ඉඳගන්න පුටුවක් තියනවද තියලා. එහෙම පුටුවක් තිබුනෙත් නෑ.එතකොට මට මේ ලිපි ගොනුව පුරවන්න තැනක් තිබුනෙ නෑ. මම මේක අරගෙන ගියා පත්තරේ දාලා තියන තැනට.එතෙන්ට ගිහිල්ලා බලපුවාමත් පුද්ගලයෙක් පත්තරේ කියවනවා. මට ස්ථානයක් නැති නිසා මං මිස්ගෙන් ඇහුවා මිස් අපට මේ පිලිබඳ ස්ථානයක් නැද්ද මන්ත්‍රිවරියන්ට හෝ මන්ත්‍රිවරුන්ට හෝ කියලා. ස්ථානයක් නැති බව තමා මට තේරුනේ. ඒ නිසා මං මේ යෝජනාව කරන්නේ පොදුවෙ අපි කාටත් විපක්ෂෙ මන්ත්‍රිවරුන්ට ලිපියක් ලියාගන්න.පොදුවෙ අපි විපක්ෂෙ හැටියට එකතු වෙලා කතා කළ යුතු ස්ථානයක් අපේ සභාව ගොඩනැගිල්ල තුල නෑ.මං හිතන්නෙ පහුගිය කාලෙ තිබුනා වගේ මතකයකුත් තිබ්බා.ඒත් මෑත ඉතිහාසෙ සභාවක්තුල එහෙම දෙයක් නෑ.අපි විපක්ෂෙ හරි බලවත්නෙ.විපක්ෂෙ විදිහට සාකච්ඡා කරන්න ඕන.රැස්වීම්, විවාද පවත්වන්න ඕන. අපේ ගරු සභාපතිතුමා මේ කාරණේ සභාව තුලම ස්ථානයක් දෙනවනම් තමයි හොද. ඇත්තටම අපි සාකච්ඡා කරද්දි අර අඹ ගහ යට හරි වෙළෙන්දො වගේ තමයි සාකච්ඡා කරන්නෙ.එහෙම දේවල් වෙන්න ඉඩ තියන්න එපා.අපිට දැනට ලොකු කාමරයක් දෙන්න.ඊළඟ කාලෙ එද්දි පොඩි කාමරයක් තිබ්බොත් ඇති.දෙන්න තුන්දෙනා ඊළඟ සැරේ ඉන්නෙ. ගරු සභාපතිතුමා අපි මන්ත්‍රිවරුන් හැටියට කටයුතු කරන්න ස්ථානයක් ලබාදෙන්න කියන ඉල්ලීම ඔබතුමාට නැවත වතාවක් කියනවා.මේක හැකි ඉක්මනින් කරලා දෙන්න කියන ඉල්ලීමක් කරනවා.

**<u>ගරු මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා - (සර්ව ජන බලය)</u>**

සභාපතිතුමනි, මුල් යෝජනාවෙදි මං අවසරගත් නිසා ජයලත් මන්ත්‍රිතුමාගේ කාරනාවට එන්නම්.මොකද අතුරු මට කියන්න තියෙන කරුණත් ඒ වෙලාවෙ ඉදිරිපත් කරන්නම්.බොහොම වැදගත් කාරනාවක් කිව්වෙ.ඒක සභාවෙ මාත් අත් වින්දා.ඔහු කිව්ව කාරනාව හරි.අඹගහයට හිටගෙන ඉන්නවා.ඊට අමතරව මේ ඊයෙ පෙරේදා අලුතින්ම වෙච්ච ප්‍රශ්නෙ ආදායම් වියදම් වාර්තා යැවීමට මේක ඔන්ලයින් යවන්න කිව්වට පස්සෙ වත්කම් බැරකම් මට හිතුනා ඒ වෙලාවෙ සභාවෙන් පොඩි උදව්වක් ගන්න පුළුවන්ද කියලා. එදා දවසෙ තිබුනා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කමිටු රැස්වීමට සහභාගී වෙලා දවල් මං ආවා ඇවිල්ලා ප්‍රධාන කළමණාකරණ නිලධාරිනිය ළගට ගියා ඒ අංශෙ.බොහොම ගුණවත් මහත්මියක්.කව්රුහරි කියලා තියනවා සභාපතිතුමා මම එයාට බැන්නා කියලා. හරිම ගුණවත් මහත්මියක්. මේ මන්ත්‍රිතුමාට උදව් කරන්න ඕන ඊයෙ දවසෙ දිලිප් මන්ත්‍රිතුමා ඇවිත් ඒක කරගෙන ගියා.මේකට අපි පුළුවන් උදව්වක් දෙමු කියලා තව කෙනෙකුට කිව්වා.ඇයත් මට උදව්වට ආවා.ඒ දෙන්නටම අමාරු කාර්යක් නිසා ඒ කර්තව්‍ය සඳහා පුද්ගලයකුට කතා කරා. මම ඒ පුද්ගලයගෙ නම මෙතන කියන්නෙ නෑ. සභාපතිතුමාට පෞද්ගලිකව කිව්වා. නම කියන්න බැරි කමක් නැතිව නෙමේ.ඔහුගෙන් ඇහුවා ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරිතුමිය මේක කරලා දෙන්න පුළුවන්ද කියලා.මම කලින්ම කියනවා ඇයට මගෙ මේ පුද්ගලයත් එක්ක පෞද්ගලික තරහක් තියනවා. නමුත් මං ඒකට කලබල නොවී අහගෙන හිටියා මොකද වෙන්නෙ කියලා.මං දන්නවා ඔහුගේ කතාව නෙගටිව් කියලා.ඊට පස්සෙ බයිබෝස් එකෙන් ඇවිත් මන්ත්‍රිවරයෙකුට, වයස ගැන හිතන්න ඕන.ඒ ගරුත්වයත් මොකවත් නොදී සභාවේ පිලිගත නොහැකි විදිහට කතා කරා.සභාපතිතුමා අදාල අංශෙ පුටුවක් දුන්නා මට ඉඳගන්න. ඊට පස්සෙ හවස බලනකොට ග්‍රෑප් එකේ ලේකම්තුමිය දාලා තියනවා මේක පෞද්ගලිකව තමන් තරගන්න කියලා. යම් උපදේශයක් ඉල්ලන්න ආපු මට මං කතා කරනවා. ඔබතුමත් නැනෙ. නැති නිසා මම කට බ්‍රේක් කරගෙන ගියා සභාපතිතුමා.ඊට පස්සෙ ලේකම්තුමිය හවස දාලා තියනවා එතුමියට කව්රු හරි දුන්නු තොරතුරක් අනුවනෙ එහෙම

දාන්නෙ.ඇත්තෙ කියලා හිතුවා මං ඒ වෙලාවෙ.මොකද එතුමිය දාලා තිබුනා මේක රහස්‍ය වාර්තාවක් යැවිය යුත්තේ අපි.ඒක හරි.මට පෞද්ගලිකව වැටහෙනවා ඒක.නැවත වතාවක් මේ කිසි කෙනෙක් ගාවට යන්නෙ නෑ කියලා මගෙ එක තනියමත් යවලා ඉවරයි.තනියම මං ඒක හදා ගත්තා.මං ඉල්ලනවා මේ අවස්ථාවේදී ඇත්තවශයෙන්ම මේ මන්ත්‍රීවරු ආවට පස්සෙ සමහරුන්ට ගරුත්වය දීලා කතා කරලා වඩාගෙන කවන සයිස් එකට එනවා.සමහරුන්ට බල්ලන්ට ලෙලි පොල් වගේ.ඒ නිසා පොල්ලෙලි ගානට දාන්නෙ නැතිව මේ මිනිස්සු හැමෝටම ගරුත්වය ලැබෙන විදිහට බදවගන තියනවා වැරදියි.රැකියාව වැරදියි. අධ්‍යාපන සුදුසුකම් ඇතිව ආවනම් ඔහොම වෙන්නෙ නෑ.එතකොට මට තියන වේදනාව විශේෂයෙන් ඔබතුමා බැහැර ගිහින් මීට් එකේ නැති නිසා සහ ලේකම්තුමිය ඉදිරිපත් කරපු කරුනු ඇය දන්නෙ නෑ මොකද වුනේ කියලා.මොකද මට ආරංචි වුනා කාන්තාවන්ට බැන්නා කියලා කිව්වා කියලා. නෑ ඒ කාන්තාවො මට බොහොම ආදරෙන් උදව්කරා. ඒ නිසා මේ ජයලත් මන්ත්‍රීතුමාගේ කතාව අපිට යම් දෙයක් ගැන කතා කරන්න අර වතුරෙන් ආවරණය වෙලා තියනවනෙ මම දැක්කා උදේත් වතුර වැටෙනවා.ඒකට තහඩු කැල්ලක් බාගයක් ගහලා නවත්තලා.ඉතුරු කැල්ලත් ගහලා අන්න ඒ කැල්ල හදලා දුන්නනම් අපිට පොඩි තැනක් අපේ කටයුතු ඔෆිස් එකේම කර ගත්තැහැකි.මේ යෝජනාවට මමත් කැමතියි.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා</u>**

ඔබතුමාලගෙ වත්කම් බැරකම් ප්‍රකාශය පුරවන එක සම්බන්ධයෙන් කලිනුත් දැනුවත් කලා.ඒක මන්ත්‍රීවරයෙක් විසින් පුද්ගලිකව කළ යුතු දෙයක්.රහස්‍ය තොරතුරුනෙ තමුන්ගෙ දේවල් සම්බන්ධ තොරතුරු.අපි සභාවෙන් උදව්වක් කරගන්න තමයි ඒ වැඩේ හදා ගත්තෙ. පළවෙනි දවසෙ අපි ලේකම්තුමියගෙ කාමරේ ස්ක්‍රීන් එකෙන් වහපු කොටසෙ තමයි දිලිප් මන්ත්‍රීතුමා එහෙමත් කරගත්තෙ.දෙවනි දවසෙ පොඩ්ඩක් තැන වෙනස් වෙලා තියනවා.ලේකම්තුමිය එදා හිටියෙ නෑ ඒ නිසා කාමරේ දෙන්න විදිහක් තිබ්බෙ නෑ.ඒකෙදි තමා ඔය මොකක් හරි ප්‍රශ්නයක් වෙලා තියෙන්නෙ.අදාල වැඩේ නෙමේ. උදව්වක් කරන්න ගිහිල්ලා.

**<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>**

මේ යෝජනාව ඉදිරිපත් කරපු එක ගැන කුමාරසේන ජයලත් මන්ත්‍රීතුමාට නැවත වතාවක් ස්තූතිවන්ත වෙන්න ඕන. පහුගිය කාලපරිච්ඡේදය පුරාවටම මේ ඉල්ලීම් කරේ නෑ. ඔබතුමා දන්නවා ඔබතුමා හිටපු කාලෙත් සුනිල් ජයවීර මන්ත්‍රීතුමාට උප සභාපතිකාමරයක් දුන්නෙ නෑ කියලා බජට් එකත් පරද්දලා විප්ලවයක් කරා.හැබැයි දැන් මේ සභාවේ ඉඩ තියනවා.සභාවේ ප්ලෑන් එක හදනකොටම විපක්ෂනායක උප සභාපති සබාපතිතුමාගේ කාර්ය මණ්ඩලය සියළුම දෙනාට රැස්වෙන්න ප්ලෑන් එකක් තමයි හදලා දුන්නෙ.දැන් මං මතක් කරන්න ඕන සංවර්ධන කමිටු තිබුනු කාලෙ ඩෙස් බංකු ටික තියනවා.ඇත්ත තත්වෙ අසරණ භාවයට පත්වෙන්න පුළුවන්කමක් නෑ මන්ත්‍රී කෙනෙකුට.හැම සභාවකම මේ පහසුකම් සලසලා තියෙන්නෙ.ඒ නිසා ඒ සියලු පහසුකම්වලින් සමන්විත තමන්ගෙ කාර්ය භාර්ය ඉෂ්ට කරනිමින් ඒ ස්ථානය සකස් කරලා දෙන්න කියලා කුමාරසේන ජයලත් මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට අදහසක් එක් කරන්න කැමතියි.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා</u>**

ඇත්තටම ගත්තොත් සභා ඉතිහාසෙ සභාපති හා උප සභාපති අතර රන්ඩු තිබුනා. කාමරයක් දුන්නෙ නෑ. ඔන්න ඔහොම ප්‍රශ්න තිබුනා. මේ ගොඩනැගිල්ලේ උඩ කාමරයක් තියනවා.ටිකක් ලොකු කාමරයක්.ඒ කාමරය අපි කලින් සභාව පවත්වපු ඩෙස් බංකු ටික තියෙනවා.ඒ ටික දාලා තමුන්නාන්සේලාට එකතු වෙන්න අපි ඒ කාමරේ සකස් කරලා දෙනවා.

**<u>ගරු මන්ත්‍රීනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)</u>**

විපක්ෂෙ මන්ත්‍රීතුමියක් විදිහට ප්‍රශ්නයක් උද්ගතවෙලා තියනවා.මේ දැන් අත් විදින්න වුන නීතීමය තත්වයක් නිසා වාරියපොල පොලීසියෙන් පැමිනිලි අංශෙ ඕඅයිසී මහත්තයා මට දැන් කෝල් එකක් දුන්නා.ඒ හින්දා සභාවෙ ප්‍රශ්නයක් හින්දා වෙන තැනක මට කියන්න බැනෙ.ඒ හින්දා ඔබතුමාලා දන්නවා. ඔබතුමාලා විතරයි හිටියෙ 2018 සභා කාලෙ 2022 වර්ෂයේ පමණ සභාපති මන්ත්‍රීවරුන්ගේ මැදිහත්වීමෙන් මම බන්ඩාරකොස්වත්ත වසමට වෙළඳ කුටියක් ගත්තා. ඒ කෙනා විදේශ ගත වුන හින්දා වෙනත් කෙනෙක් ඉල්ලුවා ඒ කොට්ඨාශෙම වෙනත් කෙනෙකුට ඒක ගන්න මැදිහත් කරලා දුන්නා. හැබැයි එතුමියට කිව්වා සභාවට බදු මුදල් ගෙවන්න කියලා.ටික කාලයක් එතුමියත් ගෙවා ගෙන ගියා.එතුමියටත් පොඩි පොඩි ප්‍රශ්න ඇවිල්ලා වෙළඳාම් කරන එක නතර වුනා.මගෙන් දෙතුන් දෙනෙක්ම ඇවිත් ඇහුවා.මං මැදිහත් වුන බව දන්නවා මේ වෙළඳ කුටියට.මට ඉල්ලලා දෙනවද මේක කියලා ඉතින් ඒ අවස්ථාවෙදී දෙතුන් දෙනෙක්ගෙන්ම ඇහුවා අරගෙන බදු මුදල් සභාවට ගෙවන එක නීතීමය කටයුත්තක් ඒක හැබැයි මට දන්වන්න කියලා.සභාවට කියන්න කියලා. හැබැයි ප්‍රශ්නයක් තියනවා ඒ වෙළඳ කුටිය එතනින් අස්ථානගත වෙලා තියනවා.ගෙනිච්ච කෙනෙක් අද වෙනකම් දැන්නුවෙ නෑ.ගෙනියන්න මගෙන් දෙතුන් දෙනෙක්ම ඇහුවා. මොකද මම මැදිහත් වෙලා කොට්ඨාශෙට ඒක අරගත්ත හින්දා.ඉතින් ඊයෙ දවසෙ සභාවෙන් මට කෝල් එකක් ආවා.මෙන්න මෙහෙමයි සභාවෙ කුටිය නෑ. අස්ථානගත වෙලා තියනවා ඔබතුමිය තමයි මේකට මැදිහත් වෙලා තියෙන්නෙ.ඒ නිසා මොකද කරන්නෙ.බදු මුදල් බදින්න වෙනත් කොට්ඨාශෙක කෙනෙක් ඇවිත් තියනවා මේ වෙනකොට.කොහෙද තියෙන්නෙ කියලා ඉතින් ඇත්තටම මම දන්නෙ නෑ එතනින් වෙන කෙනෙක් අරන් තියන

බව. දෙතුන් දෙනෙක්ගෙන් ඇහුවා.මං කවුද මේක අරන්ගියෙ කියලා .හොයලා බලලා මම සභාපතිතුමාටත් ලේකම්තුමියටත් කතා කරලා මේ පිලිබඳ හොයලා බලලා දැනුම් දෙන්නම් කියලා එතුමියට දැනුම් දුන්නා.මම දූරකථනයෙන් කතා කරලා එතුමියට කිව්වා හෙට උදේ සභාවට එනවා.සභාවට එනකම් කියන්න බෑ.මං සභාපතිතුමාටත් ලේකම්තුමියටත් දන්වන්නම් කියලා.ඉතින් මට කතා කරපු අය දූරකථනයෙන් සම්බන්ධ කර ගන්න බැරිව ගියා. ඒත් දැන් ඉතාමත් ඉක්මනින් කිසිම කරුණක් විමසන්නෙ නැතිව වාරියපොල පොලිසියට සභාවේ නියෝජිතයෙක් ලවා පැමිණිල්ලක් දාලා.මට විරුද්ධව වගේ තමා ඒක කිව්වෙ.ඉතින් ඇත්තටම අපි මේවට මැදිහත්වුනා මිසක් ප්‍රජා සත්කාර සේවයට කැපවුනා මිසක් අපි මේවගෙ නීතියෙ වරදකාරයො වෙන්න වැඩ කරේ නෑ.ඉතින් මං මේවා එක් අයකුට බෑ කිව්වා නම් වෙන අයකුට බදු අරන් දුන්නෙ මම. ඒ නිසා මම දැන් දෙතුන් දෙනෙක් අහපු හින්දා මම දන්නෙ නැනෙ ගෙනිච්චෙ කව්ද කියලා.මං ඒ අයගෙ ඔක්කොගෙන්ම අහලා බැලුවා ඔබතුමා අරන් ගියාද ඔබතුමා අරන් ගියාද කියලා.මට එක්කෙනෙක් කිව්වා කලින් පාවිච්චි කරපු කෙනා පෙරලිලා තිබුන වෙළඳ කුටිය මං අරන් ගිහින් වෙළඳාම් කරනවා මේක මටම අරන් දෙන්න නීතිය ක්‍රියාත්මක කරන්න එපා කියලා ආයාචනා කරා.ඉතින් මං අහන්නෙ ඊයෙ දූරකථනයෙන් මට දැන්නුවෙ.මගෙන් කිසිවක් විමසන්නෙ නැතිව මේ පැය 24 යන්නත් මත්තෙන් ඇයි එහෙම පැමිනිල්ලක් දාන්න ගියෙ මට විරුද්ධව.මම විපක්ෂෙ ඉන්න හින්දද.මේ වතුර බෝතල් සිද්දිය මම කතා කරපු හින්දා මාව මුදල් කමිටුවෙනුත් ඉවත් කරා.මේ පැමිණිල්ල අස් කරගන්න.

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා</u>

මං පැහැදිලි කරන්නම්. මම කලිනුත් දැනුම් දුන්නා මේ සභාවට වෙළඳකුටි කොහෙමද දුන්නෙ කියලා.මම අර කලින් නිවේදනයක් විදිහට කිව්ව වෙළඳ කුටිය.අපේ ආදායම් නිලධාරීන් විසින් දැනුම් දෙනවා මේ වෙළඳ කුටිය තිබුන තැනින් අස්ථානගත වෙලා කියලා. දැනුම් දුන්නට පස්සෙ ඒ වෙළඳ කුටි පිලිබඳ සොයා බැලුවට පස්සෙ ඒ වෙළඳ කුටිය වෙන කෙනෙකුට ගිහිල්ලා භාර දීලා.අරගෙන තිබුන වෙළඳ කුටිය නිශාන්ති ගුණතිලක මන්ත්‍රීතුමිය මැදිහත්වෙලා එයාට බාර දුන්නයි කියලා මේ ප්‍රකාශය කරලා තියනවා.ඒක ලිඛිතවත් තියනවා.වාර්තාවක් දීලා තියනවා.මෙතුමිය මගෙ කොට්ඨාශෙ තියන ඒවා එහෙම පිටට දෙන්න බෑ කියලා ගෙනිහිල්ලා දුන්නා කියලා වාර්තාවේ සටහන් වෙනවා.මේ පැමිනිල්ල දාලා තියෙන්නෙ මේ වෙළඳ කුටි භාරව ඉන්න නිලධාරියෙක් ඉන්නවා.ඒක අස්ථානගතවුනාට පස්සෙ ඒ නිලධාරියාට වගකීමක් තියනවා ඒ වෙළඳ කුටියට වග කියන්න.ඒ නිසා ඒ අදාල නිලධාරින් නීතිමය කටයුතු කරලා.එනිසා මේකෙ දේශපාලන පක්ෂයක්වත් විපක්ෂෙ ප්‍රශ්නයක්වත් නෙමේ.රාජ්‍ය දේපල සම්බන්ධ ප්‍රශ්නයක් තියෙන්නෙ.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)</u>

- ප්‍රාදේශීය සභා ගරු උපසභාපති බන්දුල සමරවික්‍රම මහතා ප.ව.12.19 ට පමණ සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එච්. මාලක අරුණ කුමාර මහතා ප.ව.12.19 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සී.පී.රංජිත් අබේපාල මහතා ප.ව.12.19 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකොන් මහතා ප.ව.12.19 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා

සභාපතිතුමා ඔබතුමාකියන කාරනාව හරි. වෙළඳ කුටි පහුගිය කාලෙ දුන්නෙ ඔබතුමා ඔය කිව්ව ක්‍රමයට තමා.කමිටුවකින් ඒ කොට්ඨාශෙ මන්ත්‍රීවරයා හරහා කොට්ඨාශෙ ඉන්න සුදුසුකම් තියෙන කෙනෙකුට තමා වෙළඳ කුටි ලබා දුන්නෙ.ඒ වගකීමට ඒ කොට්ඨාශෙ ඉන්න මන්ත්‍රීවරයා හිටියා. සමහර වෙළඳකුටි වල ඒ භාරගත්තඅය ඔහොම නෙමේ.ඒ අය ඒ අය මාරු කරගෙන.සභාපතිතුමා ඔබතුමා ප්‍රකාශයක් සටහන් කරගත්තා කිව්වා ලිඛිතව, වාචිකව දෙකෙන්ම ඒ වෙළඳකුටිය භාරගත්ත කෙනාගෙන්.දැන් ඔබතුමා කියනවා වෙළඳ කුටිය අස්ථානගතවෙලා කියලා.එතකොට වෙළඳකුටිය අස්ථානගත වුනානම් මේ ඉන්න පක්ෂ හෝ විපක්ෂ හෝ මේ මන්ත්‍රීවරියට විරුද්ධව පැමිනිල්ලක් දාන්න කලින් ඔබතුමා නිදහසට කරුනු අහන්න තිබුනනෙ.මේ ඉන්නෙ මහජන නියෝජිතයෙක් මහජනතාව වෙනුවෙන් යම් වැඩක් කරන්න ගිහිල්ලා මෙහෙම අපහසුතාවයට පත් වෙන්න ඕනද.

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා</u>

නීති විරෝධී වැඩ කරන්න බෑ මන්ත්‍රීතුමා.සභාවෙ දේපලක් එක තැනකින් අරගෙන ගිහින් වෙන තැනකට දෙන එක නීති විරෝධි තමයි.සභාව දැනුවත් නොකර ගෙනියන එක නීති විරෝධියි.

**ඒ අනුව ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා විසින් ඉදිරිපත් කරන ලද විපක්ෂ මන්ත්‍රීවරුන්ට, මන්ත්‍රීවරියන්ට පෞද්ගලික කාරනාවකදී හෝ පොදු කාරනාවකදී ඒකරාශී වීමට හෝ සාකච්ඡා පැවැත්වීමට හෝ සුදුසු ස්ථානයක් සභා ගොඩනැගිල්ල තුල නොමැති බැවින් එයට ස්ථානයක් සකස් කර දීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**(ඉ) VIII. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).VIIIදරණ යෝජනාව**

ඊළඟට මා විසින් යෝජනා කරන 6.(ඉ). VIII දරණ යෝජනාව_ගිවිසුම් පදනම මත බඳවාගෙන ඇති පහත නම් සඳහන් සේවකයන්ගේ සේවා කාලය, ගිවිසුම අවසන් වන දින සිට මාස 06 ක් දීර්ඝ කිරීම සුදුසු බව යෝජනා කරමි.

| නම | තනතුර | ගිවිසුම් කාලය අවසන් වන දිනය |
|---|---|---|
| 1.ජේ.එම්.ගයාන් ප්‍රසන්න ජයසූරිය | සෞඛ්‍ය කම්කරු | 2026.06.21 |
| 2.ආර්.ඩී.සාගර වසන්ත කුමාර | සෞඛ්‍ය කම්කරු | 2026.06.21 |
| 3.එස්.එම්.සුරංග ප්‍රේමකීර්ති | සෞඛ්‍ය කම්කරු | 2026.06.21 |
| 4.ඩබ්.බී.එම්.අමිල සම්පත් කුමාර | සෞඛ්‍ය කම්කරු | 2026.07.05 |
| 5.ආර්.එම්.රසික නාමල් රත්නායක | රියදුරු | 2026.07.21 |
| 6.ආර්.එම්.උදිත ෂාණුක දිසානායක | රියදුරු | 2026.07.21 |
| 7.ඩබ්.ඩී.එම්.ඩී.සෝමරත්න | පුස්තකාල සහායක | 2026.08.14 |

**ගරු මන්ත්‍රී එම්.ජී.මංජුල ප්‍රසන්න මංජුල මල්ලව ආරච්චි මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගිවිසුම් පදනම මත බඳවාගෙන ඇති පහත නම් සඳහන් සේවකයන්ගේ සේවා කාලය, ගිවිසුම අවසන් වන දින සිට මාස 06 ක් දීර්ඝ කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

| **නම** | **තනතුර** | **ගිවිසුම් කාලය අවසන් වන දිනය** |
|---|---|---|
| **1.ජේ.එම්.ගයාන් ප්‍රසන්න ජයසූරිය** | **සෞඛ්‍ය කම්කරු** | **2026.06.21** |
| **2.ආර්.ඩී.සාගර වසන්ත කුමාර** | **සෞඛ්‍ය කම්කරු** | **2026.06.21** |
| **3.එස්.එම්.සුරංග ප්‍රේමකීර්ති** | **සෞඛ්‍ය කම්කරු** | **2026.06.21** |
| **4.ඩබ්.බී.එම්.අමිල සම්පත් කුමාර** | **සෞඛ්‍ය කම්කරු** | **2026.07.05** |
| **5.ආර්.එම්.රසික නාමල් රත්නායක** | **රියදුරු** | **2026.07.21** |
| **6.ආර්.එම්.උදිත ෂාණුක දිසානායක** | **රියදුරු** | **2026.07.21** |
| **7.ඩබ්.ඩී.එම්.ඩී.සෝමරත්න** | **පුස්තකාල සහායක** | **2026.08.14** |

**(ඉ). ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). IX දරණ යෝජනාව**

ඊළඟට මා විසින් යෝජනා කරන 6.(ඉ). IX දරණ යෝජනාව_කියවීමේ හා සාහිත්‍ය මාසය වෙනුවෙන් ප්‍රාදේශයේ කලාවට හා සාහිත්‍යයට දායකත්වය සැපයූ බල ප්‍රදේශයේ කලාකරුවන් ඇගයීම හා කියවීමේ මාසය වෙනුවෙන් පුස්තකාල පාඨකයින් සමඟ කරනු ලබන තරඟ වෙනුවෙන් 607-01-ix වැය ශීර්ෂයෙන් රු.350,000.00 ක මුදලින් (ප්‍රතිපාදන වලින්) ඉහත වැඩසටහන් ඉටු කිරීමට 1987 ප්‍රාදේශීය පනතේ 132(ඒ) වගන්තියට ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ඉටු කිරීම සුදුසු බව යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජී.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා

**ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)**

- ප්‍රාදේශීය සභා ගරු උපසභාපති බන්දුල සමරවික්‍රම මහතා ප.ව.12.22 ට පමණ ගරු සභාවට පැමිණියා
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එච්. මාලක අරුණ කුමාර මහතා ප.ව.12.22ට පමණ ගරු සභාවට පැමිණියා
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සි.පි.රංජිත් අබේපාල මහතා ප.ව.12.22 ට පමණ ගරු සභාවට පැමිණියා

සාහිත්‍ය මාසෙ වැඩ සටහන ගැන මන්ත්‍රීවරුන්ගේ දැනුවත්වීම පිලිබඳ විස්තරයක් අවශ්‍යයයි.ඒක ක්‍රියාත්මක කරන ආකාරය පිලිබඳ සභාවට යෝජනාවක් සම්මත වෙන්න ඕන.මේක සාම්ප්‍රදානුකූලව සභාපතිතුමා මූලාසනේ ඉඳලා යෝජනාව ඉදිරිපත් කරාට පස්සෙ මන්ත්‍රීවරු අදහස් පළ කරනවා.ඒක සමහරවෙලාවට විරුද්ධව ප්‍රකාශ කරන්නෙ නෑ. සමහර වෙලාවට වෙන ස්වරූපයෙන් නිකුත් කරනවා.සමහර වෙලාවට විරුද්ධව ප්‍රකාශ කරනවා.සභාපතිතුමා යෝජනාව ඉදිරිපත් කරනවා.ඒක සම්මත වෙනවා. මත විමසීමක් නෑ.සභා වාර්තාවේ වාර්තා වෙනවා ඒකමතිකව සම්මත වෙනවා කියලා.සමහර අයගෙ මතවාද එක පැත්තකට එනවා.සමහර අයගෙ මතවාද වෙන පැත්තකට එනවා. හැබැයි ලේකම්තුමිය මත විමසන්නෙ නෑ. මේක දිගටම වෙන සම්ප්‍රදාය.ඒ හින්දා සභාපතිතුමාගෙන් මං ඉල්ලීමක් කරනවා මතවාදය විමසන්න කියලා.ඊළඟට මම නැවත වතාවක් ඉල්ලීමක් කරනවා ඔබතුමා බොහොම සංවේදී පුද්ගලයෙක්.මේ විදිහට ප්‍රකාශ කරනවිට ලේ කුපිතවීම් සිදු වෙනවා. අද උදෙත් සිද්ධ වුනා. ඔබතුමාගෙ නීතිය හරි. සභාවේ සභාපතිවරයා නොදැනුවත්තව කිසිදෙයක් සභාවේ දේපලක් භාවිතා කරන්න බෑ.ඒක පැහැදිලි කාරණයක්.අවභාවිතා කරන්න බෑ.මන්ත්‍රීවරයකුට යම් විදිහකට අවභාවිතා කරන්නත් බෑ. හැබැයි මේක බොහොම සංවේදී කාරණාවක්.මන්ත්‍රීතුමියගෙන් නොවිමසා ඔබතුමා වාරියපොල පොලිසියේ පැමිනිල්ලක් දැමීම

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත්මහතා ප.ව.12.29 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා

මම දැම්මෙ නෑ මන්ත්‍රීතුමා.ඔබතුමා දන්නවා අදාල නිලධාරියා වග කියන්න ඕන

**ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)**

පැය 24 ක කාලයක් ඉවසීමෙන් ඒ නිලධාරියාට දීලා සාකච්ඡා කරන්නත් තිබුනා.මං බොහොම කාරුණික ඉල්ලීමක් කරනවා මේ සභාව ඇතුලෙ ඔබතුමාගෙ කාලෙත් මගෙ කාලෙත් මේ වගේ එලියට දාන්න බැරි ගද ගහන ප්‍රශ්න තිබුනා.එනිසා දැන් මේ නිශාන්ති මන්ත්‍රීතුමියගෙ තිබ්ච්ච වේදනාව සමනය කරගන්නත් ඒ පැමිණිල්ල ඉල්ලා අස් කරගන්න කියලා ඉල්ලීමක් කරනවා.හැබැයි සභාවෙ කාර්ය භාර්ය ඉෂ්ට කරලා තියනවා.හැබැයි ඉක්මන් වෙලා තියනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.අශෝක හේරත්මහතා ප.ව.12.30 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

බොහොම ස්තූතියි මන්ත්‍රීතුමා. ඔබතුමා කලින් කිව්ව කාරනාව. යෝජනාව ඉදිරිපත් කරාට පස්සෙ ඒක ස්ථිර කරලා.සමහර ඒවා කැමතිනම් විවාද කරනවා.සමහර ඒවා විවාද නොකර ඉන්නවා. සමහර අයට කැමති වෙන්න පුළුවන්. සමහර අයට විරුද්ධ වෙන්න පුළුවන්. ඒක ලේකම්තුමිය විමසන්න ඕන නෑ.මන්ත්‍රීවරයට අයිතියක් තියනවා ඒක කියන්න.ඒ යෝජනාවෙන් යෝජනාවට ඒහෙම කරගෙන යන්නෙ නෑ. දෙවනි කාරණාව මේකෙදි අදාල නිලධාරිනියට සභාවට වගකීමක් තියනවා.එතකොට ඔබතුමා ඔය සදාචාරෙනෙ ඉල්ලා සිටින්නෙ .එතුමියට සදාචාරාත්මක අයිතියක් තියනවා සභාපතිතුමා මෙන්න මෙහෙම ඉල්ලීමක් තියනවා. මම මෙහෙම කරන්නද කියන එක අහන්න.අඩුම තරමෙ ඒ මුකුත් නෑ.තිබ්ච්ච තැනින් අරන් ගිහින් කියපුවාම සභාපතිවරයෙක් වශයෙන් ඔබතුමා ගන්න තීරණේ මට කියන්න වෙනම.මේ මූලාසනේ තියන ගරුත්වය කෙලෙසන්න කිසිම කෙනෙකුට ඉඩ දෙන්නෙ නෑ.

සාහිත්‍ය මාසෙ වැඩ සටහන ප්‍රජා සංවර්ධන කමිටුවට දාලා අනුමත කරලා තියෙන්නෙ .විස්තර ඉදිරිපත් කරන්නම්.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.අශෝක හේරත්මහතා ප.ව.12.32 ට පමණ ගරු සභාවට පැමිණියා
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම් තස්ලිම් මහතාප.ව.12.32 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා

**දළ වියදම් ඇස්තමේන්තුව**

| අනු අංකය | වැඩසටහන | අවශ්‍ය මානව/භෞතික සම්පත් | ඒකකයක මිල රු. | අවශ්‍ය ප්‍රමාණය | වියදම රු. |
|---|---|---|---|---|---|
| 01 | පඩුවස්නුවර බල ප්‍රදේශයේ විසිරි පැතිරි සිටින කලාවට හා සාහිත්‍යයට නන් අයුරින් දායකත්වය සැපයූ දක්ෂතාවයන්ගෙන් පිරිපුන් කලාකරුවන් ඇගයීමේ “**ප්‍රකම්පන සෞන්දර්යාත්මක චාරිකාව 2026**”. | සංගීත කණ්ඩායම සඳහා | | | 15000.00 |
| 02 | | ශබ්ද විකාශන සඳහා | | | 12000.00 |
| 03 | | පසුතල නිර්මාණය සඳහා | | | 10000.00 |
| 04 | | ආලෝකකරණය සඳහා | | | 12000.00 |
| 05 | | ඇගයීම්ලාභීන් සඳහා සමරු තිළිණ සහ ත්‍යාග සඳහා | 7500.00 | 30 | 225000.00 |
| 06 | | ශිල්පීන් සඳහා දිවා ආහාරය | 600.00 | 05 | 3000.00 |
| 07 | | ශිල්පීන්,විශේෂ අමුත්තන්,අනෙකුත් කලාකරුවන් සහ කාර්යාලයේ නිලධාරීන් සඳහා සංග්‍රහ කටයුතු | 150.00 | 200 | 30000.00 |
| 08 | කියවීමේ මාසය වෙනුවෙන් පුස්තකාල පාඨක සමාජ එක්ව පවත්වනු ලබන “**කියවමු දිනමු**” ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන | “**කියවමු දිනමු**” ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනෙන් අවසන් වටයේ දිනන දරුවන් සඳහා<br>1.ශූරතාවය වෙනුවෙන්<br>2.අනුශූරතාවය වෙනුවෙන් | | | 10000.00<br>7500.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 09 | | පාඨක සමාජ තරග විනිශ්චය සඳහා විනිශ්චය ගාස්තු | 3000.00 | 03 | 9000.00 |
| 10 | | විනිශ්චය මණ්ඩලයට,පාඨක සමාජ තරඟකරුවන්,පුස්තකාල කාර්ය මණ්ඩලය සහ අනෙකුත් නිලධාරින්ට උදැසන සංග්‍රහ සඳහා සැහැල්ලු ආහාර සමග තේ | 150.00 | 60 | 9000.00 |
| 11 | | ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන සඳහා සහභාගි වන සියළු පාඨකයින් සඳහා සහතික පත්‍ර (එක් පුස්තකාලයකින් 5 බැගින් පුස්තකාල 7) | 100.00 | 35 | 3500.00 |
| 12 | | වෙනත් අවශ්‍යතා සඳහා | | | 4000.00 |
| **එකතුව** | | | | | **350000.00** |

**ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)**

සභාපතිතුමා මේ යෝජනාවේ කළා කරුවන් පිලිබඳ ඇගයීමට ගොක්කොල කලාව, කවි කියන අය විවිධ ක්ෂේත්‍ර කලාකරුවො, නැට්ටුවො තෝරගත්ත අය ගෙනාවෙ. හැබැයි මේ කලාකරුවො තෝර ගන්න කොට ග්‍රාම නිලධාරී කොට්ඨාශ 103 කින් තොරගන්නෙ 30යි. තිලිනය ප්‍රදානය කරනවා රු.7,500.00.ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් තොරතුරු අරගෙන මේ කලාකරුවො තෝර ගත්ත නම් වඩා වැදගත්.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත්මහතා ප.ව.12.34 ට පමණ ගරු සභාවට පැමිණියා
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම් තස්ලීම් මහතාප.ව.12.34 ට පමණ ගරු සභාවට පැමිණියා

මන්ත්‍රිතුමා වියදම් වාර්තාව විතරයි මං කියෙව්වෙ.ඉතිරි ටික මං කියවන්නම්.එතකොට ඔබතුමාගෙ ගැටළුව විසඳෙනවා.

**සාහිත්‍ය මාසය වෙනුවෙන් ප්‍රදේශයේ කලාකරුවන් ඇගයීමේ "ප්‍රාසාත්මක සංගීත වැඩසටහන" සහ පුස්තකාල පාඨක සමාජ එක්ව පවත්වනු ලබන "කියවමු දිනමු" ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන 2026**

**හැදින්වීම**

1.පොහොසත් රටක් ලස්සන ජීවිතයක් ශාක්ෂාත් කරගැනීම උදෙසා පඩුවස්නුවර බල ප්‍රදේශයේ විසිරී පැතිරී සිටින කලාවට හා සාහිත්‍යයට නන් අයුරින් දායකත්වය සැපයූ දක්ෂතාවයන්ගෙන් පිරිපුන් කලාකරුවන් ඇගයීමේ ප්‍රකම්පන සෞන්දර්යාත්මක චාරිකාව 2026.
2.පුස්තකාල සේවාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් තරග පැවැත්වීම.

**ඇගයීමට ලක්කිරීමට අපේක්ෂිත කලාකරුවන්**

1.ලේඛකයින්
2.ගීත රචකයින්
3.ප්‍රවීන ගුරු උපදේශකවරු(සංගීත,නැටුම්,නාට්‍ය හා රංගකලාව)
4.කලා කේෂ්ත්‍රයේ ජාතික මට්ටමින් දක්ෂතාවයන් දැක්වූ පාසල් දරුවන්
5.ජාතික මට්ටමින් විවිධ ප්‍රසිද්ධ රූපවාහිනී නාලිකා ඔස්සේ ගායනයෙන් සහ නර්ථනයෙන් දායකත්වය සැපයූ පාසල් හැරගිය දරුවන්

**තරග පැවැත්වීම සඳහා අපේක්ෂිත ඉලක්ක කණ්ඩායම්**

බල ප්‍රදේශයේ සියළු පුස්තකාල ආවරනය වන පරිදි 7,8,9 ශ්‍රේණිවල පාඨකයින්

**අරමුණ**

1.මේ වන විට කලා ක්ෂේත්‍රයට විවිධ අයුරින් දක්ෂතාවය දක්වා හුදකලාවේ සිටින කලා පිරිස ඒකරාශී කොට ඔවුන්ගේ හැකියාවන් එළි දැක්වීම හා ඔවුන්ව ඇගයීමට ලක්කොට ඔවුන් තෘප්තිමත් කිරීම.

2. පුස්තකාල සේවාව ප්‍රවර්ධනය කිරීම.

**ඉක්ක කණ්ඩායම තෝරාගන්නා ආකාරය (කලාකරුවන් ඇගයීම සඳහා)**

1.පලමුව කලාකරුවන් පිලිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගැනීම

2.එම ලබාගන්නා තොරතුරු වලට අනුව ප්‍රාදේශීය සභාව විසින් සකස් කරන ලද ,ප්‍රාදේශීය ලේකම් විසින් නිවැරදි බවට සහතික කරන ලද අයදුම් පතක් මගින් අපේක්ෂිත කුසලතා සම්පූර්ණ වී ඇද්දැයි පරීක්ෂා කිරීම.

3.පුස්තකාල උපදේශන කමිටුව හා වෙනත් විශේෂිත කමිටුවක් ඇසුරෙන් සුදුසුම කලා ශිල්පීන් නැගෙනහිර බල ප්‍රදේශයෙන් 10 ක් හා බටහිර බල ප්‍රදේශයෙන් 15ක් තෝරා ගැනීම.

**ඉලක්ක කණ්ඩායම තෝරාගන්නා ආකාරය (පුස්තකාල තරග පැවැත්වීම)**

1. බල ප්‍රදේශයේ සියළු පුස්තකාල ආවරනය වන පරිදි 7,8,9 ශ්‍රේණිවල පාඨකයින් මගින්

දැන් මේකට ඇත්තටම අපි යෝජනා ගත්තෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා නාම ලේඛනවලට අනුව අප විශේෂ කලා මණ්ඩලයක් පත් කරලා ඒ කලා මණ්ඩලය හරහා තමයි තීරණය කරන්නෙ මේ ඇගයීමට ලක් කරන 30 දෙනා කව්ද කියලා තොරගන්නෙ.මොකද මන්ත්‍රිවරු තොරන්න ගියොත් ඒක පාර්ශ්වික වෙනවා.හිතවතුන්ට බෙදන්න සිද්ධ වෙනවා ඇත්තටම ඕන ඇත්ත කලාකාරයා ඇගයීමට ලක් කිරීම.ඒ නිසා ඒ වැඩසටහන තමයි හදලා තියෙන්නෙ. පඩුවස්නුවර නැගෙනහිරින් හා බටහිරින් නාම ලේඛණ එවලා තියනවා අපිට.කව්ද කලාකාරයො කියලා ඔය ග්‍රාම සේවකවසම් 103 ටම අදාලව.ඊළඟ කාරනාව තමයි. මේ සම්බන්ධව මූලික සාකච්ඡාව හැම ක්ෂෙත්‍රයටම අදාල කලාකරුවො 9 දෙනෙක් එකතු තරගෙන එයාලගේ මූලික අදහස් ගත්තා මේ වැඩසටහන කොහෙමෙද පවත්වන්න ඕන කියන එක කියලා.එතකොට ඒ ගොල්ලොන්ගෙත් අදහස් එක්ක තමයි මේ වැඩසටහන ඉස්සරහට යන්නෙ.එතකොට සමහරවිට අපිට ඉස්සරහට වෙයි ඇත්තටම මේ කලාකාරයො කිව්වා මෙන්න මෙහෙම අපි ජීවිත කාලයක් තිස්සෙ කලාව කරනවා. ආර්ථිකය විසින් අපිට ලොකු ප්‍රතිලාභ අත්වෙලා නෑ.මගෙන් ඇහුවා ඔබතුමාලා දෙන්න බලාපොරොත්තු වෙන්නෙ මොනවද කියලා.මං කිව්වා සම්මානයක් වගේ එකක් දෙන්න තමයි හිතාගෙන ඉන්නෙ කියලා.ගත් කටටම කිව්වා අපිට ඔය ලී පතුරු වලින් වැඩක් නෑ කියලා.එතුමලා කියනවා පොඩි ආර්ථික වටිනාකමක් තියන මොනවා හරි දුන්නොත් අපිටඒක හරි සතුටු වෙන්න ඉඩකඩක් තියනවා කියලා.ඒක හින්දා ඇත්තටම ආර්ථික වටිනාකමක් දෙන්න මුදල් ප්‍රමාණයක් මේ සඳහා වෙන් කරලා නෑ.අපි උත්සාහ කරනවා ප්‍රදේශයේ කලාකරුවන්ට උදව් උපකාර කරන අය ඉන්නවා.ඒ අයගෙන් උදව් අරගෙන තව මීට වඩා වැඩි යමක් මේ ගොල්ලන්ට දෙන්න පුළුවන්ද කියලා උත්සාහ කරනවා ඕක තමයි කාරනාව. ඔබතුමා ඔය බලාපොරොත්තු වුන වැඩසටහන ඒ විදිහට ඊටත් වඩා හොඳින් සූදානම් කරලා තියනවා.

**ඒ අනුව කියවීමේ හා සාහිත්‍ය මාසය වෙනුවෙන් ප්‍රාදේශයේ කලාවට හා සාහිත්‍යයට දායකත්වය සැපයූ බල ප්‍රදේශයේ කලාකරුවන් ඇගයීම හා කියවීමේ මාසය වෙනුවෙන් පුස්තකාල පාඨකයින් සමඟ කරනු ලබන තරඟ වෙනුවෙන් 607-01-ix වැය ශීර්ෂයෙන් රු.350,000.00 ක මුදලින් (ප්‍රතිපාදන වලින්) ඉහත වැඩසටහන් ඉටු කිරීමට 1987 ප්‍රාදේශීය පනතේ 132(ඒ) වගන්තියට ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ඉටු කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**(ඉ) <u>X. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). X දරණ යෝජනාව</u>**

ඊළඟට මා විසින් යෝජනා කරන 6.(ඉ). X දරණ යෝජනාව_පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල දියුණුගම් ප්‍රදේශයේ කුලියාපිටිය පාර දකුණ පිහිටි වරිපනම් බදු දේපල අංක 08 දරණ දේපල සඳහා බිල් කිරීම 2023 වර්ෂයේ ජනවාරි මස සිට නතර කර ඇති බැවින් හා 2025 වර්ෂයේ තක්සේරු වීමක් සිදු වී නොමැති බැවින් 2023 වර්ෂයේ සිට එම දේපල සඳහා වන ඉදිරි ලැබීම් 0.10 ක මුදල සභා අරමුදලට බැර කිරීම සුදුසු බව යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

මේ ඉඩමේ වරිපනම් ගෙවන එක 2023 නතර වෙලා තියනවා.එතකොට දැන් ඉඩම කොහෙද කියන එකත් පොඩ්ඩක් හොයලා බලන්න ඕන.ඉඩම කුලියාපිටිය පාරේ ප්‍රාදේශීය සභායත් ඒජීඒ ඔෆිස් එකත් අතර කියලා තමයි කියන්නෙ.නමුත් දැන් ප්‍රශ්නෙ තියෙන්නෙ වරිපනම් බදු ගෙවන එක නතර වෙලා තියනවා.හැබැයි මේ බිල් කරපු ශත 10 ක් තියෙනවා. ඒක හැමවිටම දිගටම එනවා.විගණනයට ප්‍රශ්නයක්.ඒ ශත 10 සභා අරමුදලට බැර කරන්න කියන යෝජනාව තමයි මම කරන්නේ ඒක සම්මත කරලා දෙන්න.

**ඒ පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල දියුණුගම් ප්‍රදේශයේ කුලියාපිටිය පාර දකුණ පිහිටි වරිපනම් බදු දේපල අංක 08 දරණ දේපල සඳහා බිල් කිරීම 2023 වර්ෂයේ ජනවාරි මස සිට නතර කර ඇති බැවින් හා 2025 වර්ෂයේ තක්සේරු වීමක් සිදු වී නොමැති බැවින් 2023 වර්ෂයේ සිට එම දේපල සඳහා වන ඉදිරි ලැබීම් 0.10 ක මුදල සභා අරමුදලට බැර කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**(ඉ) <u>XI. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XI දරණ යෝජනාව</u>**

මීළගට මා විසින් ගෙනෙන විශේෂ යෝජනාව .පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2025දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) වගන්තිය සමඟ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව විගණණය කරනලදි. ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2025.දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් විගණනය විසින් ඉදිරිපත් කළ තත්ත්වාගණණය කළ මතය පිළිගැනීම සුදුසු බව යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී එම්.ජී.මංජුල ප්‍රසන්න මංජුල මල්ලව ආරච්චි මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.සමරසිංහ කිර්ති බංඩාර හේරත්මහතා ප.ව.12.37 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) වගන්තිය සමඟ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විදිවිධාන ප්‍රකාරව විගණණය කරනලද පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් විගණනය විසින් ඉදිරිපත් කළ තත්ත්වාගණණය කළ මතය පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**(ඉ) <u>XII. ගරු මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XII දරණ යෝජනාව</u>**

පද්මලාල් දොලවත්ත මන්ත්‍රිතුමා ඉදිරිපත් කරපු කොටොම්පිටිය මුස්ලිම් සුසාන භූමිය පිළිබඳ කරන විශේෂ යෝජනාව.

**<u>ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මහතා - (ශ්‍රී.ල.පො.පෙ)</u>**

ගරු මන්ත්‍රිතුමා විසින් ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා

**<u>ගරු මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා</u>**

ඇත්තටම මම මේ කාරණාව ඉදිරිපත් කරන්නෙ මට අදාල ප්‍රදේශයේ මුස්ලිම් ප්‍රජාව නියෝජනය කරන කීප දෙනෙක් මා එක්ක කිව්වා මේක මේ රාත්‍රියේ භූමදාන කටයුතු කිරීමට සිදුවන අවස්ථා තිබෙනවා කියලා.එතකොට දැනට තියෙන තත්වෙත් එක්ක ඒ සුසාන භූමිය, පැති බැම්ම කඩාගෙන වැටිලා විශාල ගහක් තියනවා, විදුලිය නෑ.හැබැයි මං මේක සභාවට ඉදිරිපත් කරන්න කලින් සභාපතිතුමාගෙන් අහද්දි මට දැනගන්න ලැබුනා.මේක සභාවට අයිතියක් නැතිබව මගේ අදහස මේ අවස්ථාවේදී මුස්ලිම් ප්‍රජාව වෙනුවෙන් කළ හැකි දෙයක් තියනවද එහෙම නැත්තම් සභාවට පවරාගෙනද අනිවාර්යයෙන් කටයුතු කළ හැක්කේ .ඒ දක්වා දුරට මේක රැගෙන යනවද? අපිට ඊට ප්‍රථම යම්කිසි සහයෝගයක් දෙන්න පුළුවන්ද. ගහ කපලා ලයිට් එකක් දාලා දෙන්න පුළුවන්ද? බැරිම නම් ලයිට් එකක්දාලා දෙන්න.මොකද ඔතන සභාවට පවරගන්නවනම් ලයිට් එකක් දාලා දෙන්න අපහසුද කියලා මම දන්නෙ නෑ හරියට.එතකොට අපිට ලයිට් එකක් දාලා දෙන්න පුළුවන්නම් ඒ සම්බන්ධයෙන්වත් උත්සාහයක් දරන ලෙස සභාපතිතුමාගෙන් මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩී.එම්. ජයන්ත දිසානායක මහතා ප.ව.12.39 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.සමරසිංහ කිර්ති බංඩාර හේරත්මහතා ප.ව.12.40 ට පමණ ගරු සභාවට පැමිණියා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ඒ.රංජිත් නවරත්න මහතා ප.ව.12.41 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා

__ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)__

ගරු සභාපතිතුමනි, මේ පිලිබඳ ඉල්ලීමක් තිබ්බා මීට කලින් දොලවත්ත මන්ත්‍රීතුමා ඉතාමත් වැදගත් යෝජනාවක් ඉදිරිපත් කලේ. මං හිතන්නේ හෙට්ටිපොල කොට්ඨාශෙ මේ ප්‍රධාන නගරේ කොටොම්පිටිය උප නගරයේ මුස්ලිම් ප්‍රජාවගේ භූමදානය කරන ස්ථානය අපේ බෞද්ධ ජනතාව වගේ නෙමේ මුස්ලිම් අය බොහෝදුරට රාත්‍රියේ තමයි ඒ කටයුත්ත කරන්නෙ ඒ නිසා එතුමා කිව්වා වගේ නගරයේ ආසන්නයේම තමා මේ සුසාන භූමිය තියෙන්නෙ.එතකොට ඒ කටයුත්ත කරන්න ඒ දේහ භමදානය කරද්දි ඉතාම අපහසුතාවයට ලක්වෙනවා අපි දැකලා තියනවා.රාත්‍රි කාලයේදී ඒ හරියෙ අඳුරු ප්‍රදේශයක් .ප්‍රධාන මාර්ගෙ මාවිඇල මාර්ගෙ තියෙන්නෙ නමුත් මෙතුමා කිව්වා වගේ සභාවට අයිති නැත්තම් එතුමන්ලගෙන් ඉල්ලීමක් කරලා සභාවට පවරගෙන හරි ඒ භූමිය අපි විශේෂයෙන්ම එතුමන්ලා වෙනුවෙන් ඒක ඉෂ්ට සිද්ධ කරන්න කියලා සභාපතිතුමාගෙන් ඉල්ලනවා. ඇත්ත වශයෙන්ම එතන තියනවා ලයිට් කණුවක් අතුරු මාර්ගයක් තියනවා.ඒ අතුරු මාර්ගෙ තියනවා ලයිට් ගිය පාරක් ඒකෙ කණු දෙකකට රාත්‍රි කාලයට ආලෝකය ලැබෙන විදිහට වීදි පහනක් හෝ දාලා ඒක ඉෂ්ට කරලා දෙන එක සුදුසුයි. අපි වගේ නෙමේ මුස්ලිම් ජනතාව විශාල වශයෙන් රාත්‍රි කාලයේ තමා ඔය භූමදාන කටයුතු කරන්නෙ .ඉතාම කාලෝචිත යෝජනාවක් විදිහට එතුමගෙ යෝජනාව ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන්න කියලා මං ඉල්ලීමක් කරනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.ඩී.ඉෂාන් මධුශංක පිරිස් මහතා ප.ව.12.42 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ඒ.රංජිත් නවරත්න මහතා ප.ව.12.43 ට පමණ ගරු සභාවට පැමිණියා

__ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා__

බොහොම ස්තුතියි මන්ත්‍රීතුමන්ලට දොලවත්ත මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව අනුව දිටීවා සුළි කුනාටුව වෙලාවෙ මේ සුසාන භූමියේ බැදලා තිබ්බ බැම්ම කඩාගෙන වැටුනා .වැටත් එක්ක කඩාගෙන වැටුනෙ.ඒ වෙලාවෙ කොටොම්පිටියෙ තරුණ පිරිස මාත් එක්ක ගියා ගිහින් බැලුවා.පලවෙනි තත්වය තමයි මේ සුසාන භූමිය පවරලා නෑ.දෙවනි එක මේ ඉඩම තියෙන්නෙ පුද්ගලිකව.එනිසා පළමුකොටම සභාවට වියදම් කරන්න බෑ.සභාව සතු නොවූ භූමියක සංවර්ධන වැඩ කටයුතු කරන්න බෑ.ඒ නිසා පුළුවන්නම් මේක සභාවට පවරන්න කටයුතු කරන්න.ඉතින් අපි ඔවුන්ට කියමු මේක සභාවට පවරගන්න කටයුතු කරන්න කියලා.අඩුම තරමෙ සභාවෙ මුදල් වියදම් නොකර වෙනත් ප්‍රතිපාදන වලින් ක්‍රියාත්මක කරන්නම් එක්කෝ ප්‍රාදේශිය ලේකම් සතු වෙන්න ඕන.එක්කො ප්‍රාදේශීය සභාව සතු වෙන්න ඕන ඒකෙත් අර බැම්ම බැදගන්න ව්‍යාපාරික ප්‍රජාවගෙන් උදව් ඉල්ලගෙන හරි මේ වැඩේ කරමු කියන එක තමයි යෝජනා කලේ.ඒ නිසා පුළුවන්නම් මැදිහත් වෙන්න කියලා.ඊළඟ කාරනාව තමයි අපේ තාක්ෂණ නිලධාරී මහත්වරු දැනුවත් කලේ මේ සුසාන භූමිය හදලා තියෙන්නෙ පොළොව මට්ටමට උස්සලා.තාප්ප බැදලා.තාප්ප වලින් පස් පුරවලා තියෙන්නෙ පොලොව මට්ටමෙන් උඩ.දැන් සිද්ධ වෙන්නෙ භූමදානය කරන්න කරන්න පීඩනයක් සිද්ධ වෙනවා අර වටේ තියන තාප්ප වලට.ඒ නිසා ඒකට ගැලපෙන තාප්ප බදින්නත් වෙනවා.ඒ මොනවා කරන්නත් අපිට වියදම් කරන්නනම් අර වැඩේ කරන්න ඕන.වීදි පහන් වලින් ආලෝකකරණ වැඩේට අපි මැදිහත් වෙමු.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩී.එම්. ජයන්ත දිසානායක මහතා ප.ව.12.44 ට පමණ ගරු සභාවට පැමිණියා
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.ඩී.ඉෂාන් මධුශංක පිරිස් මහතා ප.ව.12.45 ට පමණ ගරු සභාවට පැමිණියා

__ගරු මන්ත්‍රීනී ආර්. එම්. නිලන්ති විජේසිංහ මහත්මිය - ( ස.ජ.බ)__

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය,ලේකම්තුමිය ප්‍රධාන කාර්යමණ්ඩලයෙන් අවසරයි.සුසාන භූමි යෝජනාව සම්බන්ධව මටත් තියනවා යම් කාරණයක් කියන්න.අපේ අඹගහලන්ද සුසාන භූමිය මැනිම් කටයුත් සම්බන්ධව ප්‍රාදේශීය ලේකම්තුමියට ලිපියක් දුන්නා ඒ සම්බන්ධව කිසිදු තොරතුරක් නෑ අදටත් එම ඉඩමසභාවට පවර ගන්න මැනිම් වැඩ කටයුතු කොහොමද කරලා දෙන්නෙ කියලා.

__ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා__

ඔබතුමිය ඒක යෝජනාවක් විදිහට දෙන්න

**ඒ අනුව පද්මලාල් දොලවත්ත මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කොටොම්පිටිය මුස්ලිම් සුසාන භූමිය පිලිබඳ යෝජනාවේ වීදි පහන් වලින් ආලෝකකරණ ඉටු කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**(ඉ) __XIII. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XIII දරණ යෝජනාව__**

මීළගට මා විසින් ගෙනෙන විශේෂ යෝජනාව .පඩුවස්නුවර ප්‍රාදේශිය සතු ගැසට් නොවූ මාර්ග (ඉතිරි මාර්ග) ගැසට් කිරීම සුදුසු බවට යෝජනාව කරනවා..

**ගැසට් කිරීමට ඇති මාර්ග ලැයිස්තුව -2026.06.09 මහ සබාව**

1. හිඳව ග්‍රා.නි. වසමේ කිරිමැටියාව ශ්‍රී සුමනසාර ජාතික පාසල ඉදිරිපිටින් අඩි 200 ක් දුර මාර්ගය -වසම කිරිමැටියාව
2. අඩුක්කනේ ගම මැද මාර්ගය (වැව අසලින් ගමට පිවිසෙන මාර්ගය) - වසම කිරිමැටියාව
3. පහල ගොමුගොමුව මාර්ගයේ අනිල් වඩුගෙදර මහතාගේ නිවස ඉදිරිපිටින් ඇති මාර්ගය - වසම ගොමුගොමුව
4. ඉහළගොමුගොමුව සෙන්ට්‍රිවත්ත මාර්ගය - වසම ගොමුගොමුව
5. පහළ ගොමුගොමුව මූණමල්දෙණිය දංගොල්ලවත්තේ සිට අළුත් බැම්මට යන මාර්ගය - වසම ගොමුගොමුව
6. මූණමල්දෙණිය පහළගොමුගොමුව ,පංසල පාර- වසම ගොමුගොමුව
7. නඟුල්මුන්න මංසන්ධියේ සිට කනෝගම දක්වා මාර්ගයේ උළු කඩේ අසලින් ආරම්භ ව එස්.ඒ සුදර්ශනී යන අයගේ නිවස දක්වා මාර්ගය-වසම තිස්සව
8. වඩුවන එම්.ඒ රුමන් මහතාගේ නිවස ඉදිරිපිට සිට ආරියසේන මහතාගේ නිවස දක්වා වූ මාර්ගය -වසම මොරගොල්ල
9. ඇපලදෙණිය බෝධිමුල්ල ප්‍රධාන මාර්ගයේ ඇපලදෙණිය රතු ගේට්ටුව වත්ත ඉදිරියෙන් කොහොඹගහ අසලින් දිවෙන 400 m ක් දුර මාර්ගය -වසම ඇපලදෙණිය
10. ලේනපැලැස්ස සිට බැද්දේගමට යන මාර්ගයේ අයි.එම්.රණසිංහ මහතාගේ නිවස අසල සිට පන්සල් ඉඩම දෙසට යන මාර්ගය -වසම බැද්දේගම
11. දුම්මුලුවාව බස්නායක මහතාගේ නිවස අසල සිට කන්ද දෙසට යන මාර්ගය -වසම නෙලිබෑව
12. මූණමල්දෙණිය කටුපොත මාර්ගයේ නාලක මහතාගේ වීමෝල අසල ඇති මාර්ගයේ කුඹුර දෙසට ඉතිරි කොටස
13. දෙමටගොල්ල සරත් මහතාගේ කඩය අසල සිට හල්මිල්ල කොටුව දක්වා දිවෙන මාර්ගය
14. විජය උදාගම විත්ත විවේකාරාමය මෙහෙනි ආරාමය දෙසට මාර්ගය
15. රඹෑවැව කටුපොත 2 වන පටුමඟ මාර්ගය- වසම ගල්ලැහැපිටිය
16. බණ්ඩාරකොස්වත්ත සතිපොළ අසල ඇති ළිඳට පිවිසුම් මාර්ගය - වසම බණ්ඩාරකොස්වත්ත

**ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා

**ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)**

ගරු සභාපතිතුමා පාරවල් පවරගන්න කියලා ඉල්ලීමක් කළාම තාක්ෂණ නිලධාරීන් මේ මාර්ගයක් නම් කරන්න කියලා ඉල්ලීමක් කළාම අග සිට මුලට දෙපස ඉන්න නිවෙස් හිමියන්ගෙන් ලිපියක් ගන්න ඕන. අඩි 8 තියන පාර සමහර තැන්වල අඩි 6 වෙන්න පුළුවන් 7 වෙන්න පුළුවන් 10 වෙන්න පුළුවන්.අඩි 10 පාරක් මේ සභාවට පවර ගන්න ඉල්ලීමක් කරාට පස්සෙ අග සිට මුලට සියළුම නිවෙස් හිමියන් ලිපියක් සභාවට දෙන්න ඕන.ඊළගට කාර්මික සේවා මහතා විසින් වාර්තාවක් දෙන්න ඕන කිසි ගැටළුවක් නෑ කියලා.එහෙම වාර්තාවක් ගත්තහම තමයි සභා සම්මත කරලා පාරක් ගැසට් කරන්න පුළුවන් වෙන්නෙ.එහෙම නැතිව අපි මේ සම්මත කරගත්තයි කියලා ගැසට් කරන්න බෑ.ඒකෙ දිග පළල ඊට පස්සෙ නිවෙස් හිමියන්ගෙ කැමැත්ත ඒ සියල්ල ඇතුලත්ව තමයි පාර ගැසට් කරන්න ඕන.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

එහෙම වෙනවා මන්ත්‍රීතුමා. තාක්ෂණ නිලධාරීන් විසින් පරීක්ෂා කරාට පස්සෙ තමයි පාර ගැසට් කරන්නෙ.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශිය සතු ගැසට් නොවූ මාර්ග (ඉතිරි මාර්ග) ගැසට් කිරීම සුදුසු බවට යෝජනාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ. එම්. නන්දසිරි මහතා ප.ව.12.51 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

**ඉ) XIV . ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XIV දරණ යෝජනාව**

මීළගට මා විසින් ගෙනෙන විශේෂ යෝජනාව දිට්වා සුළි කුණාටුවෙන් හානියට පත් පලාත් පාලන මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම- 2026 පළමු අදියර යටතේ ඇමුනුමෙහි සඳහන් පලාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අනුමත වී ඇති මාර්ග 23 ටෙන්ඩර් හෝ අනුමත සමිති මගින් ගිවිසුම්ගතව සිදු කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**දිට්වා සුළි කුණාටුවෙන් හානියට පත් පළාත් පාලන මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම -2026**

**මහසභා අනුමැතිය ලබා ගැනීම**

| අනු අංකය | මාර්ගයේ නම | ඇස්තමේන්තු වටිනාකම |
|---|---|---|
| 1 | බණ්ඩාර කොස්වත්ත හම්මාලිය සිට උඩකඩවල දක්වා මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම | 4,000,000.00 |
| 2 | පලුගස්වැව නල්ලූර මහවැව වානේ සිට අක්කරයාය මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | 5,000,000.00 |
| 3 | බණ්ඩාරකොස්වත්ත වෙලගෙදර ගම මැද මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | 4,000,000.00 |
| 4 | බුළුගහමුල හන්දියේ සිට මැදගම දක්වා මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | 4,000,000.00 |
| 5 | බමුණුමුල්ල මැල්වත්ත මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | 5,000,000.00 |
| 6 | ඇපලදෙණිය දල්ලන්ද වෙල මැද මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | 3,000,000.00 |
| 7 | පහල නෙලිබැව දෙමටව මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | 3,000,000.00 |
| 8 | ඉහල ගොමුගොමුව ජයකොඩිවත්ත අතුරු මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | 3,000,000.00 |
| 9 | දෙල්අත්තාගාර පන්සල් මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | 3,000,000.00 |
| 10 | දහනෙගෙදර හොරොම්බුව වෙල මැද මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | 2,000,000.00 |
| 11 | කොටඹපිටිය වැව මැල්වත්ත මාර්ගයේ වැව් වාන සංවර්ධනය කිරීම(කොන්ක්‍රීට්) | 2,000,000.00 |
| 12 | අඹගහගෙදර කුරිහේන මිණිපිටිය මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | 2,000,000.00 |
| 13 | ටැකැව පන්සල අසල සිට උඩදෙණිකොටුව වැව දක්වා මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | 3,000,000.00 |
| 14 | විල්බාගෙදර ගොඩවිටිගෙදර මාර්ගය තාර දමා සංවර්ධනය | 3,000,000.00 |
| 15 | ඇඹෝගෙදර වැව මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | 2,000,000.00 |
| 16 | අඹගහගෙදර ගම මැද මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | 2,000,000.00 |
| 17 | කොටඹපිටිය වැව මැල්වත්ත මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | 5,000,000.00 |
| 18 | මගුලාගම පන්සල මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | 3,000,000.00 |
| 19 | ඉහල ගොමුගොමුව වේරුවත්ත මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | 3,000,000.00 |
| 20 | කඩවලගෙදර බස්නායක මහතාගේ නිවස සිට වෙල් යාය දක්වා මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | 3,000,000.00 |
| 21 | පහල රඳව කන්ද මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | 3,000,000.00 |
| 22 | බණ්ඩාරකොස්වත්ත මිදියාල සමිති ශාලාව දක්වා මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම | 5,000,000.00 |

| | | |
|---|---|---|
| 23 | මඩිහ මිදියාල උගුරැස්සාගම අරාබි විද්‍යාලය දක්වා මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම | 5,000,000.00 |
| | එකතුව | **77,000,000.00** |

**<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

තව ඉස්සරහට යෝජනාවලට අනුව මුදල් වෙන් වෙනවා.හැම කොට්ඨාශයක්ම ආවරණය වෙන්න පළාත් නිශ්චිත මුදල් වලින් .මේකෙ කලින් තිබුනනෙ අර කර්මාන්ත කරන්න සමිති සඳහා ලක්ෂ 20 යි කියලා. හැබැයි දැන් දිථිවා යටතේ චක්‍රලේඛය ඇවිල්ලා තියනවා ලක්ෂ 50 දක්වා දෙන්න පුළුවන් කියලා. ඒ නිසා අනුමත සමිති යටතේ මේ කර්මාන්ත ටික කරන්න යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>**

පලාත් නිශ්චිත ඇතුලෙ ඇවිල්ලා තියෙන්නෙ දිථිවා.දිථිවා කුණාටුව යටතේ මාර්ග සියල්ලම විනාශ වුනේ නෑ. දැන් ඔබතුමා හදන්න තියන මාර්ග දිථිවා එක යටතේ හදන්න තියෙන ඒවා නෙමේ.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

මේ මුදල් වෙන් කරලා තියෙන්නෙ දිථිවා යටතේ තමයි. එතකොට බාදාවක් නෑ.

**<u>ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමනි මට විනාඩියක් අවසර දෙන්න.මෙතුමන්ලා මේක විවේචනය කරාට දිථිවා යටතේ අපි පාරවල් 108 ක් හැදුවා.විවේචනය මුල ඉඳන්ම කරා.ඒ ගැන මම සතුටු වෙනවා.එතුමන්ලගෙ විවේචනය ගැන කණගාටු වෙනවා .ඔබතුමාලත් මේ තත්වයට පත්වෙන්න මේ වැඩේ කරන්න ඉඩ දෙන්න.

**<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)</u>**

ලක්ෂ 50 වෙනකම් සමිති වලින් කරන්න පුළුවන් කියලා කිව්වනෙ.සමිතිවලට මූල්‍ය හැකියාව තියෙන්න ඕනිනෙ.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

අනුමත හැකියා සහතිකය බලලා තමයි මේකට අවස්ථාව දෙන්නෙ

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්. එම්. උපුල් නිශාන්ත මහතා ප.ව.12.52 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ. එම්. නන්දසිරි මහතා ප.ව.12.53 ට පමණ ගරු සභාවට පැමිණියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්. එම්. උපුල් නිශාන්ත මහතා ප.ව.12.52 ට පමණ ගරු සභාවට පැමිණියා.

**ඒ අනුව දිථිවා සුළි කුණාටුවෙන් හානියට පත් පලාත් පාලන මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම- 2026 පළමු අදියර යටතේ ඇමුනුමෙහි සඳහන් පලාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අනුමත වී ඇති මාර්ග 23 ටෙන්ඩර් හෝ අනුමත සමිති මඟින් ගිවිසුම්ගතව සිදු කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**ඉ) <u>XV . ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XV දරණ යෝජනාව</u>**

මීළගට මා විසින් ගෙනෙන විශේෂ යෝජනාව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2026.05.27 දින පැවැති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ තීරණ අංක 07 යටතේ,පහත වාහන වල අයකරන මිලගණන් , වර්තමානයේ වැඩිවන ඉන්ධන මිලගණන් වැඩිවීම සමඟ නොගැලපෙන බැවින් පහත පරිදි ගාස්තු අයකිරිමට යෝජනා කරමි.

| යන්ත්‍රය | පවතින මිල ගණන් | කමිටු තීරණය |
|---|---|---|
| මාර්ග තලනය යන්ත්‍රය | පැය 03 සඳහා රු. 13800.00 | 16390.00 |
| මෝටර් ග්‍රේඩරය | පැය 03 සඳහා රු. 27300.00 | 32,940.00 |
| බැකෝලෝඩරය | පැය 03 ක් සඳහා රු. 18600.00 | 22,915.00 |
| ටිපර් රථය | ප්‍රවාහනය පළමු කි.මී.01 සදහා රු.500.00<br>වැඩිවන කි.මී. 01 ක් සඳහා රු.190.00 | ප්‍රවාහනය පළමු කි.මී.01 සදහා රු.565.00<br>වැඩිවන කි.මී. 01 ක් සඳහා රු.224.00 |

| | | |
|---|---|---|
| ඩුම්ට්‍රක් රථය | ප්‍රවාහනය පළමු කි.මී.01 ක් සඳහා රු.850.00<br>වැඩිවන සෑම කි.මී. 01 ක් සඳහා රු.380.00 බැගින් අයකරනු ලැබේ | 960.00<br>වැඩිවන සෑම කි.මී. 01 ක් සඳහා රු.443.00 බැගින් අයකරනු ලැබේ |
| ගලි බවුසරය (ප්‍රා දේශිය **සභා බලප්‍රෙද්ශය තුළ)**<br><br>• නේවාසික ඒකකයක් හා රාජය ආයතන සඳහා<br>• ව්‍යාපාරික ඒකකයක් ස්ථානයක්<br>• ආගමික ස්ථාන සඳහා<br><br>**ගලිබවුසරය (ප්‍රා දේශිය බල ප්‍රෙද්ශයෙන් පිටත**<br><br>• නේවාසික ඒකකයක් හා රාජය ආයතන සඳහා<br>• ව්‍යාපාරික ඒකකයක් ස්ථානයක්<br>• ආගමික ස්ථාන සඳහා | 6000.00<br>8000.00<br>5000.00<br><br>7500.00<br>9500.00<br>5500.00 | 6600.00<br>8800.00<br>5500.00<br><br>8250.00<br>10450.00<br>6050.00 |
| ජල බවුසරය | 1200.00 | 1320.00 |
| ගලි බවුසරය හා ජල බවුසරය ප්‍රවාහනය සඳහා යොදා ගන්නා ට්‍රැක්ටර රථය සඳහා | 320.00 ( වැඩිවන සෑම කි.මී.01 රු.85.00 | 370.00 ( පළමු කි.මී.01)<br>හා වැඩිවන සෑම කි.මී.01 කට රු. 105.00 බැගින් අයකිරිම |

**<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

අපිට අර පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ආව චක්‍රලේඛයට අනුව යන්ත්‍ර සූත්‍රවල මිල ගණන් වැඩිවීම අපි මුදල් කමිටුවෙ සාකච්ඡා කළා.ඒ වැඩේ කරන්නත් ඕන.මිනිස්සුන්ට බරක් වෙන්නත් බැරි වෙන විදිහට තමයි සභාවලින් මෙ මිල ගණන් ගත්තෙ.ඉන්ධන මිල වෙනස් වෙච්ච ගමන් ආයෙ මිලගනන් වෙනස් වෙන්න ඕන.

**ඒ අනුව 2026.05.27 දින පැවැති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ තීරණ අංක 07 යටතේ,පහත වාහන වල අයකරන මිලගණන් , වර්තමානයේ වැඩිවන ඉන්ධන මිලගණන් වැඩිවීම සමඟ නොගැලපෙන බැවින් ඉහත පරිදි ගාස්තු අයකිරිම සුදුසු බවට යෝජනාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී**

**ඉ) <u>XVI . ගරු ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XVI දරණ යෝජනාව</u>**

**<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමනි, ඒ වගේම ගෞරවනීය මන්ත්‍රිතුමනි,තුමියනි ලේකම්තුමිය කාර්ය මණ්ඩලය සියළු දෙනාගෙන් අවසරයි.පඩුවස්නුවර පුජාභූමි රථගාලේ අපේ සුභසාධක සමිතියක් තියෙනවා.එළඹෙන පොසොන් පොහොය නිමිති කරගෙන තොරණක් ඉදිකරන්න යෝජනාවක් ඉදිරිපත් කරලා තියනවා සභාපතිතුමා.ඒක මං යෝජනාවක් විදිහට ඉදිරිපත් කරනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සි.පි.රංජිත් අබේපාල මහතා ප.ව.12.59 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා

**<u>ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මහතා - (ශ්‍රී.ල.පො.පෙ)</u>**

ගරු මන්ත්‍රිතුමා විසින් ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා

**<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමනි අපි ප්‍රාදේශීය සභාවට වැඩියම ආදායම මේ වෙනකොට ආවේ පූජා භූමියෙන්. වෙසක් පෝය නිමිති කරගෙනත් විශාල මුදලක් වෙළඳ ව්‍යාපාරිකයො ලබලා දෙනවා.ගරු සභාපතිතුමනි පූජා භූමි රථගාලේ සුබසාධක සමිතිය හදිසියෙම ලැස්ති වෙලා තොරණක් ගෙනල්ලා තියනවා.ඒකෙ සමිතියෙ අඩුපාඩුවක් තියනවා. ඔබතුමා දැනුවත් කරලා නෑ. නමුත් ඒ අය දැන් මුදල් ගෙවලා තොරණ ගෙනල්ලා තියනවා.ගෙනල්ලා තොරණ ඉදිකරන්න කියලා සභාවෙ ඔබතුමාගෙන් අවසර ඉල්ලලා තියනවා. මං හිතන්නෙ ඔබතුමා සහ අපි මන්ත්‍රිවරු සියළුදෙනාගෙම බලාපොරොත්තුව තමයි සභාවෙ ආදායම වැඩි කරගන්න.ආදායම් වැඩි කරගන්නනම්අපි මේ ක්‍රමවේදවලට යන්න ඕන.මේකෙ ඇත්තටම අපිට පොසොන් වලට පූජා භූමි රථගාලේ ඉදිකරන තොරණ සහ රථගාල නිසා අපට පොසොන් වලට පූජා භූමි රථගාලේ ඉදිකරන තොරණ සහ රථගාල නිසා අපිට විශාල මුදල් ප්‍රමාණයක් සභාවට එනවා. ඉතින් ඒ සභාවට එන මුදල අපි අහිමි කරගන්නෙ නැතිව මම කියන්නෙ සභාපතිතුමා අපිට ලොකු මුදලක් එන නිසා ඒ සුබසාධක සමිතියෙ නිලධාරි මණ්ඩලය ඔබතුමා හම්බ වෙන්න ඇවිත් තියනවා.නමුත් ඒකෙදි යම් අකමැත්තක් ප්‍රකාශ වෙලා තියනවා.මං ඔබතුමාගෙට ඉල්ලීමක් කලා අද උදේ තමයි මටත් කිව්වෙ.ඒ පිලිබඳව සභාපතිතුමා දැනුවත් කරලා අවසර අරන් දෙන්න කියලා.සභාපතිතුමා අපි ඒ භූමිය තුල යම් යම් කොන්දේසි දාලා හරි එය ලබා දීම සුදුසුයි සභාවට ඉදිරියේදී ලැබෙන්න තියෙන ලොකු මුදලක් ලබා ගැනීම සඳහා තමා මේ යෝජනාව සභාවට ඉදිරිපත් කලේ.ඒ නිසා මං ඉල්ලීමක් කරනවා ඔබතුමාගෙන් මේ පිලිබඳව සියළු මන්ත්‍රිතුමන්ලා අපි කවුරුත් මෙතන ඉන්න පක්ෂ විපක්ෂ මන්ත්‍රිතුමන්ලා සභාපතිතුමා ඇතුළු කිසිම කෙනෙක් සභාවට එන ආදායමක් නැති කරගන්න කැමති නැනෙ. එනිසා මේ තොරණ ඉදි කරොත් අපිට වෙළඳසැල් වලින් බදු එනවා.ඊට පස්සෙ විනෝද මේලා වලින් එන විනෝද බදු එනවා.ඉතින් විශාල මුදලක් පොසොනේ පොහොය නිමිති කරගෙන එනවා.මං හිතන්නෙ අපි බෞද්ධයො හැටියට තොරන් ඉදිකරනවා.ඒ නිසා එම තොරණ ඉදි කාරීම සුදුසුයි කියලා ඔබතුමාගෙන් ඉල්ලිමක් කරනවා.මං හිතන්නෙ මෙතන ඉන්න සියළුම මන්ත්‍රින් කිසිම කෙනෙක් විරුද්ධ වෙන එකක් නෑ.මේ කටයුත්ත සඳහා ඒකමතිකව අවසර ලබා දෙන්න ඔබතුමා කටයුතු කරන්න කියලා මම ඉල්ලිමක් කරනවා. බොහොම ස්තූතියි

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා (ස.ජ.බ.)</u>**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සි.පි.රංජිත් අබේපාල මහතා ප.ව.12.59 ට පමණ පමණ ගරු සභාවට පැමිණියා.

ගරු සභාපතිතුමාගෙන් අවසරයි.මමත් ඒ කොට්ඨාශෙ මන්ත්‍රිවරයා විදිහට මමත් ඔය කාරණේ පිලිබඳ දැනුවත් වුනා.එහිදි වැරුද්දක් වෙලා තියනවා තමා සභාපතිතුමනි.තොරණ ගේනකොට ඔබතුමා දැනුවත් කරලා නෑ.තවම තොරණ ගහලා නෑ.තොරණ ගහන්නෙ පොසොන් එකට.ඉතින් මේ කාල සීමාව තුල ඔබතුමා දැනුවත් කරලා මේ සඳහා විශේෂ අවසරයක් ලබා ගැනීම සඳහා හිතුවෙ.එහිදි රංජි මන්ත්‍රිතුමා කියපු විදිහට ඒ සඳහා විශාල වෙළඳසැල් ප්‍රමාණයක් ඉදි වෙනවා.තොරණ ඉදි කරන්නත් අපේ සභාවට ආදායමක් ගේන්න මුල් වෙලා ඉන්න සමිතිය මුල් කරගෙන තමයි.තොරණ ඉදි කරන්න සූදානම් වෙන්නෙත් පාක් එකේ ආදායම් තර කර ගැනීම සඳහා.ඉතින් මං හිතන්නෙ මේකෙදි පුංචි පුංචි අත් වැරදිම් වෙනවා.අපිට ආදායම් ලබාදෙන ආයතනයක්.පාර්ක් එකක් විදිහට. ඔබ තුමා ඉදිරියේදි සම්බන්ධ වෙලා තොරණ ඉදිකරන්න අවසර ලබා දෙන්න උත්සාහ කරයි .මගේ කොට්ඨාශෙ අය තමයි මේ කාර්යයට යෙදිලා තියෙන්නෙ .මට ඉදිරිපත් කරා මේ සම්බන්ධව කථා කරන්න කියලා.ඒකයි මම සම්බන්ධ වුනේ.මේ පිලිබඳ අවධානය යොමු කරලා අපිට සභාවට තියන ආදායමක් ලබාගන්න. අවධානය යොමු කරන්න කියලා නැවත නැවත කියනවා.ඒ සඳහා අවස්ථාව ලබා දෙන්න සභාපතිතුමනි..

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

ඇත්තම කාරනාව වෙසක් පොසොන්, ඇසල ප්‍රධාන උත්සව තුන ඉතින් මේ බෞද්ධ සහෘද හදවත් බුද්ධාලම්බන ප්‍රිතියෙන් ඔද වැටෙන කාලෙ.දැන් තියෙන්නෙ තොරන් වලියක්.ඒ නිසා අපි දන්න තරමට වෙනදා පඬුවස්නුවර රජමහා විහාරයේ තොරනක් ඉදි කරනවා.ඒ තොරණ කන්ඩායමක් විසින් ඇවිත් ඉල්ලලා තියනවා හාමුදුරුවන්ගෙන් මේ තොරණ දෙන්න කියලා අපිට.හාමුදුරුවො දැන් කලින් කරගෙන ගිය විදිහට කරගෙන යන්න විදිහකුත් නෑ.දැන් අරගොල්ලන්ගෙ ඉල්ලීම පැත්තක දාන්නත් බෑ.රජමහා විහාරයේ හාමුදුරුවො අතරමංවෙලා ඉන්නෙ.ඒ අස්සෙ අපේ සුභ සාධක සංගමයෙන් කිව්වා අපි තොරණ ගහන්නම් සුභසාධක සංගමයෙන් කියලා ඒකටත් එපා කිව්වා.ඒ අස්සෙ මේ පූජා භූමියෙ ඉන්න කණ්ඩායමක් විසින් තොරණක් ගෙනල්ලා දැන් ගහන්න ලැස්ති කරලා බබා හම්බවෙලා දැන් උප්පැන්න සහතිකේ ඉල්ලනවා ඔක්කොම කරලා.දැන් මං අහනවා හිටපු සභාපතිතුමාත් ඉන්නවා මෙතන. ඔක්කොම සූදානම් කරගෙන වැඩේ ගස් ගියාට පස්සෙ ඇවිල්ලා ඉල්ලනවා අවසරේ.මේක කරන්න පුළුවන්ද කියලා. අපි සද්ද නැතිව හිටියනම් මේ තොරණ ගහලා ඔක්කොමත් කරලා සල්ලි ටිකත් අරගෙන ගිහිල්ලා මට තේරෙන්නෙ නෑ.අපේ රංජිත් මන්ත්‍රිතුමා කියන කාරණාව.තේරෙන්නෙ නැති කාරනාවක් තියනවා.දැන් පඬුවස්නුවර පූජා නගරයේ කඩ ඉදි කරාට පස්සෙ අපි කොහොමටත් ආදායම් ගන්නවා.ඔතන තොරණ ගැහුවත් ඒ කඩ ඉදි කරාට පස්සෙ අපේ ආදායම වෙනස් වෙන්නෙ නෑ.ඒ ආදායම අපි ගන්නවා.මෙතන තියන ප්‍රශ්නෙ තමයි පූජා භූමිය ඇතුලෙ එකක් තමයි පාක් එක දීලා තියෙන්නෙ.එතකොට වාහන ටික නතර කරන්න ඕන. පෝය දවසෙ වාහන ටික නතර කරන්න බැරි

වුනොත් ඔය ටෙන්ඩර් ගත්ත මනුස්සයා විශාල ආදායමක් ගන්න දවසක් ඒ දවස ඒක අහිමි වෙනවා.දෙවන කාරනාව තමයි මේ තොරණ ඉදි කරාට පස්සෙ ඒ තොරණ හින්දා වැහෙන කඩ ප්‍රමාණයකුත් තියනවා.ඒ ගොල්ලන්ගෙනුත් බාධාවක් මේකට එනවා.ඊළඟට මේ තොරණ මේක ඇතුලෙ ඉදි කරාට පස්සෙ ඒ කඩ ටිකට ආදායම් ආවා කියලා ඒ කඩ වලින් අපිට වෙනම බදු ගන්න ක්‍රමයක් නෑ.මොකද මේවා නිශ්චිතව ඉදි කරලා තියන කඩ තාවකාලිකව ඉදිකරන කඩ වලින් ඒ දෛනික බදු ටික වෙසක් එකටත් ගත්තා.ලබන පෝයටත් අපිට ගන්න පුළුවන්කම තියනවා.ඒ නිසා මේක දැන් තොරන් ගැටුමක් බවට පත්වෙලා තියෙන්නෙ.මං හිතන්නෙ මේ සභාවෙ අපි යෝජනා කරමු අපේ පඩුවස්නුවර නායක හාමුදුරුවො කියන්නෙ මොකක්ද උන්නාන්සෙ තොරණ ඉදිකරගන්න ඉල්ලන්නෙ හොහෙද අපි ඒකට අවස්ථාව දෙමු.එහෙම නැතිව මේ අනුන්ගෙ රන්ඩුවකට මැදිහත්වෙලා අපි නිකම් අත පුච්චගන්නවා කියන එකයි මගෙ අදහස

**ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)**

ගරු සභාපතිතුමා මම කිව්වෙ එක දෙයක.පඩුවස්නුවර රජමහා විහාරෙටයි මේ තොරණටයි සම්බන්ධයක් නෑ.අපේ සුබ සාධක සමිතියෙ ක්‍රමවේදෙ ගැටළුවක් තියනවා.මේ අයගෙ නොදැනුවත්කම වෙසක් පෝය දවසෙ තොරණ ඉදි කරපු තැනින් තොරණ ගෙනල්ලා තියනවා.මොකද තොරණ තිබිලා තියෙන්නෙ මීරිගම එතනින් මාතරට ගෙනිහින් ආයෙත් ප්‍රවාහන ගාස්තු ගෙවන්න වුනොත් කියන එක නිසා ඒ ගොල්ලො තොරණ ගෙනල්ලා තියනවා.නමුත් ක්‍රමවේදය ඉදි කිරිමක් , සංගීත සංදර්ශනයක් ,තොරණක් හෝ වෙනත් යම් කටයුත්තක් කරද්දි අනිවාර්යයෙන් පොලීසියෙන් සහ සභාවේ අනුමැතිය ලබාගත යුතුයි.එතකොට ඒ ක්‍රමවේදයට යන්න තව තොරණ ගහලා නැනෙ.තොරණ ගහන්නෙ ලිඛිතව සියළු කටයුතු කරලනෙ .පඩුවස්නුවර රාජධානියෙ ස්වාමීන්වහන්සෙගෙ එහෙම ප්‍රශ්නයක් නෑ.රජමහා විහාරයේ ඉන්න සියළු දායකයනුත් රටගාලේ වෙළඳ ව්‍යාපාර සංගමයේ ඉන්නෙ.එතකොට මම දකින ගැටළුවක් නෑ.තොරණක් ගහනකොට මේ තොරනක් ඉදි කරන විනොද ක්‍රිඩා, කානිවල් ඔය හැමදේටම බදු මුදලක් අය කරනවා.අපිට කව්රු තොරන ගැහුවත් ගැටළුවක් නැනෙ.අපිට සභාවට ගන්න තියෙන ආදායමනෙ ගන්න තියෙන්නෙ.ඔබතුමාගෙ පුද්ගලික ප්‍රශ්නයක් තියෙන්නෙ.අපි දැන් ටෙන්ඩර් දාලා ගත්ත කෙනා ඉන්නවනෙ.ඒ ගත්ත කෙනාගෙ කැමැත්ත තියනවා මේකට.එතකොට මේක ඉදි කරන්නෙ වෙළඳ ව්‍යාපාර සංගමයේ නිලධාරී සභාපති ලේකම් ඒ අය ඉන්නවා

**ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)**

වෙසක්, පොසොන්, ඇසල කාලෙට පඩුවස්නුවර ලොකු පිරිසක් ඉන්නවා විවිධ ආදායම් බලාගෙන.ඉතින් විවිධ ආදායම් බලාගෙන ඉන්න අය මැද්දට අපි රංඩුවක් විදිහට යන්න ඕනෙ නැනෙ.අපිට එහෙම වුවමනාවක් නෑ.තොරන් ගහන්න හරි කානිවල් කරන්න හරි. ඒ නිසා ඔබතුමා ඔය යෝජනාව ගෙනල්ලා පාර්ක් එක ඇතුලෙ තොරණ ගහනවා කියලා සම්මත වුනාම ඒක ආයෙ වෙනස් කරන්න බැනෙ.ඒක කරන්න වෙනවා.හැබැයි ඒකෙ තියෙන අතුරුඵල.මොකද පාර්ක් එක සභාවෙ අපිට තීරණයක් ගන්න පුළුවන් ඒක හරි. හැබැයි සමස්ථයේ අනිකුත් සිදුවන කාරනාවලට වගකියන්නෙ කවුද.මෙතන ගැටුමක් තියෙන්නෙ.පුද්ගලයො පුද්ගලයො අතර පුදුම ගැටුමක් තියෙන්නෙ.ඒ නිසා මේ තොරණ සම්බන්ධයෙන් මරාගන්න තත්වයකට පත්වෙලා තියෙන්නෙ.ඒ නිසා මං කිව්වෙ තොරණ ඉදි කරන කොහෙද පාර්ක් එකේ වෙන්න පුළුවන් පන්සලේ වෙන්න පුළුවන් ඒ කොහෙද ඉදි කරන්නෙ කියන එක හාමුදුරුවොත් එක්ක සාකච්ඡා කරලා පාර්ක් එකේ ඉදිකරන්න අවස්ථාව දෙනවනම් මං ඒ අයටත් කිව්වා ඔයාලා වැඩ කරලා තියෙන්නෙ කලින් කරන්න එන දේවල් පස්සෙ.මේක සභාවනෙ.ඔබතුමාලා මන්ත්‍රීතුමාලානෙ .ඒ නිසා මේ අභිමානේ තියාගන්න උත්සාහ කරන්න.මේ මිනිස්සුන්ට ඕන ඕන විදිහට වැඩ කරන්න අපි බැදිලා නෑ.එනිසා ක්‍රමවේදයක් තියනවා. ඒ ක්‍රමවේදයට අනුව කටයුතු කරන්න ඕන.වැඩේ ඇනුනට පස්සෙ ඇවිල්ලා කටයුතු කරන්න ගත්තහම වැඩේ ඇනෙනවා.ඒ නිසා සභාවෙ පාර්ක් එකේ තොරණ ඉදිකරනවද, පන්සලේ තොරණ ඉදිකරනවද මොකක්ද කියන එක අපිට හාමුදුරුවො සහ ඒ සංසරත්නයෙන් තීරණයක්ඕන. නැත්තම් ඒ ගැටුමට අපි මැදිහත් වුනා වගේ වෙනවා.

**ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)**

ගරුසභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි. මං හිතනවා මෙතන ලොකු ගැටුමක් ඇතිවෙයි කියලා විශ්වාසයක් තියෙනවා.මං හිතනවා සභාපතිතුමනි නායක හාමුදුරුවො එක්ක සාකච්ඡා කළොත් මට හිතෙනවා මේ ගැටළුව නිරාකරණය කරගන්න පුළුවන් කියලා . නැත්තම් ලොකු ආරවුලක් ඇතිවෙයි.පාර්ක් එකේ කඩ හිමියො ගහයි.නමුත් ඊට වඩා හෙදෙයි පන්සලේ නායක හාමුදුරුවොත් දෙපාර්ශ්වයම එකතු කරලා අපි එකඟතාවයකට ආවොත් හොඳයි කියලයි මගෙ අදහස.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

හොඳම දේ තමයි හාමුදුරවොත් ඒ පාර්ශ්වයත් එක්ක සාකච්ඡාවක් ගමු.එහෙම ආවට පස්සෙ අපේ විරුද්ධතාවයක් නෑ.

ඒ අනුව ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති පඩුවස්නුවර රජගාලේ තොරණක් ඉදි කිරීම සම්බන්ධ යෝජනාව පඩුවස්නුවර රජමහා විහාරයේ නායක ස්වාමීන් වහන්ස ඇතුළු සංඝරත්නයත් දෙපාර්ශ්වයම එකතු වී එකඟතාවයකට පැමිනෙන ස්ථානයේ තොරණ ඉදි කිරීමසුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.

## (ඊ). කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවෙලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරීම.

**(ඊ).I. 2026.04.27 දින පැවති ප්‍රසම්පාදන කමිටුවේ වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)**

ගරු සභාපතිතුමා මේ කමිටු වාර්තා සියල්ල එකම කෙනාද හදන්නෙ.මේ නිවාස හා ප්‍රජා සංවර්ධන වාර්තාව යම් පිලිවෙලක් තියනවා. ප්‍රසම්පාදන කමිටු වාර්තාවේ මිල ගණන් නෑ.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

මිල කැදවීමට දාලා තියෙන්නෙ

**ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)**

එහෙනම් මිලක් තියෙන්න ඕන. මිල නැතිව අපිට තීන්දුවක් ගන්න බෑ.ප්‍රසම්පාදන වාර්තාව මිල ගණන් සදහන් කිරීමෙන් පසුව නැවත සභාවට සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන්න

**(ඊ).II. 2026.05.08 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**(ඊ).111. 2026.05.25 වන දින පැවති කාර්මික සේවා කමිටුවේ වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**(ඊ).IV.2026 මැයි මස අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

## (උ) ලැබීම් හා වියදම් පිලිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම පිලිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශිය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම

**(උ) I. 2026 අප්‍රේල් මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 01 සඳහා අනිත් පිට බලන්න**

## පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව

ප්‍රා.ස-14

### මාසික ඒකාබද්ධ වැය සාරාංශය - 2026 අප්‍රේල්

| අය විෂය අංකය | වැය විෂය නාමයන් | 1 පොදු පරිපාලනය | 2 සෞඛ්‍ය සේවා | 3 භෞතික සැලසුම් මංමාවත් ඉඩම් | 4 ජල සේවා | 5 වෙනත් උපයෝගී සේවා | 6 සුභසාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | වැටුප් හා දීමනා | 3051083.34 | 1477803.01 | 1836505.00 | 80482.27 | 157530.34 | 4783016.84 | 11386420.80 |
| 2 | ගමන් වියදම් | 25300.00 | 0.00 | 0.00 | 0.00 | 10250.00 | 0.00 | 35550.00 |
| 3 | සැපයුම් හා උපකරණ | 190333.00 | 630994.00 | 170759.00 | 1990.00 | 64225.00 | 48470.00 | 1106771.00 |
| 4 | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු | 45918.54 | 12050.00 | 645256.00 | 0.00 | 301500.00 | 23500.00 | 1028224.54 |
| 5 | ප්‍රවාහන, සම්බන්ධතා ආවශ්‍යක හා වෙනත් සේවා | 233208.89 | 85827.96 | 16089.29 | 14010.69 | 25308.21 | 13486.52 | 387931.56 |
| 6 | පොළී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 99790.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 222700.00 | 322490.00 |
| 8 | විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 0.00 | 30812.33 | 0.00 | 0.00 | 0.00 | 3870.96 | 34683.29 |
| | **පුනරාවර්ථන වැය එකතුව** | **3645633.77** | **2237487.30** | **2668609.29** | **96482.96** | **558813.55** | **5095044.32** | **14302071.19** |
| | ප්‍රාග්ධන වියදම් | | | | | | | |
| 9 | ප්‍රාග්ධන වැය | 0.00 | 0.00 | 0.00 | 9000.00 | 0.00 | 0.00 | 9000.00 |
| 10 | ණය ආපසු ගෙවීම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| | **ප්‍රාග්ධන වැය එකතුව** | **0.00** | **0.00** | **0.00** | **9000.00** | **0.00** | **0.00** | **9000.00** |
| | **පුනරාවර්ථන වැය හා ප්‍රාග්ධක වැය එකතු** | **3645633.77** | **2237487.30** | **2668609.29** | **105482.96** | **558813.55** | **5095044.32** | **14311071.19** |
| | තැන්පත් | 317165.00 | | | | | | 317165.00 |
| | වැට් | 0.00 | | | | | | 0.00 |
| | ජාතිය ගොඩනැගීමෙ බද්ද | 0.00 | | | | | | 0.00 |
| | මුද්දර බද්ද | 0.00 | | | | | | 0.00 |
| | සේවක ණය | 2333977.40 | | | | | | 2333977.40 |
| | අත්තිකාරම් | 116713.16 | | | | | | 116713.16 |
| | ණයහිමි | 5343988.71 | | | | | | 5343988.71 |
| | සමුච්චිත අරමුදල | 0.00 | | | | | | 0.00 |
| | ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| | අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| | මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| | වෙනත් | 0.00 | | | | | | 0.00 |
| | **මුළු එකතුව** | **8111844.27** | | | | | | **22422915.46** |

**2026 අප්‍රේල් ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 02 සඳහා අනිත් පිට බලන්න**

| පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව | | | | | | | ප්‍රා.ස-16 |
|---|---|---|---|---|---|---|---|
| මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය - 2026 අප්‍රේල් | | | | | | | |
| අය විෂය නාමයන් | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැළසුම් මංමාවත්/ඉඩම් හා ගොඩනැගිලි | ජල සේවා | වෙනත් උපයෝගී සේවා | සුභ සාධක සේවා | එකතුව |
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 10 වරිපනම් හා බදු | 16699.82 | 116400.00 | 30000.00 | 0.00 | 0.00 | 0.00 | 163099.82 |
| 20 කුලී | 0.00 | 0.00 | 1151190.00 | 0.00 | 2486380.00 | 70300.00 | 3707870.00 |
| 30 බලපත්‍ර ගාස්තු | 0.00 | 183500.00 | 0.00 | 0.00 | 0.00 | 240.00 | 183740.00 |
| 40 සේවා සඳහා ගාස්තු | 0.00 | 283000.00 | 182085.12 | 0.00 | 0.00 | 1655.00 | 466740.12 |
| 50 වරෙන්තු ගාස්තු හා දඩ | 0.00 | 0.00 | 21240.00 | 0.00 | 2540.00 | 621.00 | 24401.00 |
| 60 වෙනත් ආදායම් | 72637.35 | 75090.00 | 0.00 | 51358.00 | 0.00 | 410.00 | 199495.35 |
| 70වෙනත් ආධාර | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 8635249.53 | 8635249.53 |
| **පුනරාවර්තන ආදායම් එකතුව** | **89337.17** | **657990.00** | **1384515.12** | **51358.00** | **2488920.00** | **8708475.53** | **13380595.82** |
| **ප්‍රාග්ධන ආධාර** | | | | | | | |
| 80 මූලධන ලැබීම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| **පුනරාවර්තන ආදායම් හා ප්‍රාග්ධන ආදායම්වල එකතුව** | **89337.17** | **657990.00** | **1384515.12** | **51358.00** | **2488920.00** | **8708475.53** | **13380595.82** |
| තැන්පත් | 776369.16 | | | | | | 776369.16 |
| වැට් | 0.00 | | | | | | 0.00 |
| ජා.ගො.බද්ද | 0.00 | | | | | | 0.00 |
| මුද්දර බදු | 26770.00 | | | | | | 26770.00 |
| සේවක ණය | 452167.00 | | | | | | 452167.00 |
| අත්තිකාරම් | 21820.00 | | | | | | 21820.00 |
| ණය ගැති | 0.00 | | | | | | 0.00 |
| සමු: අරමුදල | 0.00 | | | | | | 0.00 |
| ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| ශීර්ෂ බැර | 8000.00 | | | | | | 8000.00 |
| සේවක ඇප තැම්පත් | 6050.57 | | | | | | 6050.57 |
| **මුළු එකතුව** | **1285126.16** | | | | | | **14671772.55** |

**(උ) I11. 2026 අප්‍රේල් මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

උපලේඛන 03 සඳහා අනිත් පිට බලන්න

| පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව | | | | | ප්‍රා.ස. 07 වාර්තාව - 2026 වර්ෂය | | | | මාසය:-අ ප්‍රේල් | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | අය විෂය | මාසය මුලදී හිඟය<br>1 | මාසය මුලදී ඉදිරියට ලැබීම්<br>2 | මාසය තුළ බිල් කිරීම්<br>3 | ලැබිය යුතු මුළු ආදායම<br>4 | මාසය තුළ ලද ආදායම<br>5 | මාසයට අදාල කලින් ලැබූ ආදායම<br>6 | ඉදිරියට ගෙන යන කලින් ලැබූ ආදායම<br>7 | මාසය තුළ ලද ආදායමින් ඉදිරියට ලැබූ ආදායම<br>8 | මාසය තුළ ලද ආදායමින් අය වූ හිඟය<br>9 | ඉදිරියට ගෙන යන හිඟය<br>10 | ඉදිරියට ලැබීම්<br>11 |
| | | | | | (1+3) | | | ( 2-6) | | | 4 - (5+6)+8 | (7+8) |
| 1 | වරිපනම් බදු<br>1/11 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 16,169.82 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 2 | අක්කර බදු<br>1/12 | 5,953.15 | 17,136.25 | 0.00 | 5,953.15 | 530.00 | 0.00 | 17,136.25 | 0.00 | 0.00 | 5,423.15 | 17,136.25 |
| 3 | කඩ කුලී<br>3/22 | 319,750.00 | 34,250.00 | 1,232,700.00 | 1,552,450.00 | 1,144,590.00 | 24,250.00 | 10,000.00 | 16,750.00 | 0.00 | 400,360.00 | 26,750.00 |
| 4 | වත්කම් බදු<br>5/23 | 1,538,612.00 | 20,472.50 | 1,545,124.50 | 3,083,736.50 | 1,496,980.00 | 8,047.50 | 12,425.00 | 14,050.00 | 0.00 | 1,592,759.00 | 26,475.00 |
| 5 | ජල ගාස්තු<br>4/62 | 57,089.00 | 14,097.00 | 57,309.00 | 114,398.00 | 31,833.00 | 4,404.00 | 9,693.00 | 1,643.00 | 0.00 | 79,804.00 | 11,336.00 |
| 6 | ව්‍යාපාර බදු<br>2/16/2 | 0.00 | 0.00 | 113,400.00 | 113,400.00 | 113,400.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | කර්මාන්ත බදු<br>2/16/1 | 0.00 | 0.00 | 3,000.00 | 3,000.00 | 3,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 8 | ඇතම් ව්‍යාපාර බදු<br>2/16/3 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 9 | වෙළඳ බලපත්‍ර<br>2/31 | 0.00 | 0.00 | 131,000.00 | 131,000.00 | 131,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 10 | විශේෂ බලපත්‍ර<br>ගාස්තු2/31 -II | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| | එකතුව | **1,921,404.15** | **85,955.75** | **3,082,533.50** | **5,003,937.65** | **2,937,502.82** | **36,701.50** | **49,254.25** | **32,443.00** | **0.00** | **2,078,346.15** | **81,697.25** |

**(උ) IV. 2026 ජූනි මාසික ආදායම් පුරෝකථන වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 04 සඳහා අනිත් පිට බලන්න**

# මාසික අදායම් පුරෝකථන වාර්තාව - පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව

මාසය :- 2026 ජුනි

| අනු අකය | ආදායම් ශීර්ෂය | වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව 2026 | | | මාසික ආදායම් පුරෝකථනය | | | අය වී ඇති ආදායම 2026 අප්‍රේල් | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අය - වැය ලේඛනය අනුව | පරිපූරක මඟින් | එකතුව | පෙර මාසය දක්වා | මාසය තුළ | එකතුව | පෙර මාසය දක්වා | මාසය තුළ | එකතුව |
| | | 1 | 2 | 3 (1+2) | 4 | 5 | 6 (4+5) | 7 | 8 | 9 (7+8) |
| 1 | වරිපණම් ( 1/11) | 4,700,000.00 | 0.00 | 4,700,000.00 | 3,862,500.00 | 160,000.00 | 4,022,500.00 | 2,600,613.50 | 16,169.82 | 2,616,783.32 |
| 2 | අක්කර බදු ( 1/12 ) | 30,000.00 | 0.00 | 30,000.00 | 6,000.00 | 2,000.00 | 8,000.00 | 2,670.00 | 530.00 | 3,200.00 |
| 3 | කසල බදු(2/13) | 30,000.00 | 0.00 | 30,000.00 | 10,000.00 | 2,500.00 | 12,500.00 | 0.00 | 0.00 | 0.00 |
| 4 | කර්මාන්ත බදු(2/16/ii) | 60,000.00 | 0.00 | 60,000.00 | 25,000.00 | 5,000.00 | 30,000.00 | 35,000.00 | 3,000.00 | 38,000.00 |
| 5 | ඇතැම් ව්‍යාපාර බදු(2/16/x | 3,000.00 | 0.00 | 3,000.00 | 3,000.00 | 0.00 | 3,000.00 | 9,000.00 | 0.00 | 9,000.00 |
| 6 | ව්‍යාපාර බදු ( 2/16/i ) | 1,500,000.00 | 0.00 | 1,500,000.00 | 1,170,000.00 | 75,000.00 | 1,245,000.00 | 1,201,200.00 | 113,400.00 | 1,314,600.00 |
| 7 | බලපත්‍ර ගාස්තු ( 2/31/i) | 1,400,000.00 | 0.00 | 1,400,000.00 | 1,100,000.00 | 100,000.00 | 1,200,000.00 | 496,584.30 | 131,000.00 | 627,584.30 |
| 8 | විශේෂ බල:ගාස්තු(2/31/x) | 320,000.00 | 0.00 | 320,000.00 | 160,000.00 | 160,000.00 | 320,000.00 | 0.00 | 0.00 | 0.00 |
| 9 | කඩ කුලී ( 3/22 ) | 12,192,000.00 | 0.00 | 12,192,000.00 | 5,080,000.00 | 1,016,000.00 | 6,096,000.00 | 3,210,850.00 | 1,144,590.00 | 4,355,440.00 |
| 10 | ජංගම අලෙවි කුටි( 3/22-i | 303,600.00 | 0.00 | 303,600.00 | 126,500.00 | 25,300.00 | 151,800.00 | 125,400.00 | 6,600.00 | 132,000.00 |
| 11 | පූජාභූමි වෙළඳ කුටි(3/22- | 720,000.00 | 0.00 | 720,000.00 | 300,000.00 | 60,000.00 | 360,000.00 | 0.00 | 0.00 | 0.00 |
| 12 | ත්‍රී රෝද රථ නැවතුම් ගාස්තුව (03/43Xv) | 150,000.00 | 0.00 | 150,000.00 | 62,500.00 | 12,500.00 | 75,000.00 | 15,600.00 | 39,600.00 | 55,200.00 |
| 13 | ජල ගාස්තු(4/62/i,i) | 680,000.00 | 0.00 | 680,000.00 | 264,585.00 | 52,917.00 | 317,502.00 | 101,482.00 | 31,833.00 | 133,315.00 |
| 14 | සතිපොල බදු (5/22/i/iii/i | 11,400,000.00 | 0.00 | 11,400,000.00 | 4,750,000.00 | 950,000.00 | 5,700,000.00 | 2,998,760.00 | 855,820.00 | 3,854,580.00 |
| 15 | බදු කුලී ( 5/23 ) | 20,000,000.00 | 0.00 | 20,000,000.00 | 8,252,000.00 | 1,958,000.00 | 10,210,000.00 | 3,268,702.00 | 1,496,980.00 | 4,765,682.00 |
| 16 | සතිපොල බහු.කාර්.ගොඩ 5/25/1/ii | 50,000.00 | 0.00 | 50,000.00 | 20,000.00 | 10,000.00 | 30,000.00 | 0.00 | 0.00 | 0.00 |
| 17 | විනෝද බදු ( 6/15 ) | 750,000.00 | 0.00 | 750,000.00 | 312,500.00 | 62,500.00 | 375,000.00 | 106,000.00 | 0.00 | 106,000.00 |
| 18 | ප්‍රජා ශාලා/ක්‍රීඩා පි(6/25/ii/ | 100,000.00 | 0.00 | 100,000.00 | 50,000.00 | 25,000.00 | 75,000.00 | 105,500.00 | 25,000.00 | 130,500.00 |
| | එකතුව | **54,388,600.00** | **0.00** | **54,388,600.00** | **25,554,585.00** | **4,676,717.00** | **30,231,302.00** | **14,277,361.80** | **3,864,522.82** | **18,141,884.62** |

**(උ) V.  2026 අප්‍රේල් මාසික වියදම් පුරෝකථන වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 04 සඳහා අනිත් පිට බලන්න**

## මාසික වියදම් පුරෝකථන වාර්තාව - 2026 මැයි

| අනු අංකය | වැය ශීර්ෂය | වාර්ෂික වියදම් ඇස්තමේන්තුව | | | වියදම් පුරෝකථනය | | | වැය කල මුදල | | | අතිරික්තය/ ඌනතාවය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අයවැය ලේඛනය | වැය ශීර්ෂ මාරු කිරීම / පරිපූරක | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | |
| 1 | වැටුප් දීමනා | 155,557,000.00 | | 155,557,000.00 | 51,807,000.00 | 12,950,000.00 | 64,757,000.00 | 44,420,508.56 | 11,450,258.76 | 55,870,767.32 | 8,886,232.68 |
| 2 | ගමන් වියදම් | 935,000.00 | | 935,000.00 | 225,000.00 | 50,000.00 | 275,000.00 | 223,775.00 | 76,648.00 | 300,423.00 | (25,423.00) |
| 3 | සැපයුම් හා උපකරණ | 18,846,500.00 | | 18,846,500.00 | 5,750,000.00 | 1,500,000.00 | 7,250,000.00 | 3,431,228.00 | 1,146,290.80 | 4,577,518.80 | 2,672,481.20 |
| 4 | ප්‍රාග්ධන වත්කම් අළුත් වැඩියාව හා නඩත්තුව | 26,306,000.00 | | 26,306,000.00 | 2,760,000.00 | 1,000,000.00 | 3,760,000.00 | 3,696,899.68 | 1,906,040.43 | 5,602,940.11 | (1,842,940.11) |
| 5 | ප්‍රවාහන සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා | 7,587,000.00 | | 7,587,000.00 | 1,800,000.00 | 700,000.00 | 2,500,000.00 | 842,088.41 | 156,383.83 | 998,472.24 | 1,501,527.76 |
| 6 | පොලී ගෙවීම් , ලාභාංශ සහ ප්‍රසාද මුදල් | - | | - | | - | - | - | - | - | - |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 8,681,000.00 | | 8,681,000.00 | 1,400,000.00 | 500,000.00 | 1,900,000.00 | 379,532.81 | 276,150.00 | 655,682.81 | 1,244,317.19 |
| 8 | විශ්‍රාම වැටුප් ,විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 532,500.00 | | 532,500.00 | 177,500.00 | 44,375.00 | 221,875.00 | 98,591.75 | 34,067.20 | 132,658.95 | 89,216.05 |
| 9 | උපකරණ වැය | 52,025,000.00 | | 52,025,000.00 | 10,700,000.00 | 4,100,000.00 | 14,800,000.00 | 142,729.78 | 550,000.00 | 692,729.78 | 14,107,270.22 |
| 10 | ණය ආපසු ගෙවීම් | - | | - | | | - | - | | - | - |
| | එකතුව | 270,470,000.00 | - | 270,470,000.00 | 74,619,500.00 | 20,844,375.00 | 95,463,875.00 | 53,235,353.99 | 15,595,839.02 | 68,831,193.01 | 26,632,681.99 |

**(ඍ). රැස්වීම කැඳවීමේ දැන්වීමේ වෙනත් කාරණා කිසිවක් දක්වා ඇත්නම්, ඒ කරුණු එහි දක්වා ඇති අනුපිළිවෙලට හෝ විශේෂ හේතු නිසා ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන අනුපිළිවෙලට - නැත.**

න්‍යාය පත්‍රානුකූලව ගරු සභාවේ කටයුතු අවසන් වූ බවත්,සභාවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දායක වූ සැමට ස්තූතිය පිරිනමන බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ප.ව.1.20 ට පමණ ගරු සභාවේ කටයුතු අවසන් කරන ලදී.

2026.06.09 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව ගරු සභාවේ එදින පැමිනි සිටි සභිකයන් විසින් සභා සම්මත කරන ලදි.